# සිසිල

සිනුවර සිංහල සාර සංග්‍රහය

බලන්නට නොව කියවන්නට ය!

Sisila Sinhala eMagazine

තුන්වෙනි වෙළුම - පළමුවෙනි කලාපය – සැප්තැම්බර් 2023 :: **Volume 3 – Issue 1 – September 2023**




## වසන්තයේ රූසිරි

උතුරු අර්ධගෝලයේ රටක් වන ලංකාවට වසන්තය එළැඹෙන්නේ මාර්තු මාසයේ දී නමුදු දකුණු අර්ධගෝලයේ පිහිටි ඕස්ට්‍රේලියාවට වසන්තය එළැඹෙන්නේ හයමසකට පසුව සැප්තැම්බරයේ දී ය.

වසන්තය යනු මල් පිපී පරිසරය වර්ණවත් වන කාලයයි. මේ ඡායාරූපයේ දැක්වෙන්නේ සිඩ්නි නගරයෙන් කිලෝමීටර් පනහක් පමණ බටහිර දෙසින් පිහිටා ඇති පෙන්රිත් නගරය මධ්‍යයේ වවා ඇති මල් පාත්තියක සුන්දර දසුනකි.

විවිධ වර්ණයෙන් යුත් මේ මල් හැඳින්වෙන්නේ පැන්සි (Pancy) නමිනි.

ඡායාරූපය: රසික සූරියආරච්චි


නිව් සවුත් වේල්ස් හි සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ ප්‍රකාශනයකි

Sisila electronic magazine is published and distributed by the Writers Guild of Sinhalese Cultural Forum of NSW, Australia.

sisila.sangarawa@gmail.com sisilamagazine.blogspot.com ISSN: 2653-2182

# සිසිල - සිනුවර සිංහල සාර සංග්‍රහය

තුන්වෙනි වෙළුම - පළමුවෙනි කලාපය - සැප්තැම්බර් 2023 :: Volume 3 - Issue 1 - September 2023

## පෙළ ගැස්ම

කාන්තාවකගේ පලිගැනීම (කෙටිකතා අනුවාදය) - පාලිත ගනේවත්ත

අපි දකුණේ හරිය? : ආත්තම්මා - වසන්ත අමරප්‍රිය

අතීත අත්දැකීම් ස්මරණය - මාලිනී ගනේවත්ත

කැමරා (කෙටිකතාව) ශක්තික සත්කුමාර

තාත්තා කළ උදව්ව (පරිවර්තිත කෙටිකතාව) - හෙල්මලී ගුණතිලක

සෙනෙහස (නවකතාව) - දීපිකා ශ්‍රියානි සුන්ද්‍රා වඩුගේ

පා ගමනින් ආවා (කවි) - නිරන්ජන් සෙල්වදුරේ

චිත්‍ර නම් විශ්ව බස (කවි) - නිමල් සේදර

“බර්මියුඩා” ත්‍රිකෝණයේ අභිරහස - දයාරත්න වීරසේකර

සිසිල ප්‍රහේලිකා විසඳුම් ජූලි 2023 සහ අගෝස්තු 2023

සීමා (කෙටිකතාව) - ඉන්දිකා තිලකුමාර

සිසිල පොත් පුවත්

“සිසිල” ප්‍රහේලිකාව

සෞඛ්‍ය ඇමතිවරයාගේ වස්තුව - පාලිත ගනේවත්ත

එක් මානවකයකු දුටු ප්‍රේම සිහිනයක් (කවි) - චන්ද්‍රවංශ ඥානසේකර

ලංකාවේ උසස් අධ්‍යාපන ප්‍රශ්නයට විසඳුම පුද්ගලික විශ්වවිද්‍යාල නොවේ, මෙන්න මේක ය! - රසික සූරියආරච්චි

අමිල්කාර් කබ්රාල් කවි - පරිවර්තනය විජයසිරි තිලකුමාර

පැබ්ලෝ නෙරූඩා කවි - පරිවර්තනය නිලක්ෂි බණ්ඩාර

අතීතකාමය - ප්‍රිසිලා ගොඩහේවා

ඒ කවිය (කවි) - රූපිකා ද සිල්වා

නර බිල්ල (කෙටිකතාව) - සරත් සමරසේකර

පිළේ පැදුර (ගී රස විඳුම) - කරු කහටපිටිය

හේමමාලා කුමාරිටත් ත්‍රස්තවාදී චෝදනා (කවි) - රංජිත් ද සිල්වා

පාර මැද්දේ කපුටෙක් - නිහාල් රූපසිංහ

හරිම නෝට් හස්බන්ඩෙක්! - විදූෂක

ඩී බී කුරුප්පු අනුස්මරණ කෙටිකතා තරගාවලිය 2024

## සකසුගෙන්

මේ “සිසිල” සිංහල සඟරාවේ විසිපස්වෙනි පියවරයි. එනම්, තුන්වෙනි වෙළුමේ පළමුවෙනි කලාපය යි. මේ කලාපය සමගින් අපි සඟරාවේ තුන්වෙනි වසරට පිවිසෙමු.

“සිසිල” සඟරාව කියවන්න. ඔබේ සහෘදයින් අතර බෙදා හරින්න. සඟරාවේ පිටපත් කෙළින්ම ලබා ගැනීමට අවශ්‍ය අයට sisila.sangarawa@gmail.com ලිපිනයට විද්‍යුත් පණිවිඩයක් එවන්නැයි දැනුම් දෙන්න.

සඟරාව ගැන පොදුවේ ඔබේ අදහස් ද, සඟරාවේ අන්තර්ගතව ඇති ලිපි සහ නිර්මාණ පිළිබඳ ඔබේ සුවිශේෂී අදහස් ද, ඔබේ ලිපි, කෙටිකතා සහ කාව්‍ය නිර්මාණ ද එම ලිපිනයට ම අප වෙත එවිය හැක.

ඒ ඒ ලේඛකයින්ගේ ලිපි සහ නිර්මාණ පිළිබඳව පාඨක ඔබේ අදහස් ඔවුන්ට කෙළින් ම ඊ-මේල් මගින් දැනුම් දීමට ද හැක.

වෙබ් අඩවිය:
[sisilamagazine.blogspot.com]

ෆේස්බුක් පිටුව:
[www.facebook.com/SisilaMagazine]

ෆේස්බුක් කණ්ඩායම:
[www.facebook.com/groups/sisila]

ස්තුතියි.

**- රසික සූරියආරච්චි,**
**සංස්කාරක, සිසිල මාසික සඟරාව**



# පරිවර්තන සාහිත්‍යයෙන්

# කාන්තාවකගේ පලිගැනීම

**ඇන්ටන් චෙකෝෆ් (1884) - අනුවාදය: පාලිත ගනේවත්ත**



සීනුව නාද විය. මේ කතාව සිදුවූ නිවසේ ගෘහණිය, නදේෂ්දා පෙත්රෝව්නා, සෝපාවෙන් පැන දොර ඇරීමට දිව ගියා ය. ඒ සිය සැමියා විය යුතු යැයි ඕ සිතුවා ය.

එහෙත් දොර විවෘත කළ ඇය දුටුවේ තම සැමියා නොවේ. වලස් ලෝමවලින් මැසූ ඉතා වටිනා කබායක් හැඳ, රත්රන් රාමු සහිත උපැස් යුවලක් පැළඳි කඩවසම් උස මිනිසෙක් දොර ළඟ සිටියේ ය. ඔහුගේ නළල රැළි වැටී තිබුණු අතර නිදිබර දෑස ලෝකය දෙස උදාසීන ආකල්පයක් දරන ස්වභාවයක් පෙන්වී ය.

“මොකක්ද උවමනාව?” නදේෂ්දා විමසුවා ය.

“මං වෛද්‍යවරයා, මට එන්ට කිව්වෙ... කෝ බලන්ට වෙලබීතව් ගේ ගෙදරින්, වෙලබීතව් ඉන්නේ මෙහේද?”

“ඔව් ඔව් අපි තමයි වෙලබීතව්ල... ඒත් ඩොක්ට හරි කණගාටුයි, මගේ මහත්තයට විදුරුමහෙන් සැරව ගලල උණ ගැනිලා තිබුණා. එකයි එයා ඩොක්ටට ලියුමක් ඇරියෙ, හැබැයි පරක්කු වෙනකොට එයා හිතුව ඩොක්ට එන එකක් නැහැයි කියල. බලං ඉඳල බැරිම තැන ඩෙන්ටිස්ට් ළඟට ගියා!”

“අ හා, එයාට කෙලින්ම ඩෙන්ටිස්ට් ලඟට යන්ට තිබුණනෙ, මට කරදර කරන්නෙ නැතුව!” වෛද්‍යවරයා දෙබැම උස්සා නළල රැළි ගැන්වී ය.

මොහොතක් නිහඬතාවයෙන් ගෙවී ගියේ ය.

“මට නම් කණගාටුයි ඩොක්ට අපි වෙනුවෙන් මෙච්චර දුර නිකරුනේ ආපු එක ගැන. ඩොක්ට එන විත්තිය මගෙ මහත්තය දැනගෙන හිටිය නම් කවදාවත් එයා ඩෙන්ටිස්ට් ලඟට යන්නෙ නෑ. මං හොඳට ම දන්නව. මට හරිම කණගාටුයි.”

තවත් මොහොතක් නිහඬව ගෙවී ගියේ ය. නදේෂ්දා හිස කැසුවා ය. “මොකද මෙයා යන්නෙ නැතුව බලාගෙන ඉන්නෙ” ඇය දොර දෙස බලමින් සිතුවා ය.

“මට ඉක්මනට යන්ට ඕනෑ” වෛද්‍යවරයා අපැහැදිලි ස්වරයෙන් කිවේ ය.” මට තවත් ප්‍රමාද වෙන්ට බැහැ, කාලය කියන්නෙ මුදල්!”

“ඔව්, හොඳයි ඩොක්ටට පරක්කු වෙන නිසා යන්න!”

“ඒ උනාට මේ... මට හිස් අතින් යන්ට පුළුවන්ද? මෙච්චර දුරක් ආපු මගෙ කාලය, මහන්සිය?”

“ආ... ඇත්ත තමයි” නදේෂ්දා ගොත ගසමින් තෙපළා ය. “ඔව් ඩොක්ට කියන කතාව හරි... මෙච්චර කරදර වෙලා දුර ගෙවාගෙන ආපු එකට ඩොක්ටට සල්ලි ගෙවන්ට එපායැ...? අනේ මට හරි මොකක්ද වගේ... අපේ මහත්තය සල්ලි ඔක්කෝම අරගෙන ගියා... මං ළඟ ගෙදර සතයක් වත් නැහැ!”

“හා... ඒක හරි පුදුමයි. කොහොම වුනත් මහත්තය ගෙදර එනකන් මට බලා ඉන්ට බැහැ. මෙයා ටිකක් සෙවිල්ලෙන් ගෙදර හැම තැනම හොයා බැලුවොත් කීයක් හරි හොයාගන්ට බැරිවෙන එකක නැහැ. ඇත්තටම මට ඕන කරන්නෙ බොහොම සුළු දීමනාවක්!”

“ඒ උනාට ඩොක්ට මට හොඳටම විශ්වාසයි, මගේ මහත්තය ගෙදර තියෙන ඔක්කොම සල්ලි අරගෙනයි ගියේ. මට හරි ලැජ්ජයි. අනේ මට කවදාවත් මෙහම වෙලා නෑ, හරිම ලැජ්ජා නැති වැඩක්!”

“මට හිතාගන්ට බැහැ දොස්තරවරු කරන රස්සාව ගැන මහජනයාගේ තියෙන ආකල්පය, හරියට අපි මිනිස්සු නොවෙයි වගේ, හරියට අපේ රස්සාව රස්සාවක් නොවෙයි වගේ. ඔක්කොමත් හරි, ඔයාගෙ ගෙදරට මං ආවෙ මගෙ කාලය නාස්ති කරගෙන කොච්චර කරදර විඳගෙන ද?”

“මට හොඳට තේරෙනව ඩොක්ට කියන කාරණය, ඒ උනාට ඩොක්ටට උනත් තේරෙනවා ඇතිනෙ ගෙදර සතයක්වත් නැති වෙලාවල් කොච්චර ඇති වෙනවද?”

“ඒක හරි නෝනා මහත්තයා, ඕව මොන තරම් බොළඳ තර්ක විතර්ක ද? ඔයා කතා කරන්නෙ බබෙක් වගේ. ඔයාට තේරෙන්න ඕනෙ මිනිහෙකුට ගෙවිය යුතු මුදල නොගෙවීම

හරි නැති බව. ඒක සදාචාර ධර්මයට විරුද්ධයි... මෙයා මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නව මොකද මං ඔයාව උසාවියට අරගෙන යන්නෙ නැති හන්ද... මේක හරිම පුදුම සහගතයි."

වෛද්‍යවරයා නිහඬ විය. තමාට අපහාස කළේ ය යන හැඟීමෙන් ඔහු කළකිරීමට පත් විය. නදේෂ්දා ලජ්ජාවටත් මවිතයටත් පත් වූවා ය.

"හොඳයි" ඇය තියුණු ස්වරයෙන් තෙපළා ය. "මං එනකං මෙහෙන් ඉන්න, මං කඩේට පණිවිඩයක් යවන්නම් සල්ලි ටිකක් අත මාරුවට ඉල්ලා ගන්න පුළුවන්ද කියල බලන්ට. මං ඩොක්ටට සල්ලි ගෙවන්නම්!"

නදේෂ්දා විසිත්ත කාමරයට ගොස් වාඩි වී කඩහිමියා ට තුණ්ඩු කැල්ලක් ලිව්වා ය. වෛද්‍යවරයා කබාය ගලවා විසිත්ත කාමරයට ගොස් එක්වර ම පුටුවකට බර වී හරිබරි ගැසුණේ ය. කඩහිමියාගෙන් පිළිතුරක් එන තෙක් දෙදෙනා ම නිහඬව වාඩි වී සිටියහ. විනාඩි පහකට පසුව පණිවුඩකරුවෙක් පැමිණියේ ය. නදේෂ්දා ඔහු ගෙනා ලියුම් කවරයෙන් රූබලයක් එළියට ගෙන වෛද්‍යවරයාට දුන්නා ය. ඔහුගේ දෑස එළියට පනින්ට තැත් කරන්නාක් මෙන් විදැහිණ.

"මෙයා ඇත්තටම විහිළු කරනව ද?" ඔහු රූබලය මේසය මත තබමින් කීවේය. "මගේ වැඩකාරයා නම් ඔන්න රූබලයක් ගනියි, හැබැයි මං බාරගන්නෙ නැහැ, බොහොම කණගාටුයි!"

"එහෙනම් කොච්චරද ඕනෙ?"

"මං සාමාන්‍යයෙන් රූබල් දහයක් ගන්නවා, ඒ උනාට ඔයාගෙන් නිසා රූබල් පහක් දුන්නම ඇති."

"එහෙනම් ගොඩක් වෙලා ඉන්ට වෙයි රූබල් පහක් ගන්ට ගන්ට ඕන නම්. මං ළඟ සල්ලි නැහැ."

"කඩකාරයට තව තුණ්ඩු කැල්ලක් යවන්ට. එයාට රූබලයක් දෙන්ට පුළුවන් නම් රූබල් පහක් දෙන්ට බැරි ඇයි? බැරි වෙන්ට හේතුවක් නැනෙ. අනේ නෝනා මං ආයාචනා කරනවා, මාව පරක්කු කරන්ට එපා, මං හරිම කාර්ය බහුල මිනිහෙක්!"

"ඩොක්ට ඔයා හරිම නපුරුයි... අමානුෂිකයි. ඔයා... හරිම දුෂ්ටයෙක්..." නදේෂ්දා ජනේලය දෙසට හැරී තොල විකා ගත්තා ය. ඇගේ දෑසින් කඳුළු වැගිරෙන්නට විය.

"මහ නොසන්ඩාලය" ඇය සිතුවා ය. "තිරිසනා මං වැටිල ඉන්න තත්වෙ මූට තේරෙන්නෙ නැත්ද? ඔහොම හිටපන් ඌරා!"

මොහොතක් කල්පනා කළ ඇය වෛද්‍යවරයා දෙසට හැරුණා ය. මෙවර ඇගේ මුහුණ වේදනාබර විලාසයක් ගෙන තිබිණ.

"ඩොක්ට!" ඇය බිඳුණු හඬින් තෙපළා ය. "ඩොක්ට... ඔයාට හදවතක් තියෙනව නම්, මං වැටිල ඉන්න තත්වෙ තේරුම් ගන්ට බලනව නම් මේ විදියට මාව තලන්නෙ නැහැ. මං විඳින දුක් කරදර ඔයා දන්නෙ නැහැ!" නදේෂ්දා සර්පිලාකාර දඟරයක් තද කරන්නාක් මෙන් දෑතින් හිස දෙපස තද කළා ය. අයගේ කෙස් කළඹ උරහිස් මතට වැටිණ.

"එක පැත්තකින් මං කරගත්ත මේ කසාදෙන් මට තියෙන කරදර මදිවට ඔයා වගේ උගත් මිනිහෙක් ඇවිල්ල මෙහෙම කරදර කරනව. මට නම් තවත් මේව උහුලන්න බෑ..."

"මේ ඔයා මේක තේරුම් ගන්න බලන්න... අපේ රස්සාවෙ හැටියට..."

වෛද්‍යවරයා ඔහු කියන්ට ආ දේ නිම කරන්ට ඉඩ නොලැබිණ. නදේෂ්දා දෙපා පණ නැතිව ගොස් ක්ලාන්ත වී වෛද්‍යවරයා ගේ විදැහුණු දෑත මත පතිත වූවා ය. ඇයගේ හිස ඔහුගේ උරහිස මතට වැටිණ.

"මෙතෙන්ට... මෙතෙන්ට... ගිනි උදුන ළඟට... ඔව්" මොහොතට පසු ඇය කොඳුරන්නාක් මෙන් තෙපළා ය.

"ළඟට එන්න... තව ළඟට එන්න... මං ඔයාට ඔක්කෝම කියන්නම්... ඔක්කෝම කියන්නම්..."

ඉන් පැයකට පමණ පසු ඔහු වෙලබීතව් නිවසින් පිටත් විය. ඔහු අපහසුතාවයටත්, ලැජ්ජාවටත්, ඒ සමගම තෘප්තියටත් පත් වී සිටියේය.

"මහා ජරාවක්!" යි අශ්ව කරත්තයේ වාඩිවන ගමන් ඔහු සිතුවේ ය. "ගෙදරින් යනකොට කවදාවත් මීට පස්සෙ සල්ලි ගොඩක් අරගෙන යන්ට නරකයි, තමුන්ම දන්නෙ නෑ කොහොම සල්ලි වියදම් වෙයි ද කියල..."

රුසියානු මුල් බසින් අනුවාදය:

**- පාලිත ගනේවත්ත** [pganewatta@gmail.com]

(image: https://fan-project.livejournal.com/653349.html)

සිසිල ගැන ඔබේ අදහස් දැන්වීමට

ඔබේ නිර්මාණ එවීමට

sisila.sangarawa@gmail.com

සිසිල පිටපත් ලබා ගැනීමට

අනුග්‍රාහක දැන්වීම් සඳහා

# අපි දකුණේ, හරිය?

වසන්ත අමරප්‍රිය

දකුණු ලක බස්වහරෙන් ලියැවෙන ලිපි මාලාවකි

## ආත්තම්මා



මං උපන්නේ මාතර... මාතරෙයි කිව්වට අර හෙනගහන ටවුම මැද එහෙම නෙවෙයි. නෙවෙයි කියන්නත් බෑ, ඉස්පිරිතාලේ තියෙන්නේ එතන නෙව.

හින්නිකිතර පුංචි එකා කාලේ, තාත්තගේ බයිසිකල් කට්ටෙ පොල්ල යටින් කකුල දාල පදින්න පුරුදු වෙන කාලේ, දනපොලොතු ලෙලි ගහන් ආවම, ආච්චිල, සීයල නැති අපේ ගමේ, අපේ ආත්තම්මයි, මුත්තයි කිව්වෙ "මූ නං කෝචේ දාල මැකුවත් හදන්න නං බැහැ" කියල. ඒ විතරක් නෙවෙයි මෙහෙව් එකෙක් හැදුව ය කියල අපේ තාත්තටත් බැන බැන ගොබළු ගෙඩියක් නැඹිලියේ උරච්චි කොල්ල තුවාලෙ උලන්නෙත් කට කමිස්සිරියාවක් නැතුව බැන බැන "කඩියාව නැතුව හිටපං මේ ඩිංග ගානකන්" කියල.

ඒ කාලේ අපේ ආත්තම්මට ම පන්ගරාර්තුවෙන තවත් ආත්තල හිටිය අපේ ගොඩේ. උන්දලා අපේ ආත්තම්මට කිව්වෙ කඩේ ගාව අක්ක කියල. මොන කෙන්ගෙඩියකට එහෙම කිව්වද කවුද්දන්? හවස් ජාමේ එහෙම එන අහල පහල ආත්තල "කඩේගාක්කේ" කියාගෙන එළිපත්තේ වාඩි වෙනවා. ඒ එනකොට වත්තෙන් අහුලපු ජූල් ගෙඩියක්, ගහකින් කඩාගත්තු පැපොල් ගෙඩියක් එහෙම අරං එන්නෙ. හිටි ගමන් එහෙම එන ආත්තලත් එක්ක මං වගේ ම ජංගි කොටේ ගහගත්තු අල්ලපු වතුවොල පුංචි ඇයොත් එනවා. ඩිංගිත්තක් වෙලා එතන ඉන්න කොට "මහ මිනිස්සු කතාකොන්න තැන කට උඩ බලන් ඉන්නව" යි කියල එතනින් එලෝනවා. ඒ පාර මං මට හරියන එකා අල්ල ගන්නවා...

"ඒයි... ඔහේ එනවයි අත්තාපන් ගහන්න...?"

ඌත් බැහැයි නොකිය බජනෙට එනවා... ගේ වටේට, අඹ ගස් පල්ලේ අතන මෙතන බිම් කරුවල වැටෙනකන් අපි අත්තාපන් ගහනවා.

"බබුන්හාමි කහට ටිකක් බීල පලයන්..." ආත්තම්මා කියනවා. හින්නිකිතර සීනි ඩිංගක් අල්ලට හලාගෙන බබුන්හාමි ආත්තා කහට බොනවා. අපි සීනි බෝතලේ ලඟට කිට්ටුවෙද්දී ම ඒක රාජසන්තක වෙනවා.

"අහකට පලයල්ලා... කාල කාල පණු අමාරුව හදාගත්තාම ඇන්ටිපා පොවන්නත් උස්සන් පලයල්ලකො!" ආත්තම්මා කියනවා.

"මූත් එහෙම තමයි..." බබුන්හාමි ආත්තා අර පුංචි එකා පෙන්නනවා.

කරුවල වැටෙනකොට චිමිනි ලාම්පුවයි, කුප්පි ලාම්පු තුනයි පත්තු කරන්න ඕන.

ලාම්පු තෙල් බෝතලේ කටට කුනීලෙ තියල පරිස්සමට චිමිනි ලාම්පුවට වක්කොන්න ගමන් අම්ම අක්කට කෑ ගහනවා. "රෑ වෙන්න ඉස්සෙල්ලා පොල් ගෙඩියක් ඔයාපන්...! කරුවලේ දෙකන් හකන් නොගහා."

මුත්තා කිසි හාහෝවක් නැතුව බුරුත පුටුවෙ වාඩිවෙලා පුවක් ගෙඩියක් කුරුටු ගානවා.

කරුවල වැටුනම ඉඳල හිටලා එන කලාමැදිරියි, රෑ බදුල්ලොයි, මෙරුයි, උන් කන්න එන ගෙබ්බොයි අපිට අහුවෙනවා,

"නවත්තපල්ලා ඔය සලක්කාරම..." ආත්තම්මා ආයෙත් සැර දානවා... "මං ජූල් කිරි මිරිකන්න හදන්නේ!"

අපි දුවල ගිහින් අත් හෝදගෙන ආත්තම්මා වාඩිවෙච්ච කොලොම්බුව වටේ ඇන තියාගන්නවා. ඉදිලා කළු වෙච්චි ජූල් මද මැටි කෝප්පෙට දාලා, ලුනුත් හින්නෙක්කිතර දාලා, සීනි, පොල්කිරි පදමට දාලා ආත්තම්මා ජූල් කිරි හදල ඉවරවුණා ම ආත්තම්මාගේ අත ලෙවකන්න පොරකන්න සිද්ද වෙනවා. හැමදාම වගේ මම දිනනවා. ආත්තම්මා වැඩියෙන් ආදරේ මට.

දත් නැති නිසා උන්දැට බුලත් විට කොටලා දෙන්නෙත් මම. ඩිංගිත්තක් වෙලා බුලත්විට ලොඹු කරන උන්දා "ප්රුහ්හ්...!" ගාලා පිළිකන්නට කෙළගහනවා. "මොකෝ බොටත් ඕනෙයි...?" කට දිහා බලන් ඉන්න මගෙන් ආත්තම්මා අහනවා. උන්දැගේ හක්ක හරියේ තියෙන විට ලඩේ මැද හරියෙන් ඩිංගක් අරන් මගේ කටේ තියනවා. ඒ බුලත් විට කිරි රහයි. මමත් ලොකු මිනිහෙක් වගේ "ප්රු ...හ්හ්" ගාල කෙල ගහන්න ගිහිං බඩෙයි, ජංගියෙයි බුලත් කෙල හලාගන්නවා.

"මෙන්න මෙහාට වරෙන්...!" ආත්තම්මා මට බැන බැන උන්දා ඇඳන් ඉන්න චීත්තෙන් මගේ කටයි බඩයි පිහිදානවා.

"පුංචි ඇයින්ට බුලත් කන්න දෙන්න එපා... ඕකුන්ට බුලත් කැව්වම හෝඩිය කියවන්න බැරිවෙනවා..." මුත්තත් අගුල්පත් තියෙනවා.

රෑට නිදාගන්න හොඳම තැන අත්තම්මගේ වැල් ඇඳ. ඇඳ විට්ටම්වලට අත් ලණුවලින් රටා දාල ඒ ඇඳ වියලා තියෙන්නේ. ඒ ලණු අඹරා ගන්නෙත් ආත්තම්මමයි. ඒක උඩ නැගලා උඩ පැන්නම ස්ප්‍රින් එකක් වගේ තමයි.

"ඇහැක් තරං වැයං කොල්ලා ඒකත් කඩා දාපං..." අත්තම්ම බනිනවා.

රෑට නිදාගන්නකොට අත්තම්මා චීත්තෙ පෙරෝනවා.

උන්නම හිටියම දවසක ආත්තම්මා ලුණුමාලු ගේන්න නිල්වැල්ලේ යනවා. වේවැල් කැටකූඩේට හොඳට හෝදපු හෝර්ලික්ස් බෝතල තුන හතරකුත් දාගෙන, සාලුවකුත් කරේ දාගෙන උන්දෑ ලෑස්ති වෙනවා.

"මමත් එනවා...!" මාත් ගමන යන්න ලෑස්ති වෙනවා.

"මක්කටෙයි උඹ එන්නෙ? මග දිගට පලවන්න...! බො ගෙදර හිටින්...!"

එතකොට මම බිම වාඩි වෙලා බෑගිරි ගහලා අඬනවා.

"හා, වරෙන්, වරෙන්..." කොරහට වතුර අරන්, හොටු හූරවල, ඇඟපත හෝදවලා කාරිය හෝදපු තාන් සුවඳ ජංගියකුයි, පොඩි කමිසයකුයි අන්දවලා, පව්ඩර් දාලා බබා වගේ ඉන්න මං ආත්තම්මාගේ අතේ එල්ලෙනවා. ඒ උනාට ඒ ටික දුරයි. ඊට පස්සේ එක්කෝ ඉස්සරහින්, නැත්නං පස්සෙන්... "සුනංගු නොවී වර...!" හිටපු ගමන් ආත්තම්මා දෙස්ස කපනවා.

එහෙම යද්දී මග දිගට අහුවෙන ගෙවල්වොල ඉන්න ආත්තල "අනේ කඩේගාක්කේ... මටත් ලුණුමාලු ඩිංගක් අරන් එන්න ඇක?" කියලා ජෑම් බෝතලයක් හරි, හෝර්ලික්ස් බෝතලයක් හරි විගහට හෝදල ගෙනත් දෙනවා. ඒ වගේ ගෙදරක ඉන්න මං වගේ එකෙකුටත් අපි දැක්කම කඩිගාය හැදෙනවා. එහෙම එකෙක් දෙකෙක් අඬා දොඩා පොලවේ පස්කාලා හැපුනම උන්ගේ ආත්තම්මා ගමනට අවසර දෙනවා.

එකා, දෙක තුනවෙලා නිල්වැල්ලට යද්දී හතර පස්දෙනෙක් පෙරහැර වගේ පස්සෙන් වැටෙනවා. මග දිගට තියෙන පොල් කිරිල්ල, බට කිරිල්ල, අඹ, කජු, පඩවැල්, හිඹටු, මොට්ටු ආදී මෙකී නොකී හැම ගඩාගෙඩි ජාතියටමත් අපේ සේනාව වග කියනවා.

ඔකී, මෙකී, නොකී දඟ වැඩවොලින් පස්සෙ අපි නිල්වැල්ලට යන්නේ එක්කො කහට නාගෙන, නැත්නං කහඹිලියා ගාගෙන. නිල්වැල්ලේ ගෙදරින් පොල්තෙල් ඉල්ලගෙන කහඹිලිය ගා ගත්තු තැන්වල ආත්තම්මා ගාන්නේ බැන බැන.

*තවත් කොටසකින් මුලිච්චි වෙමු...!*

**- වසන්ත අමරප්‍රිය** [amarapriya42@gmail.com]



# අතීත අත්දැකීම් ස්මරණය

**මාලිනී ගනේවත්ත**

අපි පොඩි කාලේ කළ කී දේ අපට මතක්වෙන අවස්ථා තියෙනවා නේද? ජීවිතයේ අප ලබන අත්දැකීම් අපට මතක හිටින්නේ කුමන වයසක සිට ද කියා සොයා බලන්න මට හිතුණේ මගේ එවැනි මතක පිළිබඳ සිතට ආ හැඟීමක් එක්ක.

ඇත්තට ම කුමන වයසක ඉඳන් ද අපට ඒ දේවල් මතක හිටින්නේ? මේ පරණ දේවල් මතකයේ රඳවා ගැනීමෙන් ඇති වැඩේ මොකක්ද?



මේ ගැන හුගක් මනෝවිද්‍යාත්මක පර්යේෂණ කරලා තියෙනවා. මුල් පර්යේෂණවලට අනුව දරුවෙකුගේ වයස අවුරුදු තුන-තුනහමාරේ පමණ සිට තම ජීවිත අත්දැකීම් මතක තියෙනවා. පුද්ගලයන් 6,641ක් සහභාගී කරගෙන ලන්ඩන්, බ්‍රැඩ්ෆර්ඩ් සහ නොටින්හැම් ට්‍රෙන්ට් විශ්වවිද්‍යාල කළ පර්යේෂණයක දී, එයින් 38.6% ක් තමන්ට අවුරුදු දෙකේ දී හා ඊටත් පෙර සිදුවීම් මතක බව කියා තියෙනවා. එයින් 893ක් කියා තියෙනවා අවුරුදු එකේ දී සිදු වූ දේ ද මතක බව. මේ අය වැඩියෙන්ම මැදිවියේ හා වයස්ගත අය.

මේ සමහර මතක ළදරු කරත්තයක සිටි කුඩා ම අවදිය තරම් ඈත ඒවා. ඒ මතක වැඩිහිටියෙකු කියූ දෙයක් මත හෝ ඡායාරූපයක් මත හෝ ගොඩ නැගුණු ඒවා බවයි පර්යේෂකයන්ගේ මතය. එනම්, ඒ හිතේ ඇතිවෙන ප්‍රබන්ධ. නමුත් අප දන්නේ නැහැ එය ප්‍රබන්ධයක් බව. නිදසුනක් හැටියට කවුරු හරි ඔබට කියා තිබුණොත් “ඔයාට පොඩි කාලේ තිබුණු ප්‍රෑම් එක කොළ පාට එකක්” කියා, ඒ මත ඔබේ සිතේ ප්‍රබන්ධයක් ගොඩනැගෙනවා. එය ඔබේ පොඩි කාලේ මතකයක් විදියට ඔබ පසුව විස්තර කරනවා. මේ විදියට මිනිසුන්ගේ මතකයෙන් 40% ක් ම යම් උදව්වක් මත ගොඩ නැගුනු ප්‍රබන්ධ බවයි මනෝවිද්‍යාත්මක පර්යේෂණවලින් දැක්වෙන්නේ.

මෙයට යම් සාධකයක් ලෙස මගේ මුනුපුරෙකු ඇසුරෙන් මට නිරීක්ෂණය කරන්නට ලැබුණා දරුවන් තම කුඩා කාලයේ පින්තූර හා ඒවායේ පසුබිම් තල ඔස්සේ තම අතීත අත්දැකීම් පිළිබඳ ප්‍රබන්ධ ගොඩනගා ගන්නා බව.

හුගක් අයට තම ජීවිතයේ අවුරුදු තුන-තුනහමාරට පෙර කාලයේ සිදුවීම් මතක පොතේ අඳුරු කලාපයක්. නමුත්, ඇතැම් පර්යේෂණවලට අනුව ඉතා කුඩා අවදියේ වුවත් මුහුණ දුන් අත්දැකීම සුවිශේෂී එකක් නම් එය මතකයේ රැඳෙනවා. නිදසුනක් විදියට සහෝදරයෙකුගේ උපත.

නෙවාඩා විශ්වවිද්‍යාලයේ මනෝවිද්‍යා සහාය මහාචාර්ය David Copoland විසින් කළ අධ්‍යනයකට අනුව මතකය අවුරුදු දෙකේ පටන් රැඳී තිබෙන්න පුළුවන් බව Memory ජර්නලයේ සඳහන්. අපේ අතීත මතක සංස්කෘතිය, ජාතිකත්වය, නිවස පිහිටි පරිසරය, දෙමව්පියන් ඔබේ මතක අවදි කරන ආකාරය, බුද්ධිය, ඔබ උපන් අනුපිළිවෙල, ඔබේ පවුලේ විශාලත්වය, ලිංගිකත්වය වැනි කරුණු මත රඳා පවතින බවත් එහි කියවෙනවා.

පෙර මතක පුද්ගලයාගේ හර අගයන්, බිය, බලාපොරොත්තු හා සිහින සමග ද බැඳී පවතිනවා. ඒ වගේම, පෙර මතක ඉගෙනීම තුළින් පුද්ගලයන්ට තම අභ්‍යන්තර ළදරුවා අවදිකිරීමට අවකාශය විවර වෙනවා. ඒ මගින් සාංකාව, පීඩාකාරීබව සමනය කරගන්න පුළුවන් බව සොයාගෙන තියෙනවා. වෙන විදියකට කියනවා නම්, අපේ පෙර මතක ස්මරණය අපට අප ගැනම උගන්වනවා. අපි අපේ ළදරු හා ළමා කාලයට කොහොමත් ආදරෙයි නේ.

මට ස්මරණය කරන්න පුළුවන් ඈතම අතීතය මගේ වයස අවුරුදු දෙක දක්වා දිවෙනවා. හැබැයි ඒක සුන්දර මතකයක් නම් නෙවෙයි. මට අවුරුදු දෙකේ දී සරම්ප රෝගය තදබල විදියට හැදිලා තියෙනවා. ඒ කාලේ දැන් වගේ එන්නත් තිබුණේ නැහැ නේ. මගේ ඇගේ උෂ්ණත්වය අංශක $105^0$ දක්වා ඉහළ ගිහින්. මගේ ඇගේ මුළුමනින්ම වාගේ හම ගිහින්. මේ සේරම මට කිව්වේ මගේ අම්මා. මගේ මතකයේ තියෙන්නේ සනීපවුණාට පස්සේ පොඩි ජංගි කෑල්ලක් ඇඳගෙන සිටින පුංචි මම මගේ උදර ප්‍රදේශයේ හම අතින් ඇද ගලවමින් හිටි හැටි විතරයි.

මෙතැනින් පටන් ගන්නා මගේ අතීතය පිළිබඳ ස්මරණය වයසින් වැඩි වීමත් එක්ක හුගක් පුළුල් පරාසයක විහිදී පවතිනවා. ඒක මගේ සමීපතමයන්ගේ, ඒ කියන්නේ ස්වාමි පුරුෂයා හා දරුවන්ගේ ඒ ස්මරණ හැකියාවට වඩා හුගක් වැඩි බව මට තේරුම් යනවා. මතකයේ සමහර ඒවා අඳුරු බැවින් වඩාත් මතක තිබෙනවා වෙන්න පුළුවන්. මං ඇතැම් ඒවා කතන්දර වශයෙන් ලියමින් ඉන්නවා.

**- මාලිනී ගනේවත්ත** [mganewatta@gmail.com]

සිසිල කෙටිකතාව

# කැමරා

**ශක්තික සත්කුමාර**



රාළහාමි පොලිස් කූඩුවේ ඉබ්බව ඇරල "කුරුල්ලා" දිහා බැලුවා. කිසිත් නොකී කුරුල්ලා හිමින් සැරේ කූඩුව ඇතුළට ගියා. කූඩුව ඇතුළෙන් ආපු පුස් ගඳට කුරුල්ලගේ නහය හැකිළුණා. බිත්තියට ම අල්ලා හදලා තිබුණු සිමෙන්ති බංකුවේ කුරුල්ලා වාඩිවුණා. කූඩුව ඇතුළේ කිසිවක් නොමැතිවීම පිළිබඳව කුරුල්ලට දැනුනේ හීන් සතුටක්. බස් නැවතුම් පොළේ දී තමන්ව ජීප් රථයට ගොඩවාගත් රාළහාමිගේ හෝ තමන්ව කූඩුවට දැමූ රාළහාමිගේ හෝ රුව කුරුල්ලා යකඩ පොලු අතරින් සෙව්වා. ඒ වෙද්දී කුරුල්ලාට නොදැනීම ඔහුගේ ඇස් බොඳවෙලා තිබුණා. කුරුල්ලා තදින් දෑස් පියා ගත්තා.

උදේ නවයේ ටර්න් එක යන්න බස් එක ගහලා "කොටුව... පිටකොටුව..." කියලා කෑ ගහන්න කුරුල්ලාට අවස්ථාව ලැබුණේ එක සැරයක් විතරයි. පොලිස් රාළහාමි කෙනෙක් එක්ක මාතලී අයියා කුරුල්ලා ළගට ආවා.

"මල්ලී, මේ රාළහාමි උඹව එක්කගෙන යන්න ඇවිත්... මං මේ බස් එක ඇදලා පොලිසියට එන්නම්... උඹ රාළහාමි එක්ක පලයන්..." මාතලී අයියා පිටට තට්ටුවක් දැම්මා. කුරුල්ලා පුදුමයෙන් වගේ පොලිස් රාළහාමි දිහා බැලුවා.

"ඇයි... මාව...?" කුරුල්ලාගේ දිව පැටළුණා. බටහිර අහසින් සෞම්‍යව නැගුණු හිරු ලෝ දිය වක්කරන්නට තතනමින් හිටියා.

"තමුසෙ නේ ට්‍රැක්මෝ හන්දියේ බණ්ඩාර...?" රාළහාමිගේ හඬ වේගවත් වුණා.

"ඔව්... ඔව්... සර්... ඒත්..... ඇයි...?" කුරුල්ලා නැවත ගොත ගසන්නට වුණා. බස්නැවතුමේ සිටි සියල්ලන්ගේ ම දෑස් කුරුල්ලා ළග නතර වී තිබුණා.

"ඒවා බලාගන්න පුළුවන් පොලිසියට ගියාම..."

* * *

"ඒයි... ආන් තමුසෙට ලොකු සර් කතා කරනවා!"

කුරුල්ලා අමාරුවෙන් දෑස් ඇරියා. පොලිස් කූඩුවේ දොර ඇරිලා. ඒ අසල රාළහාමි කෙනෙක් ඔරවගෙන කුරුල්ලා දිහා බලාගෙන හිටියා. කුරුල්ලා කොන්ක්‍රීට් බංකුව උඩින් නැගිට්ටා. පොලිස් ස්ථානාධිපතිවරයාගේ කාමරයට කුරුල්ලාව තල්ලු කරගෙන ගිය රාළහාමි ස්ථානාධිපතිතුමාට සැලියුට් එකක් ගහල අතුරුදහන් වුණා. පරිගණකයේ දෑස් අලවාගෙන සිටි ස්ථානාධිපතිවරයා එක්වරම පරිගණකයේ තිරය කුරුල්ලා දෙසට කැරකෙව්වා. පරිගණක තිරයේ තමාගේ රූපය සටහන්ව තිබෙනවා දුටු කුරුල්ලා විශ්මයෙන් ඒ දෙස බලා සිටියා.

උඩුකය නිරුවත්ව සරම කැහැපොට ගසාගෙන පොල්ලක් අතින් ගත් තමන් එක්වරම එය ඔසවා පහරක් ගසනවාත් සමගම පරිගණක තිරය අඳුරු වුණා.

"තමුසේ අහල පහල ගෙවල්වල කැමරා කුඩු කරන්නේ වීරයෙක් කියලා හිතාගෙන ද?" පොලිස් ස්ථානාධිපතිවරයා මේසයට තඩි බා නැගී සිටියා. බස් එකේ සෙනග පටෝගෙන යන වෙලාවට පොලිස් විසිල් එකට මාතලී අයියා බස් එක පාර අයිනට කරල නතර කරපු ගමන් බස් එකේ ලියකියවිලි ටික තියෙන අතටම දියවුණු කාඩ්බෝඩ් ෆයිල් එක අරන් ඒ යටින් රුපියල් පන්සීයක් තියාගෙන පොලිස් රාළහාමිල ගාවට ඉගිළිලා ගියත් පොඩි කාලෙ ඉඳලා කුරුල්ලා පොලිස් කාකි ඇඳුමට බයයි.

"තමුසෙ කැමරා කුඩු කරේ ගේ බිඳින්න හිතාගෙන ද?"

පොලිස් ස්ථානාධිපතිවරයා බිමට නැමී තිබුණු කුරුල්ලාගේ මුහුණ නිකටින් අල්ලා ඉස්සුවා. ගොරක මදමෙන් රත් පැහැ ගැන්වී තිබෙන ඒ දෑස් මග හැරීමට කුරුල්ලාට ශක්තියක් තිබුණේ නෑ.

"තමුසෙ ඊයේ හවස ගිහින් මිස්ට සේමසිංහගේ නෝනාට තර්ජනය කරලත් තියෙනවා... තමුසේ දන්නවද සේමසිංහ කියන්නේ කවුද කියලා...?"

"ඕ... ඔව්... සර්... මං ඒ නෝනට තර්ජනය කළේ නෑ... මං කීවේ අපේ ගේ පැත්තට තියෙන කැමරාවේ සටහන් වෙලා තියෙන දේවල් ටික පෙන්නන්න කියලා..." කුරුල්ලා අමාරුවෙන් වචන ගළපා ගත්තා.

"ඒ මොකද අයිසෙ ඒ?" ස්ථානාධිපතිවරයා කුරුල්ලාගේ නිකට අතහැර දමා තම අසුන කරා පියමනින්නට වුණා. කුරුල්ලාට යම් සහනයක් දැණුනා.

"ඇයි තමුන්ගේ ගෙදර මොනව හරි නැතිවුණා ද? කැමරාව බලන්න ඕන වුණේ...?" මේසය මත පීරිසියකින් වසා තිබූ වතුර වීදුරුව අතට ගත් ස්ථානාධිපතිවරයා පීරිසිය ඉවත් කර ඉන් උගුරු කීපයක් පානය කළා.

“නෑ... නෑ... සර්... ඒ ගෙදර වැඩ කරන ගෑනුකෙනා ලේන් එකේ ප්‍රචාරයක් ඇරලා තිබුණා මගේ ගෙදරට දවල්ට මිනිහෙක් රිංගනවා. එක ඒ ගෙදර නෝනලා සී.සී.ටී.වී. කැමරාවෙන් දවස් කීපයක් බැලුව කියලා...”

ස්ථානාධිපතිවරයාගේ ජංගම දුරකථනය නාදවන්නට පටන් ගත් නිසා කුරුල්ලාට කතාව නවත්වන්න වුණා. මේසය මත තිබූ ජංගම දුරකථනය කනේ තබා ගන්නා අතර ස්ථානාධිපතිවරයා කුරුල්ලාට කාමරයෙන් පිටවන ලෙස අතින් සන් කළා. ස්ථානාධිපතිවරයාගේ කාමරයෙන් එළියට ආපු කුරුල්ලා ඒ අසළ තබා තිබූ ලෑලි බංකුවේ වාඩි වුණා.

වේගයෙන් පැමිණි ජීප් රථයක් පොලිසිය ඉදිරිපිට තිරිංග තද කළේ විශාල ශබ්දයක් නිකුත් කරමින්. පිටිපස්සේ දොර ඇරගෙන පිටතට පැනපු පොලිස් නිලධාරියෙක් එහි සිටි තරුණයෙකුව එළියට ඇදලා ගත්තා. තරුණයාගේ දෑතට මාංචු දමලා තිබුණේ. ඒ දර්ශනය දැකපු කුරුල්ලාව ඉබේම නැගිට්ටවුණා. සිවිල් ඇඳුමෙන් සැරසී සිටි නිලධාරියෙක් පොලිසිය ඉදිරිපිටට ආවා.

“සර් මෙන්න මිනිහා...” තරුණයාව එළියට ඇදලා ගත්තු පොලිස් නිලධාරියා ඔහුව පොලිසිය තුළට තල්ලු කරමින් කීවා.

“අහිංසක කෙල්ලන්ව රවට්ටාගෙන කාමරවලට ගෙනියල, උන්ට හමන්නලා, ඒවා කැමරා කරගෙන උන්වම බය කරලා සල්ලි ගන්න එක පිරිමිකමක් ද බල්ලෝ...?” සිවිල් ඇඳුමින් සිටි නිලධාරියා මාංචු දැමූ තරුණයා ඇද සිටි ටී-ෂර්ට් එකේ කොලරයෙන් අල්ලා ගත්තා.

“ඔයිට හොඳයි බොල ගු කෑවා නම්...” තරුණයාව පොලිස් කූඩුව දෙසට තල්ලු කරමින් සිවිල් ඇඳුමින් සිටි නිලධාරියා ස්නාධිපතිවරයාගේ කාමරය දෙසට හැරුණා.

* * *

මාතලී අයියා පැමිණ ස්ථානාධිපතිවරයා හමු වූ පසු කුරුල්ලාට ඇප ලැබුණා. තමා විසින් කඩා දැමූ සේමසිංහ මහතාගේ සී.සී.ටී.වී. කැමරාවේ අලාභය ගෙවීමට ද කුරුල්ලා එකග වුණා.

පොලිස් ඇප ලබා නිවසට පැමිණි කුරුල්ලාට මහත් පාලුවක් දැනුණා. ඔහුට තම බිරිය ලාලනීවත් පුතු ගිම්සරවත් මතකයට නැගුණා. කමිසය ගලවා බෝල කූඩුවේ එල්ලූ කුරුල්ලා ඇඳ මත දිගාවුණා.

“මේක මොන කරදරයක් ද? දැන් මට ඔය ප්‍රශ්නෙට උත්තර දීලා එපා වෙලා! මාත් එක්ක අහවල් එක කරන්න දවල්ට මෙහාට මොකාවත් එන්නෑ... තමුසෙට ඔච්චර මාව සැකනම් ගෙදරට වෙලා ඉන්නවකෝ...” පෙර දින ලාලනී කෑ ගැසූ අයුරුත් මද පමණට රත් වී සිටි තමන් ඇගේ කම්මුලට ගැසූ අයුරුත් කුරුල්ලාට මැවී පෙනුණා.

“තෝ මට ඇත්ත කියන්නේ නැත්නම් මම තොට ඔප්පු කරලා පෙන්නන්නම්... අද මම මේකෙ දෙකෙන් එකක් විසඳ ගන්නවා...” පාපැදියට නැගුණු කුරුල්ලා කොට්ටගහමුල බාර් එක ළගට එක පැද්දේ විදුලි වේගයෙන්.

කුරුල්ලා බාර් එක ළග මිතුරු සමාගමට වැටුනට පස්සේ කාලය ඉගිල යනවා දැණුනේ නෑ. ඔහු තම බස් මිතුරන් සමග බාර් එක ළග රෙස්ටුරන්ට් එකට ගොඩ වූණේ ගල් බෝතලයක් ද කිහිල්ලේ ගහගෙන. කුරුල්ලා ආපසු ආවේ බයිසිකලය තල්ලු කරගෙන. ඒ වන විට ඔහුගේ කෝපය ඇලකොහොල්වලට දියවී ගොස් තිබුණා. අඩක් නිම කර තිබූ නිවසේ දොර අගුළු නොදමා වසා දමා කිසිදු විදුලි බුබුලක් නොදල්වා බිරියත් පුතත් ඒ වන විට අතුරුදන්ව සිටියා.

“කුරුල්ලා... කුරුල්ලා... මොකද බං මේ ගෙදර ලයිට් එකක්වත් දාල නැත්තේ...” මාතලී අයියාගේ හඬින් කුරුල්ලා ඇස් ඇරියා. ගණ කළුවර මිස කිසිවක් ඔහුගේ දෑසට හසු වුණේ නෑ. අඳුරේම ඇඳෙන් බැස ගත් කුරුල්ලා සාලයේ සහ ඉස්තෝප්පුවේ විදුලි බුබුළු දැල්වූවා. බියර් කෑන් දෙකක් හා කෑම පාර්සලයක් අතින් ගත් මාතලී අයියා සාලයට ඇතුළු වුණා.

“මට ටිකක් නින්ද ගියා අයියේ...”

* * *

හවස් වෙනකම්ම බසයේ වැඩ කළ කුරුල්ලා සවස ලාලනීගේ නිවසට යෑමට සූදානම් වුණා. ඔහුව ඒ සඳහා පෙළඹුවේ මාතලී අයියා.

“ඔය සේමසිංහ මහත්තයාගේ ගෙදර වැඩකාරකමට ඉන්න ගෑනි පුළුවන් තරම් බොරු කට කතා පතුරවන එකියක්. උඹ ගිහින් නංගිව එක්කන් වරෙන්. කොහෙවත් යන බොරු කට කතාවක් හින්ද චේච්ච දේ බලපන්...” මාතලී අයියාගේ වදන් කුරුල්ලා පිළිගැනීමට මැලි වුණේ නෑ.

ලාලනී ගේ මහ ගෙදරට යන විට හිරු විඩාබරව තිබුණා. කුරුල්ලා අලුතෙන් හදාගෙන යන ගෙදරයි, ලාලනීගේ මහගෙදරයි අතර තිබුණේ හැතැම්ම පහක දුරක්. ඒ දුර බයිසිකලේ යන්න පුළුවන් වුණත් කුරුල්ලා ගියේ බස් එකේ. නැවත තනියම ගෙදර එමේ අදහසක් කුරුල්ලාට තිබුණේ නෑ.

තාත්තාව දුටු ගිම්සර “තාත්තා...” යැයි කෑගසාගෙන ගේට්ටුව දෙසට දුවගෙන ආවා. කුරුල්ලා තම පුතුව දෑතින් අල්ලා වඩාගෙන සිප ගත්තා.

“පුතා අද ඉස්කෝලෙ ගියෙ නැද්ද?”

“මං මෙහේ ඉඳලා ඉස්කෝලෙ ගියා තාත්තේ”

“කෝ අම්මා?” කුරුල්ලා නිවස දෙස බැලුවා.

“තාත්තා අද ආවේ නැත්නම් අම්මා කීවා අපි හෙට ගෙදර යමු කියලා...”

ස්වාමිපුරුෂයාගේ කටහඬ ඇසුණු ලාලනී සාලයේ දොර අසලට ආවේ විදුලි වේගයෙන්. ඇගේ මව දිගු සුසුමක් හෙලා ළය සැහැල්ලු කරගෙන මුළුතැන්ගේ දෙසට ගියේ බෑණාට තේ කෝප්පයක් හදන්න හිතාගෙන. ලාලනීගේ මූණේ හිනාව උතුරායමින් තිබුණා.

“තාත්තේ... මේ සතිය ඇතුළත හැම ළමයටම රුපියල් පන්සීයක් ගේන්න කීවා. ඉස්කෝලේ ආරක්ෂාවට සී.සී.ටී.වී. කැමරා හයි කරනවා කියලා එකට...” ගිම්සර පුතුගේ වදන් කන තුළ දෝංකාර වෙද්දී කුරුල්ලා මුහුණේ සිනාවක් ඇඳගෙන බිරිය දෙස බැලුවා. ඇගේ මුහුණේ සිනහව අතුරුදහන්ව ගොස් තිබුණා.

**- ශක්තික සත්කුමාර**

[shakthikasathkumara@gmail.com]

# පරිවර්තන සාහිත්‍යයෙන්

## තාත්තා කළ උදව්ව

"Father's Help" by R. K Narayan – Translated by Helmalie Gunathilaka

සඳුදා උදෑසන එළඹ ඇති බව වැටහුණු විට ඇඳේ වැතිරී සිටි ස්වාමි කිලිපොලා ගියේය. ඔහුට දැනුණේ සිකුරාදා පාසලේ අන්තිම පරිච්ඡේදය අවසන් වූයේ මීට මොහොතකට කලින් බවයි. ඉතා ඉක්මණින් නැවතත් සඳුදා එළඹී ඇත! භූමිකම්පාවක් ඇති වී පාසල් ගොඩනැගිල්ල ධූලි බවට පත්වන්නැයි ඔහු ප්‍රාර්ථනා කළේ ය. නමුත් "ඇල්බර්ට් මිෂන්" පාසල නම් වූ එය, වසර සියයකට වැඩි කාලයක් මෙවැනි ප්‍රාර්ථනා ලබා තවමත් නොසැලී පසුවිය. උදෑසන නමයට "මගේ ඔලුව කැක්කුමයි," කියා ස්වාමිනාදන් කෑ ගැසුවේ ය.



"රික්ෂෝ එකක ඉස්කෝලේ යන්න!" ඔහුගේ මව කීවා ය.

"එහෙම වුණොත් ඉස්කෝලෙට යද්දී මම සම්පූර්ණයෙන්ම මැරිලා ඉඳීවි. අම්මා දන්නවද රික්ෂෝ යද්දී කොයි තරම් ගැස්සෙනවා ද කියලා?"

"අද වැදගත් පාඩම් ගොඩක් කෙරෙනව ද?"

"වැදගත්? හහ්! අපේ භූගෝල ගුරුවරයා අවුරුද්දක් තිස්සේ එකම පාඩම උගන්වමින් ඉන්නේ. ඊළඟට තියෙන්නේ ගණිතය, ඒ කියන්නේ මුළු පාඩම පුරාවටම අපිට ගුරුවරයාගෙන් ගුටිකන්න තමයි වෙන්නේ... වැදගත් පාඩම්!"

මෙය ඇසූ අම්මා ස්වාමි ගෙදර නැවතිය යුතු බව කීවේ බොහොම නිර්ලෝභී ලෙසයි.

උදෑසන නමයහමාරට, තමන් පාසලේ ශාලාවේ සිට මහා හඬින් යාඥා කිරීමට නියමිත වෙලාවේ ස්වාමි තම මවගේ කාමරයේ බංකුවක වැතිරී සිටියේ ය.

"මොකද, අද ඉස්කෝලේ නැද්ද?" තාත්තා ඔහුගෙන් ඇසී ය.

"ඔලුව කැක්කුමයි," ස්වාමි පිළිතුරු දුන්නේ ය.

"විකාර! ලෑස්ති වෙලා යනවා."

"ඔලුව කැක්කුමයි."

"ඉරිදාට රස්තියාදු ගැහිල්ල අඩු කළොත් සඳුදාට ඔලුව කැක්කුම් නැති වෙයි."

පියාගේ මුරණ්ඩු ගති ගැන හොඳින් දැන සිටි ස්වාමි තම ක්‍රියා පිළිවෙල වෙනස් කළේ ය. "මට පරක්කු වෙලා පන්තියට යන්න බැහැ."

"ඒක හරි, ඒත් ඒක කරන්න වෙනවා, උඹේම නේ වැරැද්ද. ගෙදර නවතින්න තීරණය කරන්න කලින් උඹට තිබ්බේ මගෙන් අහන්න."

"මම මේ තරම් පරක්කු වෙලා ගියොත් සර් මොනවා හිතයි ද?"

"උඹ පරක්කු ඔලුව කැක්කුම නිසා කියපන්."

"එහෙම කිව්වොත් මට ගහයි."

"එහෙමද? අපි බලමුකෝ. මොකද්ද එයාගේ නම?"

"සැමුවෙල්."

"එයා කොල්ලන්ට ගහනවා ද?"

"එයා හරි දරුණු යි, වැඩියත්ම පරක්කු වෙලා එන කොල්ලන්ට. මීට ටික දවසකට කලින් පරක්කු වෙලා ආවා කියලා ළමයෙක් ව පීරියඩ් එකක්ම පන්තියේ කෙළවරක දණ ගස්සලා තිබ්බා. මෙහෙම කළේ වේවැල් පාර හයකුත් දීලා කන් දෙකත් මිරිකුවාට පස්සේ. සැමුවෙල් ගේ පන්තියට පරක්කු වෙලා යන්න මම නම් කැමති නැහැ."

"එයා ඔය තරම් දරුණුයි නම් ඇයි ලොකු මහත්තයාට කියන්නේ නැත්තේ?"

"හැමෝම කියන්නේ ලොකු මහත්තයාත් එයාට බයයි කියලා. මහා දරුණු මිනිහෙක්."

ඉනික්බිති ස්වාමි සැමුවෙල් ගේ දරුණු ක්‍රියාකාරකම් ගැන බියකරු විස්තරයක් කළේ ය. කොලුවෙකුට වේවැල් පහර දීමට පටන් ගත් විට ලේ දකින තුරු ඔහු එය නොනවත්වන හැටි, ඉන්පසු නළලේ ලෝහිත සලකුණක් ඇඳෙන සේ ඒ ලේ ගලන අත්ල තම නළල ට තද කරන ලෙස කොලුවාට බල කරන හැටි ඔහු විස්තර කළේ ය. මෙය අසා තමන්ට

පමා වී පන්තියට යා නොහැකි ඇයිද යන වග තම පියා විසින් තේරුම් ගනු ඇතැයි ස්වාමි බලාපොරොත්තු විය. නමුත් සිදු වූයේ අනිකකි. තාත්තාගේ හැසිරීම අනපේක්ෂිත ලෙස වෙනස් විය. ඔහු උද්යෝගයෙන් පසුවන බවක් පෙනුණි. "මේ ඌරෝ අපේ ළමයින්ට ගහලා මොනවද ඔප්පු කරන්න හදන්නේ? උන් ව සේවයෙන් පන්නලා දාන්න ඕන. ඉඳපන්කෝ හොඳ වැඩක් කරන්න..."

මෙහි ප්‍රතිපලය වූයේ ගුරුවරයාට කරනු ලබන එක්තරා අභියෝගයක් ලෙස ඔහු ස්වාමි ව ප්‍රමාද වී පන්තියට යැවීමට සූදානම් වීම යි . මේ ගැන ස්වාමි කෙතරම් විරෝධය පැවත් ඉන් පලක් වූයේ නැත. ස්වාමි පාසල් යා යුතු විය.

ස්වාමි ලක ලැහැස්ති වන අතරතුර තාත්තා විසින් විදුහල්පති ට දීමට දිගු ලිපියක් ලියා, එය කවරයක දමා වසා තිබිණි.

"තාත්තා මොනවාද ඕකේ ලියලා තියෙන්නේ?" ස්වාමිනාදන් බියෙන් ඇසුවේ ය.

"උඹට අදාළ දෙයක් නෙමෙයි, මේක ලොකු මහත්තයාට දීලා උඹේ පන්තියට පලයන්."

"තාත්තා ඕකේ අපේ සැමුවෙල් සර් ගැනත් ලිව්වා ද?"

"එයා ගැන හොඳ විස්තරයක් ලිව්වා. ලොකු මහත්තයා ඕක කියෙව්වාම ඔය සැමුවෙල් කාරයව රස්සාවෙන් අස්කරලා පොලිසියට භාර දෙයි සමහර විට."

"එයා මොනවා කළා කියලාද තාත්තා ලිව්වේ?"

"එයා කරපු දේවල් සේරම ඔය ලියුමේ ලියලා තියෙන්නේ. ඕක ලොකු මහත්තයාට දීලා උඹේ පන්තියට පලයන්, හවසට එද්දී මතක ඇතුව ලියුම ලැබුණු බවට ලොකු මහත්තයාගෙන් තුණ්ඩුවක් අරන් එන්න ඕනෑ!"

බොරුවට දිවිරීම අතින් ලෝකයේ සිටින නරකම කෙනා තමන් බව සිතමින් ස්වාමි පාසලට ගියේ ය. ඒ වෙද්දී ඔහුගේ හෘද සාක්ෂිය ඔහුට වධ දෙමින් තිබිණි. තමන් සැමුවෙල් ගැන විස්තර කරද්දී සත්‍යම කීවා ද යන වග ඔහුට සැක සහිත වූ අතර ඉන් කෙතරම් ප්‍රමාණයක් ඇත්ත ද, කෙතරම් ප්‍රමාණයක් මවාගත් දේ ද ඔහුට ම තීරණය කළ නොහැකි විය. සැමුවෙල් ගැන තීරණයක් ගැනීමට ඔහු මහමඟ අයිනේ මොහොතක් නැවතුණේ ය. සැබවින්ම නම් සැමුවෙල් එතරම් නරක මිනිසෙක් නොවී ය. ඔහු අනෙත් ගුරුවරුන්ට වඩා ප්‍රිය මනාප විය. ස්වාමි ගේ අලසකම් ගැන ඔහු ඉඳහිට විහිළුවක් දෙකක් පවා කළේ ය. ස්වාමි මේවා සැලකුවේ තමන්ට කරනු ලබන විශේෂ සැලකිල්ලක් ලෙසයි. නමුත් ඔහු අතීතයේ කෙදිනක හෝ සිසුන්ට දරුණු ලෙස සලකා තිබෙන්නට ඉඩ ඇත. ඔහුගේ වේවැල් පහරින් වරක් හෝ සිසුන්ගේ අත්ල හම ගැලවී තිබෙන්නට ඉඩ ඇත. මෙවැනි සිද්ධියක් ගැන මතක් කරගන්නට ස්වාමි වෙහෙස වූයේ ය. නමුත් එවැන්නක් ඔහුට මතක් වූයේ නැත. මීට වසර ගණනාවකට පෙර පළමු කාණ්ඩයේ කොලුවෙකුගේ අත්ලට වේවැල් පහර දී ඉනික්බිති ඉන් ගැලූ ලේ කොලුවාගේ මුහුණේ තවරාගන්නට ඔහු අණ කර තිබිණි. නමුත් මේ සිද්ධිය ඇසින් දුටුවෙක් නොවූ අතර පාසලේ ළමුන් විසින් වසරින් වසර මේ පුරාවෘත්තය ඉදිරියට රැගෙන ගියහ. සැමුවෙල් ගේ චරිත ස්වභාවය ගැන ඇති වූ පටලැවිල්ලෙන් ස්වාමිගේ හිස බමන්නට විය. ඔහු සැබවින් ම හොඳ ද නරක ද යන වග, ලිපියේ වූ ඒ චෝදනා ලබන්නට ඔහු සුදුසු ද යන වග... නැවතත් ගෙදර දිව ගොස් මේ ලිපිය නැවත ගන්නට තාත්තාගෙන් යාප්පුවෙන් ඉල්ලන්නට ස්වාමිට සිත් විය. නමුත් තාත්තා බෙහෙවින් මුරණ්ඩු අයෙකි.

කහ පැහැති පාසල් ගොඩනැගිල්ල වෙත ළඟා වෙද්දී තමන් සිදු කරන්නට යන්නේ වැරදි සාක්ෂි දී තම ගුරුවරයා විනාශ කරන්නට බව ස්වාමිට වැටහිණි. විදුහල්පති සැමුවෙල් ව අස් කිරීමට ඉඩ ඇති අතර පොලීසිය ඔහුව යදම් ලා හිරේ ලනු ඇත. මේ සියලු නින්දාවන්, මදි පුංචිකම්, වේදනාවන් ට වගකිව යුත්තේ කවුද? ස්වාමි වෙව්ලා ගියේ ය. සැමුවෙල් ගැන තව තවත් සිතද්දී ස්වාමි ට ඔහු ගැන දැනෙන ශෝකය වැඩි විය. ඒ තලෙළු මුහුණ, රත් පැහැ ගැන්වුණු කුඩා දෑස, සිහින් උඩු රැවුල, රැවුල් කොට සහිත දෙකොපුල සහ නිකට, කහ පැහැති කබාය- මේ හැම දෙයක්ම ස්වාමි තුල ශෝකයක් ජනිත කළේ ය. තම සාක්කුවේ වූ ලියුමේ බර දැනෙද්දී ඔහුට හැඟුණේ තමන් අලුගොසුවෙක් බවයි. මොහොතකට තම පියා ගැන තද කෝපයක් ඔහුට දැනුණි. පියා වැනි අසාධාරණ මුරණ්ඩු අයෙක් ලියූ ලිපියක් තමන් කාණුවට වීසි නොකරන්නේ ඇයිදැයි ඔහුට සිතුණි.

පාසල් ගේට්ටුවෙන් ඇතුල්වෙද්දී ස්වාමි ට මීට විසඳුමක් ලෙස එක්තරා ආකාරයක අදහසක් පහළ විය. ඔහු එවේලේම විදුහල්පති වෙත ලිපිය නොදී දවස අවසානයේ දී එය දෙන්නට තීරණය කළේ යම් මට්ටමකට තාත්තාගේ අණ ට විරුද්ධ වීමක් සහ තම ස්වාධීනත්වය ප්‍රකාශ කිරීමක් ලෙස ය. මේ ගැන තාත්තාට දැනගන්නට නොලැබෙන බැවින් ඉන් හානියක් සිදුවන්නේ නැත. මීට අමතරව මේ ලිපිය දවස අවසානයේදී භාරදීමට තබා ගැනීමෙන් ඒ දවස තුළ සැමුවෙල් ගුරුතුමා මෙහි සඳහන් දේ සාධාරණීකරණය වන දෙයක් කරන්නටත් ඉඩ ඇත.

ස්වාමි තමන්ගේ පන්තියේ දොරකඩ සිටගෙන සිටියේ ය. ගණිතය පාඩම උගන්වමින් පසු වූ සැමුවෙල් මොහොතකට ස්වාමි දෙස බැලුවේ ය. සැමුවෙල් තමන්ගේ ඇඟට පැන සම ඉරා දමනු ඇතැයි අපේක්ෂාවෙන් ස්වාමි පසුවිය. නමුත් ගුරුවරයා "තමුසේ දැන් ද පන්තියට එන්නේ?" ඇසුවා පමණි.

"ඔව් සර්."

"තමුසේ පැය භාගයක් පරක්කුයි."

"මම දන්නවා," දැන් වත් ගුරුවරයා තමන්ට පහර දෙනු ඇති සිතමින් ස්වාමි කීවේ ය. 'තිරුපති දෙවියනි සැමුවෙල්ගෙන්

මට ගුටි කන්න ඉඩ සලස්වන්න.' යනුවෙන් යාඥා කරන්නට පවා ඔහු සූදානම් ව සිටියේ ය.

"මොකද තමුසේ පරක්කු?"

"පරක්කු උනොත් සර් මට මොකද කරන්නේ බලන්නමයි" කියා පිළිතුරු දීමට ස්වාමි ට අවැසි වූවත් ඔහු කීවේ "මට ඔලුව කැක්කුමක් හැදුණා සර්" කියා පමණි.

"එහෙනම් තමුසේ ඉස්කෝලේ ආවේ මොකද?'

මෙය සැමුවෙල්ගෙන් අපේක්ෂා නොකළ වර්ගයේ ප්‍රශ්නයක් විය. "මගේ තාත්තා කිව්වා ඉස්කෝලේ පාඩු කරගන්න එපා කියලා සර්." ස්වාමි පිළිතුරු දුන්නේ ය.

මෙය අසා සැමුවෙල් සතුටට පත් වූ බවක් පෙනුණි. "තමුසෙගෙ තාත්තා හරියට හරි, හොඳ නුවණක්කාර මිනිහෙක්. අපි කැමතියි ඒ වගේ තව දෙමව්පියෝ ඉන්නවා නම්."

"අනේ අසරණ පණුවෝ!' ස්වාමි සිතුවේ ය. "උඹ දන්නේ නැහැ මගේ තාත්තා උඹට කරලා තියෙන දේ!" ඔහු සිටියේ සැමුවෙල් ගේ හැසිරීම ගැන මහත් වියවුලෙනි.

"හරි තමුසේ ගිහින් ඉඳගන්නවා. තාම ඔලුව කැක්කුම ද?"

"යන්තම් තියෙනවා සර්."

ස්වාමි තම අසුන වෙත ගියේ මහත් තැවුලෙනි. සැමුවෙල් තරම් යහපත් මිනිසෙක් ඔහුට කෙදිනකවත් හමු වී නැත. ගුරුවරයා ගෙදරදී කරන්නට දුන් අභ්‍යාස පරීක්ෂා කරමින් සිටියේ ය. ස්වාමි ගේ අදහස අනුව නම් මෙය මහත් සේ දරුණු හැසිරීම් ඇතිවිය යුතු මොහොතකි. මේ අභ්‍යාස පොත් මුහුණු වෙත දමා ගැසීම්, කොල්ලන්ට බැණ වැදී වේවැල් පහර දීම්, ඔවුන් ව බංකු මත සිටුවා තැබීම් සිදු විය යුතු වේලාව යි. නමුත් එදින නම් සැමුවෙල් ඉවසීම සහ මෘදු බව ප්‍රගුණ කළා වැනි විය. වැරදි සහිත වූ පොත් ඉවතට තල්ලු කළ ඔහු වේවැලෙන් යන්තම් තට්ටු දැම්මා පමණි. එමෙන්ම ඔහු කිසි කෙනෙක් විනාඩි කිහිපයකට වඩා සිටුවා තැබුවේ නැත. ඉනික්බිති ස්වාමි ගේ වාරය එළඹිණි. ඔහුට මේ වරම ගැන දෙවියන්ට ස්තුති කරන්නට පවා සිත් විය.

"ස්වාමිනාදන්, කෝ තමුසෙගෙ ගෙදර වැඩ?"

"මම ගෙදර වැඩ කළේ නැහැ සර්" ඔහු ගණනකට නොගෙන කීවේ ය.

නිහැඬියාවක් පැතිරිණි.

"ඒ මොකද- ඔලුව කැක්කුම නිසා ද?" සැමුවෙල් ඇසී ය.

"ඔව් සර්."

"හරි එහෙනම් ඉඳගන්නවා."

ස්වාමි නැවතත් අසුන් ගත්තේ සැමුවෙල්ට කුමක් වී ද යයි සිතමිනි. ඒ කාල පරිච්ඡේදය අවසන් වෙද්දී ස්වාමි ට දැනුණේ මහත් අසරණ කමකි. ඒ දවසේ අවසාන කාල පරිච්ඡේදය ද වෙන් වූයේ සැමුවෙල් ට ය. මෙවර ඔහු පැමිණියේ ඉන්දියානු ඉතිහාසය ඉගැන්වීමට යි. මේ කාල පරිච්ඡේදය 3.45 ට ආරම්භ වී 4.30 ට අවසන් වේ. ස්වාමිනාදන් ඒ දවස ගෙවූයේ තදින් කල්පනා කරමිනි. සැමුවෙල් ව කේන්ති ගැස්විය හැකි ක්‍රමයක් ඔහුට කල්පනා වූයේ නැත. ඔරලෝසුවේ හතර වදිද්දී ඔහුට නොඉවසුම් බවක් දැනුණි. තව පැය භාගයයි!

සැමුවෙල්, වස්කෝ ද ගාමා ගේ ඉන්දියානු ආගමනය විස්තර කරන පරිච්ඡේදයක් කියවමින් සිටියේ ය. පන්තියේ සිසුහු තරමක අලසකමින් මීට සවන් දුන් හ. හදිසියේම ස්වාමි මහා හඬින් මෙසේ ප්‍රශ්න කළේ ය. "මොකද සර් කොලොම්බස් ඉන්දියාවට ආවේ නැත්තේ?"

"එයාට පාර වැරදුණා."

"මට නම් ඒක විශ්වාස කරන්න බැහැ, එක වෙන්න බැරි දෙයක් සර්."

"ඇයි?"

"ඔච්චර ශ්‍රේෂ්ඨ මනුස්සයෙක් පාර දන්නේ නැති වෙන්න පුළුවන් ද?"

"කෑ ගහන්න එපා, මට තමුසේ කියන දේ හොඳට ඇහෙනවා."

"මම මේ කෑ ගහනවා නෙමෙයි සර්. මේ දෙවියෝ මට දීපු කටහඬ, ඒ ගැන මම මොනවා කරන්න ද?"

"කට වහගෙන වාඩිවෙනවා!"

තම ක්‍රියාවේ සාර්ථකත්වය ගැන තරමක් සතුටින් ස්වාමිනාදන් නැවතත් අසුන් ගත්තේ ය. ගුරුවරයා ඔහු වෙත සැකය මෙන්ම ප්‍රශ්නාර්ථය පිරුණු බැල්මක් හෙලා නැවතත් තම පාඩම ඇරඹුවේ ය.

ඔහුගේ දෙවෙනි අවස්ථාව එළඹුණේ ඉදිරිපස බංකුවේ අසුන්ගෙන සිටි සංකර් නැගී සිට "සර්, ඉන්දියාවට ආව පළමුවෙනි මනුස්සයා වස්කෝ ද ගාමා ද?" යැයි ඇසූ විට යි.

ගුරුවරයා ට මීට පිළිතුරු දෙන්නට අවස්ථාව ලැබෙන්නට පෙර ස්වාමි පසුපස බංකුවක සිට "එහෙම තමයි එයාලා කියන්නේ" කියා කෑ ගැසී ය.

ගුරුවරයා ඇතුළු පන්තියේ සියලු දෙනා ස්වාමි දෙස බලන්නට වූහ. ස්වාමිනාදන් ගේ මේ කරදරකාරී හැසිරීම ගැන ගුරුවරයාට ගැටළු සහගත ව තිබිණි.

"ස්වාමිනාදන් තමුසේ ආයෙත් කෑ ගහනවා."

"මම මේ කෑ ගහනවා නෙමෙයි සර්, දෙවියෝ දුන්නු කටහඬ ගැන මම මොනවා කරන්න ද?"

පන්ති කාමරයේ ඔරලෝසුවේ හතරයි කාල වැදුණි. තව පැය කාලයි. ඒ වෙලාව ඇතුළත ඔහු යම් බැරෑරුම් දෙයක් කළ යුතු ය. සැමුවෙල් ඔහු දෙස රවා බලා ඔහුට සැරෙන්

කතා කර තිබුණත් එය ප්‍රමාණවත් නොවිණි. තමා තව ටිකක් මහන්සි වූවොත් සේවයෙන් පහ කර හිරේ දැමීමට සුදුසු හැසිරීමක් සැමුවෙල් වෙතින් ලබා ගත හැකි යැයි ස්වාමීට සිතුණි.

පාඩම් පොතේ එක් කොටසක අවසානයට එළැඹි විට ගුරුවරයා පාඩම නතර කළේ ය. ඉතිරි විනාඩි කිහිපය සිසුන් වෙත ප්‍රශ්න ඉදිරිපත් කිරීම ඔහුගේ අදහස විය. මුළු පන්තියට ම තම පොත් ඉවත් කරන්නට අණ කළ ඔහු, දෙවෙනි පේළියේ සිසුවෙකුගෙන් මෙසේ ප්‍රශ්න කළේ ය.

“වස්කෝ ද ගාමා ඉන්දියාවට ගොඩ බැස්සේ කවද්ද?”

“1648 දෙසැම්බර් 20,” ස්වාමිනාදන් වහා නැගිට කෑ ගැසුවේ ය.

“කෑ ගහන්න අවශ්‍ය නැහැ,” ගුරුවරයා කීවේය. “මොකද ඔලුව කැක්කුම නිසා තමුසෙට පිස්සු හැදිලා ද?”

“මට දැන් ඔලුව කැක්කුමක් නැහැ සර්, “ ඔහු උද්යෝගයෙන්, මහා හඬින් කීවේ ය.

“වාඩිවෙයන් මෝඩයා,” තමන්ට මෝඩයා කියනු අසා ස්වාමීට මහත් සතුටක් දැනුණි. “තමුසෙ ආයෙත් නැගිටලා තිබුණොත් වේවැල් පාර දෙනවා,” ගුරුවරයා කීවේ ය.

මේ පොරොන්දුව ගැන සතුටින් ස්වාමි අසුන් ගත්තේ ය.

“මම දැන් මෝගල් අධිරාජ්‍ය යුගය ගැන ප්‍රශ්න කීපයක් අහනවා. මෝගල් අධිරාජ්‍යවරු අතරින් ශ්‍රේෂ්ඨතම, ආගමට වඩාත්ම ලැදි අධිරාජ්‍යයා කවුද?”

ස්වාමි නැගී සිටියේ ය. ඔහු නැගිටිනු දුටු වහාම “වාඩිවෙනවා!” යැයි ගුරුවරයා තදින් කීවේ ය.

“මට උත්තර දෙන්න ඕන, සර්.”

“වාඩිවෙනවා!”

“නැහැ සර්, මට උත්තර දෙන්න ඕනෑ!”

“දැන් තමුසෙ ආයෙත් නැගිට්ටොත් මම මොනවා කරනවා කියලාද මම කලින් කීවේ?”

“සර් කිව්වා මගේ අතේ හම යනකම් මට වේවැල් පාර දීලා ඒ තුවාල මගේ නළලට තදකරගන්න කියනවා කියලා.”

“හරි, මෙහෙ එනවා.”

ස්වාමිනාදන් මහත් ප්‍රීතියෙන් යුතුව තම අසුනෙන් නැගිට ගොස් පන්තියේ වේදිකාවට නැග්ගේය. ගුරුවරයා මේස ලාච්චුවෙන් තම වේවැල ගෙන “අත අල්ලපන් පොඩි යක්ෂ පැටියා” යැයි කේන්තියෙන් කෑ ගැසී ය. ඉනික්බිති ඔහු ස්වාමිගේ දෙඅත්ලට තද වේවැල් පහර තුනක් එල්ල කළේ ය. ස්වාමි කිසිම පැකිලීමකින් තොර ව ඒවා භාර ගත්තේ ය. දුසිම් භාගයක් වේවැල් පහර ලැබුණු පසු “මේ ඇති ද, තව ඕනෙ ද?” කියා ගුරුවරයා ඇසුවේ ය.

ස්වාමි කිසිත් නොකියා නැවතත් තම අත්ල පෑ අතර ඔහුට තව පහරවල් දෙකක් ලැබුණි. එවෙලේ ම සීනුව නාද විය. තම දෙඅත්ල පුපුරු ගසමින් තිබුණ ද ස්වාමි වේදිකාවෙන් බිමට පැන්නේ සැහැල්ලු හදවතිනි. තම පොත් පත් එකතු කරගත් ඔහු තම සාක්කුවේ තිබුණු ලිපිය ද ගෙන විදුහල්පතිගේ කාමරය ට දිව ගියේ ය. එහි දොර අගුලු ලා තිබුණි.

“ලොකු සර් කෝ?” ඔහු එහි වූ කාර්යාල සහායක ගෙන් විමසුවේ ය.

“මොකටද හොයන්නේ?”

“මගේ තාත්තා ලොකු සර් ට දෙන්න ලියුමක් දුන්නා.”

“ලොකු සර් හවස් වරුව නිවාඩු. ලබන සතියෙත් එයා නෑ. මේ ළමයාට පුළුවන් දෙවෙනි ලොකු සර් ට ලියුම දෙන්න. එයා තව ටිකකින් ඒවි.”

“ඒ කවුද ඒ?”

“ඔයාගේ ගුරුවරයා, සැමුවෙල්. තව තත්පරයකින් එයා එයි.”

ස්වාමිනාදන් එතැනින් ඉවත් වූයේ ඉගිලෙමින් මෙනි. ඔහු ලිපියත් අතැතිව ම නිවසට එනු දුටු විට ඔහුගේ පියා “මම දැනගත්තා උඹ ඕක දෙන්නේ නැති බව, බය ගුල්ලා!” යි කීය.

“ලොකු සර් නිවාඩු, සත්තයි,” ස්වාමිනාදන් විස්තර කිරීමට තැත් කළේ ය.

“බියගුළුකමට අමතරව තව බොරුත් කියනවා.” තාත්තා පිළිතුරු දුන්නේ ය.

“ලොකු සර් ආයෙත් ආව ගමන් මම මේක දෙන්නම්” ස්වාමි ලිපිය ඔසවා පෙන්වමින් කීවේ ය.

තාත්තා ඔහුගේ අතින් ලියුම උදුරාගෙන, එය ඉරා, මේසය යට වූ කුණු කූඩයට දැම්මේ ය.

“මින්පස්සේ සැමුවෙල් උඹේ බෙල්ල මිරිකුවත් මට නම් ඇවිත් කියන්න එපා, උඹටම ගැලපෙනවා උඹේ සැමුවෙල්!” ඔහු කේන්තියෙන් මිමිණුවේ ය.

පරිවර්තනය:

**හෙල්මලී ගුණතිලක** [helmalie999@yahoo.com]

Translation of the short story “Father’s Help” by R. K Narayan from the book ‘Malgudi Days’ (1972), Penguin Publishers



දීපිකා ශ්‍රියානි සුනේත්‍රා වඩුගේ

# සෙනෙහස

සිසිල සඟරාවේ කොටස් වශයෙන් පළවෙන නවකතාව

## මෙතෙක් කතාව

දෙමාපියන් අහිමි අංජලී කුඩා අවධියේ සිට ම හැදුණේ තම නැන්දණිය තලතා සහ මාමණ්ඩිය බුවනෙක ළඟයි. නැන්දණියගේ බාල පුතු වෛද්‍ය ශිෂ්‍ය සුනෙත්, මෑතක සිට අංජලී ගැන උනන්දුවක් දැක්වූවත් අංජලී නිවසේ සිටි හැම මොහොතේම උත්සාහ කළේ ඔහු මග හැරීමටයි. තම මව අංජලීට විවාහ යෝජනා සොයන බව දැනගත් සුනෙත් වහාම තම ආදරය ඇයට පවසන්නට තීරණය කළා.

අංජලී දැක පැහැදුණු සහකාර පොලිස් අධිකාරී හරේන් මංගල යෝජනාවකින් පසුව අංජලීව බැලීමට ආ බව දැනගන්නා සුනෙත් තම මව සමග කෝප වී නිවසෙන් පිටව මිතුරෙකුගේ නිවසට යනවා. ඔහු ඉන්නා තැන දැන ගැනීමට සුනෙත් ගේ වැඩිමහල් සොයුරු ගුවන් හමුදා කපිතාන් දේවක වෙහෙසෙනවා.

තලතා සහ බුවනෙක දෙපළගේ ආරාධනයෙන් හරේන් නිවසට පැමිණි විට ඔහු හා දේවක මුල්වරට හමු වෙනවා.

### අද එතැන් සිට



හරේන් නිවසට පැමිණි මොහොතේ සිට දේවකගේ හැසිරීමෙහි තිබූ වෙනස බුවනෙක පමණක් නොව තලතා ද නිරීක්ෂණය කර තිබිණ. අංජලීට සහකරුවෙකු තීන්දු කිරීමට පෙර සුනෙත් සහ දේවක දැනුවත් නොකිරීම නිසා ඇති වූ නොමනාපය හා වික්ෂිප්ත බව තම පුතුන් දෙදෙනාගේම එම වෙනසට හේතුව යැයි සිතූ ඔවුහු, ඒ ගැන වැඩි දුරටත් සිතන්නට නොපෙළෙඹුණ හ. අඩුපාඩුව සිදුව තිබෙන්නේ දෙමාපියන් ලෙස තම පාර්ශ්වයෙන් යැයි සිතූ බුවනෙක නිරන්තරයෙන්ම තලතාට පවසා සිටියේ දරුවන් අබියස ඉවසීමෙන් කටයුතු කරන ලෙසට ය. දේවක ගැන සොයා බැලීමට සිතා තලතා ඔහුගේ නිදන කාමරය වෙත යාමට සැරසෙන විට වුව ද බුවනෙක එය වලකාලූයේ අනවශ්‍ය ප්‍රශ්ණයක් ඇතිවේ යැයි වූ බිය නිසාවෙනි.

“ඔයා දැන් ලොකු පුතා බලන්න යන්න ඕනැ නැහැ තලතා... එයාට කොහොම ද කියල බලන්න මං එයාගෙ කාමරය ළඟට ගියා... එයා හිසේ ඇම්මක් කියල ගියාට තවම නිදි නැහැ. බැල්කනියෙ ඉඳගෙන කා එක්ක හරි කතාකරනව... සමහර විට ඒ කතා කරන්නෙ අංජලී දුව එක්ක වෙන්න පුළුවන්... එහෙමත් නැත්තම් සුනෙත් එක්ක වෙන්නත් බැරි නැහැ.”

තලතා ටික වේලාවක් බුවනෙක දෙස බලා සිටියේ, තරමක් වික්ෂිප්තව ය.

“සමහර විට එහෙම වෙන්න ඇති... ඒත් මම සුනෙත්ට කෝල් එකක් ගන්න හදන හැම වෙලාවකම සුනෙත්ගෙ ෆෝන් එක ඕෆ්... මම සුනෙත්ගෙ දුක සැප බලන්නත් කතා කරන්නෙ එයාගෙ යාළුවගෙ ෆෝන් එකට... මට හිතෙන්නෙ සුනෙත් විතරක් නෙවි ලොකු පුතත් වැඩ කරන්නෙ මට රිද්දන්න හිතාගෙන වගේ...”

“තලතා... එහෙම හිතන්න එපා... ඒ දෙන්නගෙ පැත්තෙන් හිතුවොත් අපි වැඩ කරල තියෙන්නෙත් එයාලට රිදෙන විදියට නේ... ලොකු පුතාගෙ හිතේ මොනව තියෙනවද කියන්න මං දන්නේ නැහැ. ඒත් එයා අපේ හිත් රිදෙන්න තරම් මොනවත් නොකියන්න පරිස්සම් වුණා. හරේන්ට වුණත් එයා වෙනසක් පෙන්නුවෙ නැහැ. මට තියෙන ප්‍රශ්ණය ඒක නෙවෙයි. හරියට සෝඩා බෝතලයක් වගේ ඉක්මනට ම තරහ ගිහින් ඉක්මනටම නිවෙන සුනෙත්ට තවමත් හිත හදාගෙන ගෙදර එන්න බැරිවුණු හේතුව මොකක් ද කියන එක... ඉන්ටර්න්ෂිප් එක ලැබෙනකම් වත් එයාට ගෙදර ඇවිත් අපිත් එක්ක ඉන්න යුතුකමක් තියෙනවා. එහෙම බැලුවොත් අඩුම ගානේ ලොකු පුතා තාමත් සතියකට කිහිප සැරයක්වත් ගෙදර ඇවිත් යනව නේ... ඉතින් තලතා අපි ඒක ගැන හිතලවත් සතුටු වෙමු!”

“පුතාල දෙන්නගේ වැඩ පිළිවෙළත් එක්ක අපි ජීවත්ව ඉන්න කාලෙ මෙහෙම නම්, අපි නැති වුණ කාලෙක දී අංජලී දුව කොයිතරම් අසරණ වේවි ද කියල මට බයක් දැනෙනවා... අංජලීට ආදරය කරන හොඳ ගතිගුණ තියෙන

හරේන් වගේ දරුවෙක් අපිට අහම්බෙන් හරි හමුවුණ එක කොයිතරම් වාසනාවක් ද කියල මට හිතෙනවා.”

“සුනෙත්‍රයි, දේවකයි ගැන එහෙම හිතන්න එපා තලතා... ඒ දෙන්නා මෙහෙම වෙනස් වුණේ, මේ ප්‍රොපෝසල් එකෙන් පස්සෙ... නැත්නම් අපිටත් වඩා අංජලීගෙ ළඟින්ම හිටියේ ඒ දෙන්නා. අපි නැති කාලෙක අපිටත් වඩා හොඳින් ඒ දෙන්න තමන්ගේ නංගි බලාගනීවි කියල මට නම් හිතෙනව.”

“මගේ දරුවො දෙන්න කොච්චර හොඳ වුනත් ඔයා හිතන විදියට හිතලා මගේ හිත හදාගන්න අමාරුයි. ඒ තරමටම මගේ හිතට අමුත්තක් දැනෙනවා.”

“තලතා ඔයාටත් හරි යනව අර... ‘කොරහෙත් කිඹුල්ලු දකිනවා’ කියන කියමන! හැම දෙයක් ගැන ම ඕනෑවට වඩා හිතන්න එපා... දැන් හොඳටම රෑ වෙලා... ඔය ප්‍රශ්න ඔක්කොම අමතක වෙන්නත් එක්ක, වොෂ් එකක් අරගෙන හොඳට නිදාගන්න බලන්න.”

බුවනෙක කෙලෙසක තලතාගේ හිත සැනසීමට උත්සාහ කළ ද, තලතා ගේ සිතේ පැවති දොම්නස පහකිරීම එතරම් පහසු කරුණක් නොවීය. තම පුතුන් දෙදෙනාගේ හැඟීම් සහ චර්යාවන් පිළිබඳ ඇගේ සිතේ පැවති සැක සංකාවන් ඒ අයුරින්ම බුවනෙක සමග හෝ කතා කිරීමට ඇයට දිරියක් නොතිබිණි. කෙසේ හෝ තම දරුවන් දෙදෙනාට සහ අංජලීට ගැටලු වලින් තොරව ජීවත්වීමට පරිසරයක් සැකසීමට ඇයට අවශ්‍යව තිබිණ. එහි දී තම දරුවන්ගේ සිතැඟි වලට අවධානය යොමු කිරීමට වඩා අංජලීගේ අනාගතය සැපවත් සහ සුරක්ෂිත කිරීම සඳහා තමන් විසින් ගත යුතු හොඳම ක්‍රියාමාර්ගය ගනිමින් සිටින්නේ යැයි ඇය විශ්වාස කළාය.

* * *

දේවක, හරේන්ගෙන් සහ තම දෙමව්පියන්ගෙන් සමුගෙන තම නිදන කාමරය වෙත පැමිණිය ද, සැබවින්ම ඔහුට අවශ්‍යව තිබුණේ නින්ද නොව ඒ සැමගෙන් හුදෙකලාවීමට ය. සියල්ලට ම පෙර ඔහුට අංජලී සමග කතා කිරීමට අවශ්‍යව තිබිණ. අනතුරුව ඔහුට ඔහුගේ ළඟින්ම සිටින මිතුරා වූ සහන් සිහිපත් විය. ඒ ඔහුගේ සිතෙහි වදදෙමින් තිබෙන ඉතාම සංවේදී කරුණක් වුව බෙදාහදා ගැනීමට සිටි විශ්වාසතම පුද්ගලයා ඔහු වන නිසාවෙනි.

දේවකගෙන් දුරකථන ඇමතුම ලැබෙන විට අංජලී පසු දින භාරදීමට නියමිතව තිබූ නිබන්ධනයක් සම්පූර්ණ කරමින් සිටියාය. අංජලී කාර්ය බහුලව සිටිය ද ඇමතුම දේවකගෙන් බව දුටු නිසා යම් චකිතයකින් යුතුව වුව දුරකථනයට පිළිතුරු දීමට සැරසුණා ය. තාරකී ද වහා අංජලී අසලට පැමිණියේ එම ඇමතුම දේවකගෙන්ම වන බව දැනුණ හෙයිනි.

“අංජු... ඒ දේවක අයිය නේද? දෙකක් නැහැ මම කිව්ව වගෙ නඩුවක් වෙන්නම ඕනැ. බලමු... ඔයා බය නැතිව ආන්ස්වර් කරන්න.” තාරකී පැවසුවේ, හරේන් හමුවීමෙන් පසුව දේවකගේ ප්‍රතිචාරය කුමක් විය හැකි ද යන්න ගැන දැන ගැනීමට අංජලී මෙන්ම ඇය ද යම් කුතුහලයකින් පසු වූ නිසාවෙනි.

“නංග මේ වෙලාවෙ බිසි ද? මට ඔයත් එක්ක ටිකක් කතා කරන්න පුළුවන් ද?”

“අයියා... ටියුට් එකක් හෙට සබ්මිට් කරන්න තියෙනවා . ඒකේ ගොඩක් වැඩ ඉවරයි. කමක් නැහැ කතාකරන්න පුළුවන්.”

“මෝඩි... හෙට සබ්මිට් කරන්න තියෙන ටියුට් එක තව ම කම්ප්ලීට් නැත්නම් කොහොමද මාත් එක්ක කතා කරන්නෙ. ටිකක් සීරියස් කතාවක් ඒක...”

“කමක් නැහැ අයියා... මට එක ඉක්මනට ඉවර කරන්න පුළුවන්. ඔයා අහන්න හදන ඔය සීරියස් කතාව මොකක්ද කියල මම දන්නව... මේ වෙන හැම දෙයක් ඔයාට කලින්ම කිව්වෙ නැත්තෙ ඇයි කියල ඔයා හිතනව ඇති... ඒ හැම දෙයක් ම, මං ඔයාට කියනවට වඩා නැන්දගෙන් හරි මාමගෙන් හරි ඔයා දැනගන්න එක හොඳයි කියල හිතුණ නිසයි ඒ විදියට කලින් ම මං ඔයාට මොකුත් නොකියා හිටියෙ... මං ඒ කළේ වැරැද්දක් කියල, ඔයා හිතනව නම්, මට සමාවෙන්න අයියේ...!”

“හරි, හරී..., නංගා... ඔයා මගෙන් සමාව ඉල්ලන්න ඕන නැහැ. ඒත් මට ඔයාට කියන්න දෙයක් තියෙනවා... ඔයා තලතා වික්‍රමසූරියගෙ කීකරු ලේලි කියල දැනගෙන හිටියට එයා කිව්වොත් කිසිම හෙවිල්ලක් බැලිල්ලක් නැතිව ඕනෑම මෝඩ වැඩක් කරාවි කියල නම් මං කීයකටවත් හිතුවේ නැහැ. මට දැනගන්න ඕනැ අර මැන්ව මැරි කරන්න ඔයා කැමති වුණේ ඇත්තට ම ඔයා ඒ මැන්ට කැමති නිසා ද එහෙම නැතිනම් අපේ අම්ම කියන නිසා ද කියල?”

“අයියා... මම තලතා වික්‍රමසූරියගෙත්, බුවනෙක විජේවික්‍රමගෙත් හදාගත්ත දුව. ඒ දෙන්නා, අම්ම තාත්ත නැතිව අනාථ වුණු එයාලගෙ ලේලි, තමන්ගෙ දුව විදියට හදාගත්තා... මගේ තාත්තගේ නෑදෑකම නිසා මං නැන්දයි, මාමයි කියල කිව්වත් එයාල තමයි මාව ආදරෙන් හදාගත්තු මගේ අම්මයි, තාත්තයි... මට ඒ දෙන්නගෙ හිතට කරදරයක්, දුකක් දෙන්න බැහැ. ඒ නිසා නැන්දයි, මාමයි කියන දේකට විරුද්ධ වෙන්න තරම් සිටුවේෂන් එකක නොවෙයි මම ඉන්නෙ අයියේ...”

“පණ්ඩිත ආච්චි... මං ඔය ඔක්කෝම දන්නව... මම ඇහුව ප්‍රශ්ණයට උත්තරේ ඒක නෙවෙයි... මම ආයෙත් අහනව... ඔයා ඒ මැන්ට කැමති ද? ඒ වගේම ඔයා ඒ මැන්ට ආදරය කරනව ද?”

“ඔයා අහපු පළමුවෙනි ප්‍රශ්ණෙට උත්තරේ මං කිව්ව නේ... ආයෙත් දෙන්න වෙන්නෙත් ඒ උත්තරේම තමයි. දෙවැනි ප්‍රශ්ණයට උත්තරේ තමයි... මගේ එහෙම ආදරයක් නැහැ.

එයා මට ආදරෙයි කියල කිව්වට එක ඇත්ත ද කියල මම දන්නෙත් නැහැ. ප්‍රොපෝසල්වලින් අඳුරගත්ත අය කසාද බඳින්න දෙන්නම ආදරේ කරන්න ඕනෙ කියල නියමයක් නැහැ."

"මං දැනගෙන හිටියෙ නැහැ ඔයා ඒ තරම්ම මෝඩයි කියල පරණ කාලේ ආච්චිලා වගේ. අහන ප්‍රශ්ණෙට නෙවෙයි උත්තර දෙන්නෙ. ඒ කොහොම වුණත් නංගා මං මේ සීරියස්ලි කියන්නෙ... එයාගෙ ආදරය ඔයාට දැනෙන්නෙත් නැත්නම් ඔයත් ඒ මැන්ට ආදරය කරන්නෙත් නැත්නම් ඒ වගේ කෙනෙක් අම්මගෙ, තාත්තගෙ කැමැත්තට නෙවෙයි, ඔයාගෙ කැමැත්තට වුණත් බැන්දට ඒකෙන් ඔයාගෙවත්, එයාගෙවත් ජීවිතය ලස්සන වෙන්නෙ නැහැ... ඒක තේරුම් ගන්න! ඔයත් එක්ක මෙහෙම ෆෝන් එකෙන් කතාකරල හරි යන්නෙ නැහැ. මට ඔයාව හමුවෙලා කතා කරන්න ඕනෙ... නංගා ප්ලීස් දැන් ඔය ෆෝන් එක තාරකීට දෙන්න. මට එයාටත් පොඩ්ඩක් කතාකරන්න ඕන... දැන් ඔයා හෙට සබ්මිට් කරන ටියුට් එකේ ඉතිරි වැඩ ටික ඉවර කරන්න."

"තාරා දේවක අයියට ඔයාට කතාකරන්න ඕනැ ලු. මේ මං ඔන්න දෙන්නටම කියන්නේ, කතාකරාට නම් කමක් නැහැ, ගහමරාගන්න නම් බැහැ. කෝකටත් පැත්තකට ගිහින් කරන කතාවක් කරන්න. මගේ මේ ටියුට් එක අද ඉවර කරන්න ඕන..." අංජලී දුරකතනය තාරකීට දුන්නා ය.

"බයේ බැහැ... මොන නඩුවක් ද දන්නෙ නැහැ" අංජලී අත තිබූ දුරකථනය ගත් තාරකී දේවකගේ ඇමතුමට පිළිතුරු දෙන අතරතුර ම, එම ස්ථානයෙන් ඉවතට ගියේ ඒ ඔවුන්ගේ සංවාදය අංජලීට කරදරයක් නොවන ලෙසට ය. එහි දී දේවකට අවැසිව තිබුණේ හරේන් පිළිබඳ වූ මංගල යෝජනාවට අංජලීගේ සැබෑ ප්‍රතිචාරය කුමක්ද යන්න පිළිබඳව තාරකීගෙන් අදහස් විමසීමට ය. ඇගෙන් නිසි පිළිතුරක් නොලැබුණු කල, අවසානයේ දී, ඔහු තාරකීගෙන් එක් ඉල්ලීමක් කළේය.

"තාරා ආදරයක් නැතිව දෙන්නෙක් මැරි කළාම..., ඒ මැරේජ් ලයිෆ් එකේ තේරුමක් නැහැ. ප්ලීස් තාරා මේක ඔයාගේ යාළුව අංජලීට වගේම ඔයාගෙ කසින් හරේන්ටත් තේරුම් කරල දෙන්න."

"දේවක අයිය... ඔයා දන්නව නේ... කොල්ජ් කාලේ විතරක් නෙවෙයි යුනිවර්සිටි එකෙත් අංජලීට ආදරය කරන්න ගොඩක් අය ට්‍රයි කළා. ඒත් සුනෙත් අයියයි, ඔයයි මාර ගාඩ් එකක් දාගෙන හිටිය නිසා ඒ කිසි කෙනෙකුට අංජලීට ආදරය කරන්න තියා ළංවෙන්නවත් බැරි වුණා. හරේන් අයියට විතරයි ඔය විදියට ප්‍රොපෝසල් එකක් හරි ගෙදරට යවා ගන්න පුළුවන් වුණේ... ඉතින් දැන් ඔයා කියනව අංජලී මැරි කරන්න ඕන ආදරය කරන කෙනෙකුට කියල... ඒක ටිකක් පරස්පරයි නේද දේවක අයියා?"

"මේ හලෝ ඔයාට ඒ පණ්ඩිත කමෙන් වැඩක් නැහැ. ඔයත් කතාවෙන් පිට යනව නේ. මං කිව්ව දේ කරන්න පුළුවන් ද, බැරි ද කියන්න ප්ලීස්..."

"අනේ දේවක අයියා... මට නම් ඔය වගේ දේකට මැදිහත් වෙන්න අමාරුයි. හරේන් මගේ කසින් උනාට මේ ප්‍රොපෝසල් එක ගැන මං දැනගත්තෙත් එයාල අංජලී බලන්න ඒ ගෙදර ගිය දවසෙයි. ඊට ඉස්සර වෙලා ඒ කිසි දෙයක් මං දැනගෙන හිටියෙ නැහැ. දැන් බැලුවහම දෙපැත්තෙ ම පේරන්ට්ස්ලත් ඉස්සර ඉඳල ම අඳුරනව ලු. ඒ වගේ ෆැමිලි දෙකක් මැදිහත් වෙලා කරන මේ වගේ ප්‍රොපෝසල් එකකට බලපෑමක් කරන්න මං වගේ පුංචි කෙල්ලෙකුට පුළුවන් ද? ඊට වඩා ඔයාට මොනව හරි කරන්න පුළුවන්... ටිකක් ට්‍රයි කරලා බලන්න."

"ඔව්, ඔව්, එහෙම මොනව හරි කරන්න හරි, කියන්න හරි ගිහිල්ල තමයි සුනෙත් තාමත් ගෙදර එන්න බැරිව ඉන්නෙ... කමෝන් තාරා... ඔයා මාවත් ඒ වගේ අමාරුවක දාන්නද යන්නෙ...?"

"සොරි දේවක අයිය... මං එහෙම හිතල කිව්වේ නැහැ."

"ඕ කේ තාරා... තැන්ක් යූ ෆෝ නයිස් චැට්. ගුඩ් නයිට්."

තාරකී ද ඔහුට සුභ රාත්‍රියක් පතමින් දුරකථන සංවාදය අවසන් කළා ය. ඇය සමග තවදුරටත් ඒ පිළිබඳව කතාකිරීමෙන් පලක් නොවන බව දේවක තේරුම් ගත්තේ ය. කෙසේ වෙතත් අංජලී සමග මෙන්ම තාරකී සමග ද කරන ලද කතා බහෙන් පසුව වුව දේවකට දැනුණේ ඔහුගේ හිත තව තවත් චංචල බවට පත්වූ බව පමණි. ඕනෑම සංවේදී ප්‍රශ්නයක දී, ඔහු සමග එකට දුක සැප බෙදාගෙන, ඔහුගේ සිත සැකසිය හැකි ලබැඳි මිතුරා වූ සහන් එවේලෙහි ඔහුට නැවත සිහිපත් විය. එහෙත් පසුදින උදෙන් ම රාජකාරි සඳහා යා යුතුව තිබූ හෙයින් හැකි ඉක්මනින් නින්දට යාමට ඔහුට අවශ්‍යව තිබිණි. හමුවීමට අවැසි බව කියමින් කෙටි දුරකතන පණිවිඩයක් සහන් වෙත යැවූ දේවක, බැල්කනියේ දොර වසාගෙන නිදන කාමරය තුළට පිවිසියේ ය.

දේවක සමග දුරකතන සංවාදය අවසන් කළ පසු තාරකී නැවත අංජලී සිටින ස්ථානයට පැමිණියා ය. ඇය නිහඬව ම ටික වේලාවක් කල්පනා කරමින් සිටියේ දේවක පැවසූ දේ ගැන ය. තමා මුළ දී සැක කළ පරිද්දෙන්ම අංජලී ගේ සහ හරේන් ගේ විවාහය සිදුවෙනවාට සුනෙත් පමණක් නොව දේවක ද කැමති නැත. වෙනසකට ඇත්තේ, එය වැලැක්වීමට සුනෙත් ආවේගශීලී වෙද්දී දේවක බොහොම සාමකාමී ලෙසින් ඒ දෙයම කරන්නට වෙහෙසීම පමණකි. කෙසේ වෙතත් තමාට දැනෙන දෙය අංජලීට පැවසුවහොත් ඇය තව තවත් මානසිකව පීඩාවට පත්වන හෙයින් ඒ කිසිවක් ඇයට නොපැවසීමට තාරකී තීරණය කළා ය. සුනෙත් අංජලීට ප්‍රේම කරන බව තාරකී දනිතත්, අංජලී ගැන දේවක සිතන්නේ කෙලෙසද යන්න ගැන

ඇයට සිතා ගත නොහැකි විය. එමෙන් ම, ඒ පිළිබඳව නිගමනයකට එළඹීමට ද කල් වැඩි බව ද තාරකීට සිතිණ.

මෙතෙක් කලක් තාරකී කටයුතු කලේ, සුනෙත් ගේ හෝ හරේන් ගේ හෝ පාර්ශ්වය නොගෙන හුදෙක්ම තම මිතුරියගේ කැමැත්ත ගැන පමණක් සිතමින්ය. එහෙත් එළැඹ ඇති තත්වය අනුව හරේන් සමග විවාහ වීමට තම මිතුරිය දිරිමත් කිරීමේ වරදක් නැතැයි අවසන ඇය තීරණය කළා ය.

*එතැන් සිට ලබන කලාපයේ -*

- දීපිකා ශ්‍රියානි සුනන්ද්‍රා වඩුගේ
[deepikascf@gmail.com]

# පා ගමනින් ආවා



දඹදිව දකුණින් නැව් නැග ආවා
මන්නාරම් වෙරළින් බැස ආවා
ජීවන ගමනේ පණනල රැකුමට
සරණ සොයා ආවා
පා ගමනින් ආවා

මහ වන ගිරි හෙල් පසුකර ආවා
රෝ බිය මරු බිය නොතකා ආවා
ජීවන ගමනේ පණනල රැකුමට
සරණ සොයා ආවා
පා ගමනින් ආවා

අනන්ත බාධක දුක් පීඩා මැද
කඳුකරයේ රිය මං නිම කළ
බෑවුම් වල තේ වතු බිහි කල
රට නැගුමට ලේ දහදිය හල

දෙසිය වසක් කල් පරම්පරා ගත
මලය දමිල සොහොයුරු ජන වෙත
සැම උපහාරය වේවා!
ඔබ කළ කම් ඇගයේවා!

**- නිරන්ජන් සෙල්වදුරේ**
[jn.selvadurai@gmail.com]
(image: https://www.historyofceylontea.com/)

# චිත්‍ර නම් විශ්ව බස



කළලයක් දරුවෙකුව
මව් කුසින් පිවිස ලොව වෙත
හඬා කිරි ඉල්ලන දරුවෙකුව සිට බඩගා
දණ ගා ඇවිද අල්ලා කෙමෙන් ළමයෙකු වූ සේ

සන්නිවේදනය ද
මිනිසා සමග ඉපදී
කෙමෙන් අද ඇති තැනට
පිවිසි මග සොයාගෙන ඇත
ගවේෂණ කරන නූතන
විද්වතුන් සන්නිවේදන

වසර තිහකට පෙර ප්‍රංශ Chauvet ගුහාවේ
සොයාගත් කදිම සිත්තම්
වසර තිස් දහක් පැරණිය
පාෂාණ යුගයේ වතගොත
අපට සිහිකර කීමට

සීගිරි ගලේ සිතුවම්
අපිට කියනා ලෙසින් තොරතුරු
චිත්‍ර නම් විශ්ව බස තුළ
ලොව පුරා ඉතිහාස සටහන්
සජීවී සන්නිවේදනයක නිරතව සිටී අදටත්
සටහන් තුළින් සිතුවම්

- **නිමල් සේදර** [nimalsedera@yahoo.com]
(image: Wikipedia)




# “බර්මියුඩා” ත්‍රිකෝණයේ අභිරහස

ඇමෙරිකා එක්සත් ජනපදයේ නාවික හමුදාවට අයිති, යුද කටයුතුවල දී බෝම්බ හෙලීම සඳහා භාවිත කෙරෙන, කුඩා සුවිශේෂී අහස් යානා පහක් පුහුණුවීමේ අභ්‍යාසයක් සඳහා, 1945 දෙසැම්බර් මස පස්වෙනිදින ෆ්ලොරිඩාවේ හමුදා කඳවුරකින් ගුවන්ගත විය. මෙය “දහනමවන පියාසැරිය” (Flight 19) ලෙස නම්කර තිබේ. ෆ්ලොරිඩාවේ ගුවන් පථයකින් පිටත් වී බර්මියුඩා දූපත් දෙසට පියාසර කළ “දහනමවන පියාසැරිය” මගින් නිකුත් කළ සංඥා, ටික වේලාවකට පසු සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය විය. මෙම ගුවන් අභ්‍යාසයට අයත් ගුවන් යානා පහ සහ ඒවායේ සිටි නියමුවන් සහ අනිකුත් කාර්ය මණ්ඩලයට අයත් දාහතරදෙනා ම, අද්භූත ආකාරයකට අතුරුදහන් වී ඇති බව කඩිනමින්ම ප්‍රකාශයට පත්විය. අතුරුදහන් වූ යානා සහ කාර්ය මණ්ඩලය සෙවීමේ කිසිම මෙහෙයුම් ක්‍රියාවලියකට යානාවල සුන්බුන් හෝ වෙනත් කිසිම හෝඩුවාවක් හෝ සොයාගැනීමට නොහැකි විය.



(අතුරුදහන් වූයේ මේ ආකාරයේ ගුවන්යානා පහකි)

“දහනමවන පියාසැරිය” අහස් යානා අතුරුදන්වීම සම්බන්ධව සඟරාවකට ලිපියක් සැපයූ අයෙකු මෙම සිදුවීමට අදාළ මුහුදු සීමාව “බර්මියුඩා ත්‍රිකෝණය” (Bermuda Triangle) ලෙස නම් කරන ලදී. මීට පෙර ද, මෙම ප්‍රදේශයේ මුහුදු යාත්‍රා සහ අහස් යානා මේ ආකාරයට ම අද්භූත ලෙස අතුරුදන් වී ඇති බවට ද තොරතුරු වාර්තාවන්නට වූ අතර එතැන් පටන් මෙම මුහුදු සීමාව හා සම්බන්ධ බොහෝ මිත්‍යා මත: පිටසක්වල ජීවී ආක්‍රමණ; පියවි ඇසට නොපෙනෙන සාගර රකුසන්ගේ බිලිගැනීම්; ගැඹුරු මුහුදු පතුලේ සිටී යයි සැකකරන විශාල බූවල්ලන් හෝ ගිනි පිඹින මකරුන්ගේ පහරදීම්; වැනි කටකතා ද බොහෝ පැතිරෙන්නට විය. “දහනමවන පියාසැරියේ” අතුදහන්වීම ද “බර්මියුඩා ත්‍රිකෝණය” තුළ සිදු වූ තවත් “බිලිගැනීමක්” බව ප්‍රචාරය විය.

පහත සිතියමේ දැක්වෙන ආකාරයට මේ “බර්මියුඩා ත්‍රිකෝණය” පිහිටා තිබෙන්නේ උතුරු ඇමෙරිකාවේ අග්නිදිග සීමාවේ පිහිටි ෆ්ලොරිඩා ප්‍රාන්තයට ආසන්නව ය. ත්‍රිකෝණයට සීමාවන ප්‍රදේශය ෆ්ලොරිඩාව, උතුරෙන් බර්මියුඩා දූපත සහ දකුණෙන් කැරිබියන් මුහුදේ පිහිටි පූර්ටෝ රිකෝ (Puerto Rico) ප්‍රධාන දූපත සහිත දූපත් සමූහය ද වේ.




උතුරු ඇමෙරිකාවට අග්නිදිග දිශාවේ පිහිටි, කැරිබියන් මුහුද ද ඇතුළත් මෙම ප්‍රදේශය කුඩා දූපත් දහස් ගණනකින් සමන්විත ය. මෙයින් දූපත් සියයක පමණ මිනිස් වාසස්ථාන ඇත. බර්මියුඩා ත්‍රිකෝණය නම් වර්ග කිලෝමීටර මිලියන හතරක් හෝ ඊට වඩා තරමක් විශාල වපසරියකින් යුක්ත මුහුදු ප්‍රදේශය උතුරු ඇමෙරිකාව, දකුණු ඇමෙරිකාව, යුරෝපය සහ මැද පෙරදිග යා කෙරෙන සන්ධිස්ථානයක් නිසා එම කලාපයේ ඇති සාගර සම්පත් හා භූ සම්පත් සම්බන්ධ වෙළඳ කටයුතු සඳහා වැදගත් මධ්‍යස්ථානයකි. එමෙන් ම, මෙහි ඇති සූර්යාලෝකය බහුලව ලැබෙන මනස්කාන්ත මුහුදු වෙරළ පද්ධතිය නිසා සංචාරක කටයුතු සඳහා ද ප්‍රදේශය නම් දරා තිබේ.

අත්ලාන්තික් සාගරය ඔස්සේ දේශාටනයේ යෙදුනු ක්‍රිස්ටෝෆර් කොලොම්බස් 1493 වර්ෂයේ දී පමණ, මෙම මුහුදු සීමාව තුළ පවතින අස්වාභාවික සංසිද්ධි ගැන සඳහන් කර ඇත. මෙයින් ඉතා වැදගත් නිරීක්ෂණයක් වනුයේ, මෙම

සීමාව තුළ දී, ඔහු භාවිත කළ මාලිමා යන්ත්‍රවල එකිනෙකට නොගැලපෙන විකාරරූපී දත්ත සටහන් වීමයි. මෙසේ වනුයේ මෙම මුහුදු සීමාවේ දී පෘථිවියේ සත්‍ය උතුර සහ චුම්බක උතුර යන දිශා දෙකෙහි යම්කිසි ව්‍යාකූලභාවයක් නිසා බව පසුව සොයාගෙන තිබේ.

කෙසේ වෙතත් මෙම මුහුදු කලාපය පිළිගත් ප්‍රමිතියකින් යුක්ත කිසිම ලෝක සිතියමක "බර්මියුඩා ත්‍රිකෝණය" "Bermuda Triangle" ලෙස, සලකුණු කර නොමැත.

**"දහනමවන පියාසැරිය" මුහුණ පෑ අනතුරට අදාළ පසු විපරම්**

අහස් යානා පහකින් සහ නියමුවන් ඇතුළු දාහතරදෙනෙකුගෙන් යුක්ත කාර්ය මණ්ඩලය අයත් "දහනමවන පියාසැරියට" සිදු වූ අනතුර පිළිබඳව ඇමෙරිකා එක්සත් ජනපදයේ නාවික ඓතිහාසික පදනම (U.S. Naval Historical Foundation) විසින් කර ඇති විද්‍යාත්මක පර්යේෂණ මගින් තොරතුරු රාශියක් අනාවරණය වී ඇත. ඒ අනුව කලින් සඳහන් කළ කටකතා කිසිදු පදනමක් නොමැතිව පැතිර ගිය "ඕපාදූප" වැනි මිත්‍යා අදහස් බව හෙළිවේ. මෙම නිරීක්ෂණවලට අනුව මෙම මුහුදු ප්‍රදේශයේ ක්ෂණිකව හටගන්නා අසාමාන්‍ය රළු ස්වභාවය සහ ඒ සමගම මාලිමා යන්ත්‍රවල සත්‍ය උතුර සහ චුම්බක උතුර විකෘති වීම නිසා නාවිකයින්ට සිදුවන්නට ඇති මුහුදේ මංමුලාවීම් ද සමහර ආපදාවලට හේතු වන්නට ඇති බව විශ්වාස කෙරේ. (ඒ වකවානුවේ GPS ක්‍රමවේදය මගින් ගමන් මග තීරණය කිරීමේ තාක්ෂණය නොතිබුණි.) එසේම අනතුරු ඇඟවීමක් නොමැතිවම ස්වභාවධර්මය අත්තනෝමතික ලෙස මිනිසාට ද්‍රෝහී වීම, එවැනි අතිශයින් කලබල අවස්ථාවල දී මිනිසා විසින් සාවද්‍ය තීරණ ගැනීම, මුහුදු යාත්‍රාවල ශිල්පීය සහ නිර්මාණ දුර්වලතා ආදී කරුණු රාශියක් නිසා ද, බොහෝ විට, අවාසනාවේ අනිටු බලපෑම් නිසා ද මෙවැනි අභාග්‍ය සම්පන්න දේ සිදුවිය හැකි බව ඔවුන්ගේ මතයයි.

බර්මියුඩා ත්‍රිකෝණයට අයත් මුහුදු ප්‍රදේශය, භූගෝලීය වශයෙන්, ලෝකයේ මහාද්වීප කිහිපයක සහ වෙනත් රටවල් රාශියක වාණිජ, ආර්ථික, දේශපාලන සහ ආරක්ෂක කටයුතු සඳහා මර්මස්ථානයකි. මේ නිසා මෙම ප්‍රදේශය නාවික ගමන් බිමන් සහ ගුවන් ගමන් අධික ප්‍රදේශයක් ලෙස හැඳින්වේ. කලින් ද සඳහන් කළ පරිදි නිරතුරුවම සිදුවන ස්වාභාවික සංසිද්ධිවල කැළඹීම් ද අධික මෙම ප්‍රදේශයේ, වෙනත් ස්ථානවලට සාපේක්ෂව වැඩියෙන් අනතුරු සිදුවීම අභූ‍ත සිද්ධියක් නොවන බව ද එම පර්යේෂකයින්ගේ සැලකිල්ලට භාජන වී තිබේ.

දැනට ද බර්මියුඩා ත්‍රිකෝණය ආශ්‍රිත මෙම මුහුදු ප්‍රදේශයේ සිදුවන සමහර අනතුරුවලට හේතු සාධක වශයෙන් දැක්විය හැක්කේ, චණ්ඩ මාරුත සහ දරුණු අකුණු ගැසීම්, තද කළු වලාකුළුවලින් මුළු අහස් තලයම අඳුරුවීම් වැනි ස්වාභාවික සංසිද්ධිවලට සමගාමීව මිනිසාගේ අපරීක්ෂාකාරීකම ද සම්බන්ධ වී කෙරෙන වැරදි තීරණ ගැනීමේ ප්‍රතිඵල බව පර්යේෂකයින් විසින් පෙන්වා දී ඇත. මේ නිසා අනාගතයේ දී බර්මියුඩා ත්‍රිකෝණය ආශ්‍රිතව සිදුවන ආපදා "විද්‍යා ප්‍රබන්ධ" ගණයට නොගැනෙන ස්වාභාවික සිදුවීම් විය යුතු බව ඔව්හු තවුරටත් තහවුරු කර තිබේ.

**"දහනමවන පියාසැරිය" අනතුරට ලක්වූයේ කෙසේද?**

බර්මියුඩා ත්‍රිකෝණය පිළිබඳ පුරාවෘත්තයේ වැඩිමනත් අවධානය යොමු වූ ආපදාව වශයෙන් ඉතිහාසගත වී තිබෙන්නේ "දහනමවන පියාසැරිය" අතුරුදහන්වීම ආශ්‍රිත සත්‍ය තොරතුරු සහ ඒ හා බැඳුනු මනඃකල්පිත විස්තර ලෙස සැලකිය හැකිය. ගුවන් උපදේශක, ලුතිනන් චාල්ස් ටේලර් නම් නියමුවාගේ ප්‍රධානත්වයෙන් ගුවන් ගත වූ යානා, යුධ අභ්‍යාස සඳහා සුදුසු තත්ත්වයක තිබුණු අතර ඒවායේ සිටි කාර්ය මණ්ඩලයද මනා පුහුණුවක් ලැබූ අය වූහ. ගුවන් ගත වූ යානා තම මෙහෙයුම් ඉතාමත් නිරවද්‍යව කරන බවට ද ආරම්භයේ දී තොරතුරු සහ සංඥා ලැබී ඇත. අවසාන වරට ලැබී ඇති පණිවුඩයෙන් ගුවන් නියමුවන් දන්වා ඇත්තේ හදිසියේ ම කාලගුණ තත්ත්වය අති ප්‍රචණ්ඩ වූ බව සහ ගමන් මග සොයාගැනීමේ උපකරණ මහත් ව්‍යාකූලබවක් පෙන්නුම් කරන බවයි.

මෙම තත්ත්ව යටතේ යානාවලට ආපසු ඒම ඉතාමත් අසීරු බව කඳවුරේ මෙහෙයුම් මැදිරියේ සිටි නිලධාරීන්ට අවබෝධ වී තිබේ. එක් එක් යානයක ඇති ඉන්ධන ප්‍රමාණය ගැලොම් දහයක සීමාවට පැමිණියහොත් ආපසු ඒම වෙනුවට කළ හැකි එක ම දෙය නම් ගුවන් යානා සියල්ලම සාගරයට බැස්සවීම පමණි. ලුතිනන් චාල්ස් ටේලර් නියමුවා විසින් එම විධානය කරන්නට ඇති බව මෙහෙයුම් මැදිරියේ සිටි නිලධාරීන්ගේ විශ්වාසයයි.

නාවික ඓතිහාසික පදනම් මධ්‍යස්ථානයේ ඉතිහාසඥයෙකු පවසන ආකාරයට, යුද කටයුතු සඳහා ම විශේෂයෙන් නිෂ්පාදනය කර තිබුණු මෙම අහස් යානාවල ශක්තිමත් භාවය නිසාම ඒවාට "යකඩ කුරුල්ලන්" (Iron birds) යන අන්වර්ථ නාමයක් ද පටබැඳී තිබිණ. යානයක ශුද්ධ බර කිලෝග්‍රෑම් 4,535 පමණ වේ. සාගර ජලය මත බැස්ස වූ විට මේ යානා ඉතා වේගයෙන් සාගර පතුළ දක්වා ම කිඳා බසී. ලෝකයේ තිබෙන ඉතාමත් ගැඹුරු සාගර ආගාධ පිහිටා ඇත්තේ ද බර්මියුඩා ත්‍රිකෝණය ආශ්‍රිත ප්‍රදේශයේ ය. මෙහි සාගර පතුළ මීටර් 5,790 පමණ ගැඹුරු වන අතර, පුවර්ටෝ රිකෝ (Puerto Rico) අසල පිහිටි අගාධය මීටර් 8,230 පමණ ගැඹුරින් යුක්ත ය. මෙවැනි ගැඹුරකට සේන්දුවන ගුවන් යානයක් ජලකඳේ අති විශාල පීඩනයට කිසිසේත් ඔරොත්තු නොදී පොඩිපට්ටම් වී යාමට ඉඩකඩ තිබේ.

"දහනමවන පියාසැරිය" අතුරුදහන් වූ සැනින්ම, එය නිරුපද්‍රිතව බේරා ගැනීම සඳහා, ගලවා ගැනීමේ

මෙහෙයුමක් මුදා හැරීමට ෆ්ලොරිඩාවේ ගුවන් කඳවුරේ නිලධාරීන් විසින් තීරණය කරන ලදී. මේ සඳහා, දක්ෂ ගුවන් නියමුවෙකු ඇතුළු කාර්ය මණ්ඩලය දහතුන්දෙනෙකුගෙන් යුක්ත තරමක් විශාල ගුවන් යානයක් පිටත් කර යැවීමට මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් පියවර ගන්නා ලදී. ගුවන් ගත වූ "ගලවා ගැනීමේ මෙහෙයුම්" යානය පිටත් වී ටික වෙලාවක් යනතුරු එය මෙහෙයුම් මැදිරිය සමග සම්බන්ධය පවත්වා ගෙන ගොස් හිටි හැටියේම සංඥා සියල්ල අකර්මණ්‍ය වී තිබේ. ගුවන් යානය සමග සම්බන්ධ වීමට මෙහෙයුම් මැදිරිය ගත් සියලුම උත්සාහ ද ව්‍යවර්ථ වී තිබේ.

මේ නිසා මහත් කම්පාවට පත් වූ ගුවන් හමුදා කඳවුරේ නිලධාරීන්ට මඳ වේලාවකට පසු අත්ලාන්තික් සාගරයේ යාත්‍රා කරමින් තිබුණු වෙනත් නෞකාවකින් පණිවුඩයක් ලැබිණ. එම පණිවුඩයේ සඳහන් වූයේ ටික වේලාවකට කලින් ඔවුන්ගේ රේඩාර් පද්ධතියේ පැහැදිලිව සටහන් වී තිබුණු ගුවන් යානයක් ක්ෂණයකින් රේඩාර් පථයෙන් මැකී ගිය බවත් ඒ සමගම මහා ගිනි ගුලියක් සාගරයට කඩා වැටෙනු ඔවුන්ට දකින්නට ලැබුණු බවත් ය.

එලෙස ගිනි ගුලියක් ලෙස සාගරයට පතිත වී ඇත්තේ ගලවාගැනීමේ මෙහෙයුම සඳහා පිටත් කළ ගුවන් යානය බව ගුවන් කඳවුරේ සිටි නිලධාරීන්ට ප්‍රත්‍යක්ෂ විය.

හේතුව කුමක් වුවත්, බර්මියුඩා ත්‍රිකෝණය මුහුදු ප්‍රදේශයේ දී මේ ආකාරයට එක් දිනක දී පමණක් ගුවන් යානා හයක් සහ නියමුවන් ඇතුළු ගුවන් යානා කාර්ය මණ්ඩලය විසිහත්දෙනෙකු මහා සාගරයේ අතුරුදහන් වීමත් මේ වනතුරුද නොවිසඳුණු මහා ගැටලුවකි.


"බර්මියුඩා ත්‍රිකෝණය" ප්‍රදේශය පිළිබඳව තවත් කරුණු කිහිපයක් මෙසේ ය.

- බර්මියුඩා ත්‍රිකෝණය ලෙස හැඳින්වෙන ප්‍රදේශයේ, ඉතාමත් චණ්ඩ මාරුත සහ අධි බලැති සුළිසුළං නිරතුරුවම තිබීම සත්‍යයකි.
- ලෝකයේ වැඩි වශයෙන්ම නැව් ගමනාගමනය කරන මුහුදු මාර්ග කිහිපයක් බර්මියුඩා ත්‍රිකෝණය ඔස්සේ වැටී ඇත. නමුත් මෙම මුහුදු ප්‍රදේශය ලෝකයේ නාවුක ගමනාගමනයට අහිතකර ලෙස සැලකෙන පළමු මාර්ග දහයට හෝ නොවැටේ.
- කොම්පාසුවක් මගින් දිශාව නිර්ණය කර ගැනීමේ දී සත්‍ය උතුර සහ චුම්බක උතුර දෙකෙහි ගැටීම නව තාක්ෂණ උපකරණ මගින් මගහැරී ගොස් තිබේ.
- මෙම මුහුදු ප්‍රදේශයේ මුහුදුබත් වූ නැව් සංඛ්‍යාව හෝ කඩා වැටුණු අහස් යානා සංඛ්‍යාව පිළිබඳ සම්පූර්ණ දත්ත නොවුවත් තිබෙන සංඛ්‍යා ලේඛන අනුව නැව් පනහක් පමණ සහ අහස් යානා විස්සක් පමණ මෙම මුහුදු ප්‍රදේශයේ දී අනතුරට ලක් වී ඇත.
- මෙසේ අනතුරට පත්වූ බොහෝ නැව් සහ අහස් යානාවල සුන්බුන් කිසිවක්වත් සොයා ගෙන නොතිබීම පුදුම සහගත ය.
- බර්මියුඩා ත්‍රිකෝණය තුළ සිදුවන අතුරුදහන්වීම් මිනිසා අතින් සිදුවිය හැකි වැරදි නිසා හෝ කාලගුණ සංසිද්ධිවල විෂමතා නිසා සිදුවන්නේ ද යන්න ස්ථිරවම තීරණය කර නොමැත.


**- දයාරත්න වීරසේකර** dayawee2@yaho.com

(Photo: Horace Bristol via Wikipedia)
(Map: Alphaiosderivative via Wikipedia)

## ප්‍රහේලිකා විසඳුම - ජූලි 2023



## ප්‍රහේලිකා විසඳුම - අගෝස්තු 2023



# සිසිල කෙටිකතාව

# සීමා

**ඉන්දිකා තිලකුමාර**



ඇඳෙන් බැහැ ගන්න ඕනෑ කියල හිතුණට නෙතුලිට ඒකට ශක්තියක් තිබුණෙ නැහැ. හිසරදයයි, බඩ පෙරලවා ගෙන නැගුණු ඔක්කාර ගතියයි නෙතුලිට සිහිපත් කළේ පුතා ලැබෙන්න හිටිය දවස්වල ඇඟට තිබුණු අපහසුව. පවුල් දෙකේ ම පළමුවෙනි මුණුබුරා පිළිගන්න පේ වෙලා හිටිය දෙපැත්තෙම මැණිවරු දෙපළත් එක්ක ඒ දවස් වල අමාරුකම් දැනුණේ ම නැති ගානයි.

අම්මගෙයි, නැන්දම්මගෙයි සාත්තුව මතක් වෙලා ඇහැට ඉනුව කඳුළ නෙතුලි පිටි අල්ලෙන් හිමිහිට පිහි දැම්මා. ඊලඟ මොහොතේ දී ඇයට නාන කාමරයට දුවන්නට සිදු වුණේ ඔක්කාරයත් සමගයි. මුහුණ සෝදන බේසම ළඟ පහත් වී නෙතුලි බඩ හිස් කරද්දී විමලා සෙමෙන් පිට අත ගානවා ඇයට දැනුණා. විමලා දුන්න වතුර වීදුරුවෙන් කට සෝදා ගත් නෙතුලි විමලා ගේ ඇඟේ එල්ලී හති හලමින් නැවතත් සයනය වෙත සේන්දු වුණා. කොට්ටය ගසමින් ඇඳ සකස් කරන විමලා ලොකු කෙස් ගුලියක් කසල බඳුනට දමනවා නෙතුලිට ඇස් අගින් පෙනුණා.

"කෝ විමලා මහත්තයා?" නෙතුලි ඇහුවේ වරුණ ගේ සද්දයක් නොඇසුණු නිසයි.

"මහත්තයා කොහේ හරි යන්න වගේ නෝනා. ඕන් දැන් කෑම කනවා. අපේ නෝනාත් මොනවා හරි කමු. මම කැඳත් හැදුවා. ඇඟේ විෂ මැරෙන්න කොළ කැඳ ගුණයි කියනවනේ නෝනේ," විමලා කිව්වෙ නෙතුලිට ඇඳෙන් බහින්න උදව් කරමින්.

පියයුරු පිළිකාවක් කියලා රෝගී වාර්තාව ආවට පස්සෙ කල් නොයවා පුද්ගලික රෝහලක දී කරගත්ත සැත්කමෙන් පස්සෙ ගෙදර ආ දවසේ වරුණ තමන්ගේ බඩු මුට්ටු ටිකත් අරගෙන ඉහළ මාලයේ කාමරයකට ගිය හැටි නෙතුලිට මතක් වුණා. වරුණ කිව්වේ නෙතුලිට පහසුවෙන් ඉන්න ඉඩ සලසලා එයා වෙනම කාමරයකට යන බවයි.

නෙතුලියි වරුණයි පාවිච්චි කළ ගෙදර ප්‍රධාන නිදන කාමරයේ අවශ්‍ය හැම සැප පහසුකමක් ම ඕනෑවටත් වඩා තිබුණා. දෙපාරක් තුන් පාරක් පෙරළුනත් බිමට නොවැටෙන තරමේ විශාල යුගල ඇඳ, අඟල් දහයක විතර ඝනකම මෙට්ටයකින් තව සැප පහසු වෙලා තිබුණා. නිදන කාමරය විවෘත වුණේ විශාල නාන කාමරයකට. ඒක ඇත්තටම කොටස් දෙකක්. නාන කාමරයේ ඈත කෙළවර නිමාවෙලා තිබුණේ උඩින් එළිමහනට විවෘත වෙලා. වටේට ම ගල් අල්ලපු බිත්තියි කෙළවරකට වෙන්න තිබුණු අරලිය ගහයි නාන කාමරයට ස්වාභාවික පෙනුමක් එක් කළා. නාන බේසම දෙන්නට ම එකට නාන්න වැඩිත් එක්ක. නෙතුලිට තිබ්බෙ දිග කොණ්ඩයක්. දෙන්නා එකට නාන සමහර දාට වරුණ බිම වැටුන අරලිය මලක් අහුලගෙන ඇගේ කණට උඩින් වරලසේ ගහනවා. නිදන කාමරයට කිට්ටු කොටසේ බිත්තිවලට අල්ලලා නිමා කරලා තිබුණ තේක්ක අල්මාරිවල දෙන්නගේ ඇඳුම් වෙන වෙන ම ලස්සනට අහුරලා තිබුණා. මුහුණ සෝදන බේසම එක්කම ඉදිරියෙන් තිබුණ ලොකු කණ්ණාඩිය දෙපැත්තෙන් බිත්තියට අල්ලලා තිබුණු රාක්ක දෙකේ දෙන්නගේ ආලේප, සුවඳ විලවුන් වෙන වෙන ම අහුරලා තිබ්බෙ ප්‍රධාන නිදන කාමරය පොඩ්ඩක්වත් හැඩි නොවන විදිහට. යුගල ඇඳට අමතරව නිදන කාමරයේ තිබුණේ රූපවාහිනියයි , ඩිවාන් එකකුයි විතරයි. කැමති නම් ඇඳේ ඉඳගෙන, කැමති නම් ඩිවාන් එකේ ඉඳගෙන එහෙම නැතිනම් රූපවාහිනිය ඉදිරියේ එළා තිබුණ විශාල කලාලයේ වැතිරිලා රූපවාහිනිය බලන්න හරි, වෙන ඕන දෙයක් කරන්න හරි පහසුකම තිබ්බා.

වරුණ වෘත්තියෙන් වෛද්‍යවරයෙක්. නෙතුලි ජාත්‍යන්තර පාසැලක ඉංග්‍රීසි ගුරුවරියක්. ඔවුන්ට අවුරුදු දාසයක පුතෙකු හිටියා. ප්‍රේම සම්බන්ධයකින් විවාහවුණු ඔවුන් දෙදෙනාගේ අවුරුදු දහඅටක විවාහ ජීවිතයේ එහෙමකට කියන්න තරම් හැලහැප්පීම් තිබුණෙ නැහැ. දෙන්නට ම සාර්ථක වෘත්තිය ජීවිතයක් තිබුණා. ඉන්න ලස්සන ගෙදරක්

තිබුණා. අතට, පයට දැසි දස්සන් හිටියා. එකා යකා වගේ නොහැඳුණු හොඳ කීකරු දරුවෙක් හිටියා.

පැණි වරකා ගහට හෙණ ගැහුවා වගේ හැමදේම වෙනස් වුනේ මැමෝග්‍රාම් එකෙන් පස්සේ. වෛද්‍ය වාර්තා දැක්කාට පස්සෙ නෙතුලි බාගෙට පිස්සියක් වුණා. වරුණ නම් ඒක එච්චර ගණන් ගත්ත බවක් පෙනුනේ නැහැ. සමහර විට වෘත්තීය අත්දැකීම් එක්ක ඒක බොහොම සාමාන්‍ය දෙයක් වෙන්න ඇති.

අම්මලා දෙන්නා ම මිය පරලොව ගිහින් හිටි නිසා දුක කියන්න කවුරුවත් හිටියෙ නැහැ. නෙතුලිගේ එක ම සහෝදරී විවාහ වී පදිංචිවෙලා හිටියේ නවසීලන්තයේ. වට්ස්-ඇප් හරහා සම්බන්ධවෙලා කථා කළාට වැළඳ ගැනීමක ස්පර්ශය, උණුසුම, ළෙංගතුකම දෙන්න ඒ ඇමතුම්වලට බැරිවුණා. වරුණ හිටියේ නෙතුලි ඇල්ලුවොත් පොඩි වෙන වීදුරු බඩුවක් ගානට. කන බොන වෙලාවට කෑම කාමරයෙ දී හැරුනා ම ඇය වරුණ දුටුවෙත් නැති ගානයි. ඇගේ නොවැදී ඒ යහනේ සැතපෙන්න ඕනෑ තරම් ඉඩ පහසුව තිබිය දී ඔහු උඩු මහලේ කාමරයක් තෝරා ගත්තා. සැත්කම කළේ පියයුරට වුණාට වැරදිලාවත් නෙතුලිගේ මුහුණවත් අතවත් නොඅල්ලන්න වරුණ පරිස්සම් වුණා. කීමෝ ප්‍රතිකාර පටන් ගත්තට පස්සේ කන්නට කිසිම පිරියක් නොතිබුණාට නෙතුලි කෑම මේසයට යන්නේ ඔහු සමග පුංචි වෙලාවක් හරි ගත කරන්න.

වරුණගේ මුහුණ තවමත් හරිම කඩවසම්. පැත්තට පීරුව ඉත්තෑ කුරු කොණ්ඩය නර කෙස් සැඟවෙන විදිහට වර්ණ ගන්වලා තිබුණා. ඉස්සර ඉඳලම පාලනයකින් කෑම බීම ගත්ත නිසාදෝ උසට ගැලපෙන පිරිපුන් සිරුරක් තිබුණා. නෙතුලි ඒ මුහුණ දිහා ඇහිපිය නොහෙලා බලා හිටියට වරුණ හිස එස වූයේ ම නැති තරම්. ඇත්තට ම ඔහු තමන්ගේ මුහුණ දිහා බලන්නෙ නෑ නේද කියලා නෙතුලිට හිතුණා. ඇගේ සුරත ඇයට නොදැනීම ඇගේ හිසෙහි බැඳ තිබූ වර්ණවත් රෙදි කඩට ගොස් සෙමින් එය සකස් කරන්නට පටන් ගත්තා.

“අද ඔයා පුතාව අර ගෙනද එන්නේ?” බැරිම තැන ඇය ඇහුවෙ ඒ නිහඬතාවය මහා බරට ඇයට දැනුන නිසයි.

“පුතාව බණ්ඩාරේ ගනියි. අද අපේ කට්ටිය එකතු වෙනවා. මං එනකොට රෑ වෙයි,” වරුණ අහක බලා ගෙන කිව්වා.

“කොහෙද කට්ටිය එකතු වෙන්නේ?” නෙතුලි විමසුවේ සුහද හමුව පැවත්වෙන තැන දැන ගන්නටත් වඩා තව ටිකක් කථාව දිග් ගස්සන්න ඕනෑ නිසා.

“අවිස්සාවෙල්ලේ පොඩි තැනක,” ඔහුගේ ඇඳුම් මල්ලත් අනෙකුත් මෙවලමුත් අතට ගන්නා ගමන් වරුණ පැවසුවා.

“ඔබ යනවා නම් මට ඉතින් නවත්තන්න බෑ නේ!” නෙතුලිට හිතුණා.

නෙතුලිට කන්න කිසිම පිරියක් තිබුණෙ නැහැ. ඔක්කාරයයි, වමනයයි එන්න එන්නම වැඩි වුණා. අන්තිමට, අන්තිමට නාන කාමරයට දුවන්න වත් ඇඟට පණක් තිබ්බෙ නැති නිසා විමලා ගෙනාපු ලොකු බේසමකට නෙතුලි වමනෙ කරන්න ගත්තේ ඇඳේ ඉඳගෙන ම යි. විමලා එක අතකින් බේසම අල්ලාගෙන අනිත් අතින් නෙතුලිගේ පිට හෙමිහිට පිරිමැද්දා.

“මගෙ දෙයියෝ දැන් බඩේ කිසි දෙයක් නැතිව ඇති. ඔක්කොම පිත වගේ යන්නෙ!”

බේසමේ පිරුණු කහ පාට වමනෙ ගොඩ දැකලා විමලා විස්සෝප වුණා. අඬන්නවත් පණක් නොතිබුණාට, වාන් දමන කඳුළු නවත්තගන්නවත් ඒවා විමලාගෙන් හංගාගන්නවත් නෙතුලිට පුළුවන් වුණේ නැහැ. ඇයට පුදුම අසරණකමක්, පාළුවක් දැනුණා. වරුණට මේ වගේ අසනීපයක් හැදිලා හිටියා නම් තමන් යාළුවොත් එක්ක විනෝද ගමනක් යයි ද කියලා නෙතුලිට හිතුණා.

“කරන්න තියෙන ඔක්කොම කරලා ඔය ගියේ. එයාටත් පොඩි විනෝදයක් එපායැ!” හිතේ කොණක ඉඳන් කව්දෝ දාර්ශනික කථාවක් කියනවා ඇයට ඇහුණා.

“අනේ ඇත්තට ම අපෙ මහත්තයට පිස්සුද මන්දා? යන්න ඕනෑ ගමනක්ද අද ඔය ගියේ? ගමන් යන්න බැරුවා යැ නෝනාව සනීප කරගත්තහම,” විමලා තමන්ටම කොඳුරමින් නෙතුලිට දෙහි යුෂ කෝප්පයක් හදාගෙන ආවා. නෙතුලිට කටට ගන්න වුනේ දෙහි උගුරු දෙකයි. පූර්ව අනතුරු ඇඟවීමකින් තොරව එළියට ආව වමනේ ගොඩෙන් සුදු පාට ඇඳ ඇතිරිලි තෙමිලා ගියේ වස දුර්ගන්ධයක් කාමරයට එක්කරමින්. කොට්ට දෙකක් තියලා නෙතුලිව ඩිවාන් එකේ හාන්සි කළ විමලා ඇඳ ඇතිරිලි මාරු කරන්න පටන් ගත්තා.

ඒ වෙන කොට වරුණ හිටියේ අවිස්සාවෙල්ලේ පුංචි නවාතැනක ස්වාභාවික නාන තටාකයක දිය නාමින්. හැමදාමත් වගේ මෙවරත් සුහද හමුව සංවිධානය කළේ වරුණ. ඒ වගේ වැඩවලට ඔහු කොහොමත් දක්ෂයි. පෙරදා ආර්පිකෝ එකෙන් ගත්ත බෝලයත් හුවමාරු කර කර කට්ටිය සෙල්ලම් කළා.

“කෝ අයියේ නෙතු?” ගයනි ඇහුවෙ වෙනදා ඒ වගෙ ගමන්වලට නෙතුලිත් අනිවාර්යයෙන් සහභාගිවෙන නිසයි.

“එයාට අද ටිකක් සනීප නැහැ නංගී!” වරුණ කිව්වෙ නෙතුලිගෙ අසනීපෙ ගැන කාටවත් කියලා නොතිබුණ නිසයි. කට්ටියට නෙතුලිගෙ අසනීපය ගැන අදහසක් නොතිබුණ නිසා සමහරු විහිළු කළේ නෙතුට ආයෙ කන්න බැරි ලෙඩේද අහමින්.

වරුණ හිනාවුණා මිසක් ඒකට උත්තරයක් දෙන්න ගියේ නෑ.

නැඟිට ගන්න බැරිව ඇඳේ වැතිරිලා හිටි නෙතුලි දිහා බලමින් විමලා හිටියෙ හරිම කණස්සල්ලෙන්. ඔය අතරේ නෙතුලි ගේ ජංගම දුරකථනයට ඇමතුමක් ආවා.

"කව්ද බලන්න විමලා මහත්තයද දන්නෑ!" නෙතුලි කෙඳිරි ගාමින් පැවසුවා.

"ගංගා මැඩම්," විමලා හිමිහිට පැවසුවා. ගංගා කිව්වේ නෙතුලිගේ පාසැලේ අංශ භාර ප්‍රධාන ගුරුතුමියක්.

"මං පස්සෙ කථා කරන්නම් කියන්න විමලා මට දැන් කථා කරන්න අමාරුයි" නෙතුලි කිව්වෙ ඔලුවවත් උස්සන්නේ නැතිව.

විමලා දුරකථනයත් අරන් එළියට ගියේ ගංගා මැඩම්ට විස්තරේ කියන්න. පුළුවන් ඉක්මනට මහත්තයාට කථා කරලා නෙතුගේ විස්තර කියන්නත්, මහත්තයා එනතුරු දියර වර්ග පොවමින්, නෙතුව බලාගන්නටත් විමලාට උපදෙස් ලැබුණා. ගංගා මැඩම් කථාව ඉවර කළේ වරුණට ඇමතුමක් දෙන්නත් පොරොන්දු වෙලා.

විමලාගේ ඇමතුම ආවෙ වරුණ කට්ටියත් එක්ක නාන තටාකයේ ඉඳන් බෝලය හුවමාරු කරන සෙල්ලම කරද්දී. වෙනදාට වෘත්තීය ඇඳුම් පැළඳුම් වලට හිරවුණ යහළු යෙහෙළි කැළත් එක්ක තෙත බරිත නාන ඇඳුමෙන් සැරසිලා බෝල ගහන එකත් අපූරු වැඩක් කියලා වරුණට හිතුණා. ධම්මිකගේ පුතා වරුණගේ කලිසම් සාක්කුවේ තිබූ ජංගමයා ගෙනත් වරුණට පෑවේ "වරුණ අංකල්ට කෝල් එකක්" කියමින්. ඇමතුම විසන්ධි කරන්න හිතුවත් ගෙදර අංකය දැක්කම එහෙම කරන්න වරුණට හිත හදා ගන්න බැරි වුණා.

"අපේ මහත්තයා නෝනට හොඳටෝම වමනෙ යනවා. කිසි දෙයක් පත්තියම් නොවෙන ගානයි." අනිත් අන්තයෙන් විමලාගේ බයාදු හඬ වරුණට ඇහුණා.

"දෙහි ටිකක්, කහට තේ ටිකක් එහෙම හදලා දෙන්න විමලා. ඕක ඔච්චර බය වෙන්න දෙයක් නෑ. බෙහෙත් විදින කොට හුඟාක් අයට ඔහොම වෙනවා." වරුණ විමලාට උපදෙස් දුන්නා.

ජංගමයා පෙනෙන දුරෙන් තියලා වරුණ නැවතත් දියට බැස්සා. කට්ටිය සෙල්ලම් කරන්නේ ඔලිම්පික් ගහනවා කියලා හිතාගෙන වගෙයි කියලා වරුණට හිතුණා. බෝලය අල්ලන්න ගිහින් සමබරතාව ගිලිහුණු ගයනි වරුණගේ අතේ එල්ලුනේ එවිටම වාගේ. වරුණටත් නොදැනීම ඔහුගේ සුරත ගයනිගේ උර මත රැඳවෙද්දී ජංගමයා ආයෙත් කෑ ගහන්න පටන් ගත්තා. පුළුල් පපුතුරේ රැඳි වතුර ගසා බසා දමමින් වරුණ ගොඩට ඇවිත් ජංගමයා කණේ ගහ ගත්තා.

"දොස්තර මහත්තයා වැඩක ද? මං ගංගා මිස් කථා කරන්නේ"

"කොහොමද කියලා බලන්න නෙතුට කථා කළා. අනේ කෙල්ලට පෝන් එකටවත් එන්න බැරි ගාණයි ඩොක්ට. ඉක්මනට ගෙදර ගියොත් හොඳයි නේද? සෙල්ලම් අසනීපයක් නෙමෙයි නේ!" ගංගා මිස් වරුණට උපදෙස් දෙන්න ගත්තේ ඒ ලෙවල් පන්තියේ කොල්ලෙක් ගානට දාලයි.

"නෙතුගෙයි, විමලගෙයි මළ කෝලම් මදිවට රටේ ඉන්න ගෑනුන්ගෙනුත් කථා අහන්නත් වෙලා!" කියලා වරුණ තනිවම හිතුවා. කට්ටියට බොරුවක් කියලා ඇඳුම් මාරු කරන අතරේ ඊලඟ ඇමතුම ආවෙ අයියගේ බිරිඳගෙන්.

"අනේ මල්ලි ඉක්මනට ගෙදර යන්න. අපට නංගිව එක්ක යන්න පුළුවන්. ඒත් ඒක හරි නෑ නේ. මේ වෙලාවෙ ඔයා එයා ළඟ ඉන්න එපැයි?" මංජුලා අක්කා කියවද්දී වරුණට හොඳට ම තරහා ගියා.

වරුණ ගෙදරට ඇමතුමක් දීලා නෙතුලි ව ලෑස්ති කරන්න කියලා විමලාට කිව්වා. සූදානම් වෙලා හිටිය නෙතුලිව වාහනේ දා ගෙන වරුණ කෙලින්ම රෝහලට ගියා. නෙතුලිව බලන විශේෂඥ වෛද්‍යවරියට ඇමතුමක් දීලා උපදෙස් ලබාගත් තරුණ රෙජිස්ට්‍රාර්වරිය ඇයගේ රුධිර සාම්පලයක් ලබාගෙන පරීක්ෂණවලට යැවුවා. ඒ අතරේ දී විජලනය වළක්වන්න සේලයින් දෙන අතරේ වමනය අඩුවෙන්න ප්‍රතිකාරයකුත් ලබා දුන්නා.

හෙදියක් ඇවිල්ලා නෙතුලිට විහිළු කළේ "දොස්තර ගෙදර ඉද්දිදී මැඩම් මොකටද බය වෙන්නේ?" කියමින්.

පිළිතුරු වශයෙන් මලානික හිනාවක් පෑව නෙතුලි දිහා වරුණ බලා හිටියෙ ඇත්තටම තරහෙන්. නෙතුලිට සේලයින් බෝතල් දෙක ම දීලා ඉවර වුනාට පස්සෙ රෝහලෙන් පිටවුණු වරුණ ඇය සමඟ එක වචනයක් වත් කථා කළේ නැහැ.

"ඇයි තරහෙන් වගේ?" නෙතුලි හිමිහිට ඇහුවා.

වරුණ දෙපැත්තට ඔළුව වැනුවා.

"තරහ නැත්නම් ඇයි කථා කරන්නෙ නැත්තේ?" නෙතුලිට අවශ්‍ය වුණේ වරුණගෙන් ඇත්තම දැනගන්න.

"ඔව් මට තරහයි, මට පට්ටම තරහයි!" වරුණ වෙව්ලමින් ගිගිරුවා.

"මම කොච්චර ආසාවෙන් ද ඔය ගමන ගියේ...? මාස කීයක් ප්ලෑන් කළා ද? මටත් ඔයා එක්ක ගේ අස්සට වෙලා ඉන්නද කියන්නේ?" නිතර තරහ නොයන වරුණ කේන්තියෙන් කෑ ගැහුවා.

"ඇයි මා එක්ක තරහ වෙන්නේ? මම ඔයාට එන්න කිව්වෙ නැහැ නේ" නෙතුලි හිමින් කෙඳිරුවා.

"කටින් නොකීවට තේරෙනවා නේ හිතන දේ. රට වටේට ම කෝල් කර කර දුක කියනවා. මිනිස්සු හිතනවා ඇති මම සලකන්නේ නෑ කියලා," වජිර නොනවත්වාම දොස් කිව්වා.

ඔහු වාහනය පදවන තාලයට ඇත්තටම අනතුරක් කර ගනිවිදැයි නෙතුලිට බය හිතුණා.

"ඔයාගෙ තරහ පාලනය කර ගන්න. අනතුරක් වුනොත් අපේ දරුවට කව්රුවත් නැහැ," නෙතුලි කීවාම වරුණ ටිකක් මෙල්ල වුණා.

"ඉස්පිරිතාලෙට ගියා විතරයි කිසිම අමාරුවක් නැහැ. මාව ගෙන්න ගන්න කම් මෙතන මැරෙන්න හැදුවා," වරුණ දිගින් දිගටම චෝදනා කළා.

"දැන් ලෙඩා ඔයා ද? මං ද? මට තියෙන්නේ උණ හෙම්බිරිස්සාව වගේ සාමාන්‍ය ලෙඩක් ද?" නෙතුලි ඇහුවේ ඇස් වල කඳුළු පුරෝගෙන.

වරුණ කිසිම උත්තරයක් දුන්නෙ නැහැ.

"ලෙඩෙකුට රඟපාන්න බැහැ. බොරුවට රෝග ලක්ෂණ මවා පාන්නත් බැහැ. ඔයාලගේ ඔය මහ ලොකු පරීක්ෂණවලට බොරු කරන්නත් බැහැ. දොස්තර කෙනෙක් වුන ඔයාට ඒක නොතේරෙන්න විදිහක් නැහැ නේ?" නෙතුලි ඒ ටික කියලා දැස් පියා ගත්තා.

ඒ මුහුණ දකින්නවත් ඒ හඬ අහන්නවත් ඕනැ නෑ කියලා ඒ වෙලාවෙ නෙතුලිට හිතුණෙ ඇත්තටමයි. වාහනෙන් බැස්ස වරුණ උඩ කාමරයට රිංගා ගත්තාට පස්සෙ කෑමට වත් පහළට බැස්සෙ නැහැ.

නෙතුලිට යහළුවෙකුගේ දාර්ශනික කියමනක් මතක් වුණා.


"සත්‍ය ප්‍රේමය යනු වර්ගයා බෝ කිරීම සඳහා නිර්මාණය වුන ස්වභාව ධර්මයේ මර උගුලකි!" එදා ඔහු තර්ක කරද්දී නෙතුලි ඔහු එක්ක රණ්ඩුවුණා. ඒ අනුව බලන කල නම් වර්ගයා බෝ කිරීමෙන් පසු ප්‍රේමයට පැවත්මක් නෑ නේද කියලා නෙතුලිට හිතුණා. නව කථාවල, චිත්‍රපටිවල දැක්ක රොමාන්තික සුරංගනා කථාවලයි, සැබෑ ජීවිතයේ කටුක යථාර්තයෙයි කොයි තරම් වෙනසක් තියෙනවා ද කියලා ඇයට හිතුණා.

ඒ සිද්ධිය වෙලා දැන් අවුරුද්දකටත් වැඩියි. බෝනික්කි වගේ වරුණගේ කාර් එකේ ඉඳගෙන යනවා වෙනුවට රියදුරු බලපත්‍රයක් ලබාගෙන තමන්ගෙම වාහනේක වැඩට යන්න නෙතුලිට පුළුවන් වුණා. ආපසු වැවුණු කොණ්ඩය කෙටි සරල මෝස්තරයකට කපා දාලා ආයෙමත් ලස්සනට අඳින්න පළඳින්න පටන් ගත්තා. වරුණට එන්න වෙලාව තිබුණත් නැතත් මාර්ගගත ක්‍රම ඔස්සේ වෙලාවක් වෙන්කර ගෙන නියමිත වෙලාවට වෛද්‍යවරු හමුවෙලා උපදෙස් ගත්තා. අවශ්‍ය පරීක්ෂණ කලට වෙලාවට කරගත්තා. පහුගිය සාළිස් වසර පුරාවටම තමන්ට අත හැරුණු සතුටු ළිං නැවතත් හාරන්න පටන් ගත්තා. කිරිල්ලියක් වගේ උඩු ගුවනේ සරන්න බැරි වුණට සුළං රැලි ඇගේ දැවටී දැවටී බයිසිකල් පදින්නත්, මැසින්නක් වගේ පීනන්නත්, රිද්මයකට නටන්නත් නෙතුලි ඉගෙන ගත්තා.

වරුණට ආපහු එන්න ලැබුණේ ප්‍රධාන නිදන කාමරයේ යුගල ඇඳට විතරයි. වරුණ වෙනුවෙන් ම පේවෙලා වෙන් වෙලා හිටිය හිතයි හදවතයි දෙකම හිස් ම හිස් නොවුණේ ආදරය, අවධානය ඇවැසි ගැහැණු, පිරිමි, තරුණ, මහලු, ලොකු, කුඩා ප්‍රාණීන් ඒවායේ අරක් ගෙන හිටි නිසයි. වරුණ ට එතැන ඉඩක් නැහැ කියලා කිව්වොත් ඒක බොරුවක්. ඒත් ඒ වෙන කොට වරුණ, නෙතුලි ගේ හිත පුරා අරක් ගත්ත තවත් එක් ප්‍රාණියෙකු විතරක් වෙලා හිටියා. අමාරු ම කාලේ දරා ගන්න දිරි දුන්න නාඳුනන හුදී ජනයාට පින් දෙමින් ඇය මහරගම අපේක්ෂා රෝහලේ නේවාසික පුංචි පැටවුන්ට සති අන්තයේ පවත්වන චිත්‍ර පන්තියට අවශ්‍ය කළහළමනා ලෑස්ති කළා.


- **ඉන්දිකා තිලකුමාර** [ithilakumara@yahoo.com]

## සිසිල පොත් පුවත්




"සිසිල" ලේඛිකා සශිකා නිරෝෂි මහලියනගේ විසින් රචිත කුළුදුල් නවකතාව "සසර ප්‍රාර්ථනා", නේත්‍රෝ ප්‍රකාශනයකි. මිල රුපියල් 850/-


ග්‍රන්ථය එළි දැක්වීම: සැප්තැම්බර් තුන්වෙනිදා, බෝකුන්දර පරමධම්ම විහාරයේ දී




"සිසිල" ලේඛිකා මාලිනී ගනේවත්ත ගේ දෙවෙනි කෙටිකතා එකතුව "පහන් කණු යට කඳුළු", ගුණසේන සමාගමේ ගුරුළුගෝමී මෘදුකාංගය හරහා කියවිය හැක. මිල: රුපියල් 500/-

# සිසිල ප්‍රහේලිකාව

## මලී දිසානායක ගේ නිර්මාණයකි



samanmalee7@hotmail.com

### හරහට

1. තාවකාලික නවාතැනකි
3. ජලයේ ද වසති
5. සංඛ්‍යාවකි
8. සිත
9. ඓතිහාසික කතාවක චරිතයකි
11. විශේෂ ඉල්ලීමක්
12. කැලෑව
13. මැය ද ස්ත්‍රියකි
15. කවියන් කිවිඳියන් සතු ය
17. ඇඟකි
21. විවාදයක දී පැන නගී
23. සිනහව
24. නැවත මතක් කරති
28. අභය භූමියකි
29. රජවාසල විසූ "රාල" කෙනෙකි
31. ආගමික මූලස්ථානයකි
32. වාද්‍ය භාණ්ඩයකි
33. පොහොයකි

### පහළට

1. බුදුවීමට පෙරුම් පුරන අය
2. නවකතාවකි
3. ලාටු
4. විශාල
5. වාහනයක් නවත්වයි
6. බැටළුවන් ගැන ප්‍රසිද්ධ රටකි
7. ක්‍රීඩා භාණ්ඩයකි
10. එගොඩ වීමට පිහිට වෙයි
14. දිරාපත් වන දෙයකි
16. මෙහි විශේෂ තොරතුරු ඇතුළත් වේ
18. ප්‍රධාන ආහාරයකි
19. ව්‍යවහාරය
20. ලෝහයකි
22. ආවරණයකි
25. මනාලිය කැන්දාගෙන යාම
26. ගොවි ගෙදර එළිය කරයි
27. ඌව පළාතේ ප්‍රධාන නගරය
30. කොඩි

මෙවර ප්‍රහේලිකාවේ විසඳුම ලබන කලාපයේ පළවෙනු ඇත.




නරුමසේකරගේ දිනපොත පෙරළමින් ඔහු ලියා තිබූ "සිංහල යුද්ධ සෙබළාගේ වස්තුව" කියවා හමාර කළ මගේ මුවගට නැඟුණේ මඳ සිනහවකි. මම ඊළඟ පිටුව පෙරලුවෙමි. එහි ලොකු අකුරින් ලියා තිබුණු මාතෘකාව දුටු මට සිහිවූයේ ධර්මසේන හිමියන්ගේ සද්ධර්මරත්නාවලියේ එන තවත් එක් කතාවක මාතෘකාවයි.

# සෞඛ්‍ය ඇමතිවරයාගේ වස්තුව



තමා කාර්යාලයෙන් පිටතට පමිණෙන තෙක් කිසියම් පිරිසක් අමාත්‍ය කාර්යාල ගොඩනැගිල්ල මිදුලේ නොඉවසිල්ලෙන් බලා සිටින බව සුවසේනදාස ඇමතිවරයා ජනේලයෙන් දුටුවේ ය. ඇමතිවරයා සිටියේ ග්‍රාමීය රෝහලක් ඉදිකිරීම සඳහා අනුමැතිය ඉල්ලා සිටීමේ ලිපිගොනු රැසක් කියවමිනි. මේ සද්කාර්යය ඉක්මනින් ඉටුකර දීම සඳහා අනුමැතිය ලබාදීමේ ලිපියට අත්සන් තැබූ ඔහු අදම අනුමත ලිපිය සහ අදාල ලිපිගොනු කැබිනට් මණ්ඩලය වෙත යොමු කිරීමට පියවර ගන්නා ලෙස ස්ථිර ලේකම්වරයාට උපදෙස් දුන්නේ ය. තවමත් උදේ ආහාරය නොගත් නිසා අධික කුසගින්නක් දැණුනත් මිදුලේ තමන් එනතෙක් බලා සිටින පිරිසගේ අවශ්‍යතාව ඉටුකරදීමට අදිටන් කළ ඇමතිවරයා කඩිමුඩියේ පහළට බැස්සේ ය. හදිසියේ පහළට බැසීම නිසා පය ලිස්සා පඩි පෙළන් වැටෙන්ට ගිය ඔහු බිත්තියට අත ගසා යන්තමින් නොවැටී බේරුනේ ය.

මිදුලේ රැස්ව සිටි පිරිස කියා සිටියේ ඇමතිවරයා එනතෙක් විශා ල පිරිසක් ගා ලු මුවදො ර අරගල භූමියේ රැඳී සිටින බව ය. කුමන කරුණක් සඳහා ඔවුන් තමන් බලාපොරොත්තු වෙන් සිටින්නේදැයි විමසිමටවත් නොසිතූ සුවසේනදාස ඇමතිවරයා වහාම පිරිස සමග ගාලු මුවදොර අරගල භූමිය දෙසට ගමන් ඇරඹුවේ ය. කිසියම් හදිසි උවමනාවක් සඳහා ඔවුන් ගාලු මුවදොර රැස්ව ඇතැයි සිතූ ඇමතිවරයා කෙසේ හෝ ඔවුන්ගේ උවමනාව ඉටුකර දෙමියි යන අධිෂ්ඨානයෙන් යුතුව ය පිරිස දෙසට පා නැගුවේ.

ධජ පතාක හා බැනර අතැතිව සිටි පිරිස කලබල ස්වරූපයෙන් යම් යම් දේ හඬනගා පවසන බව දුර සිටම ඇමතිවරයාට පෙනුනේ ය. කිසියම් හදිසි උවමනාවක් සඳහා ඔවුන් ගාලු මුවදොර අරගල භූමියට ළඟා වී ඇතැයි සිතූ ඇමතිවරයාට ඔවුන්ගේ උවමනාව ඉටුකරදීමේ අධිෂ්ඨානය තදින් ම දැනිණ. පිරිස දෙසට ළං වීමේ දී පිරිස ඔවුන්ගේ සෝෂාව නතර කර ඇමතිවරයා වටකරගත්හ.

මොහොතකින් යළිත් මහා රණ හඬක් මෙන් ඔවුහු සෝෂා කරන්ට පටන් ගත්හ.

"අපේ සෞ ඛ්‍ය ඇමතිවරයාට ජය වේවා!"

"දුප්පතුන්ගේ දුක හඳුනන ඔබතුමා සදා වැජඹේවා!"

"සෞඛ්‍ය ඇමතිතුමනි, අප හැමදා ඔබ සමගයි!"

"දිර්ඝායුෂ වේවා ඔබට, හිතාදර ඇමතිතුමනි!"

මෙවන් උදාන වාක්‍ය ලියැවුණු පුවරු ඇමතිවරයා වටකරගත් පිරිසගේ හිස් උඩින් සුළගේ වැනෙමින් තිබිණ. කුමක් සිදුවන්නේදැයි එක්වරම අවබෝධ කර ගැනීමට ඇමතිවරයා සමත් වූයේ නැත.

පිරිස පිටුපසින් කිසියම් දෙයක් පොලොවට බරව වර්ණවත් රෙද්දකින් වසා ආවරණය කර තිබිණ. එය කුමක්දැයි යන කුකුස ඇමතිවරයාගේ සිතේ ඇතිවී මොහොතකින් අතුරුදහන් විය. එකෙනෙහිම උදාන පාඨයක් අතැතිව සිටි හැඩිදැඩි මිනිසෙක් ඉදිරියට පැන ඇමතිවරයාට වැඳ ආචාර කර කටහඬ අවදිකළේ ය.

"දයාබර ඇමතිතුමනි, ඔබතුමා සිදුකළ හා සිදුකරමින් සිටින අති උතුම් සේවයට සුළු වශයෙන් හෝ ප්‍රතිඋපකාර කිරීමට අපට අවසර දෙන්න!"

"ඒ කුමක්ද ධනරත්න?" ඇමතිවරයා විචාළේ ය.

"පසුගිය මාසය ඇතුළත මාරාන්තික රෝගයකින් පෙළෙමින් සිටි ජනයා සුවපත් කිරීමට ඔබතුමන් කළ අමිල සේවය කෙසේ අමතක කළ හැකි ද?"

"ඒ කුමක් ද ධනරත්න?" යි කිසිවක් අවබෝධ කර ගැනීමට අසමත් වූ ඇමතිවරයා යළිත් වරක් විචාළේ ය.

“ඉතා ම ඉහළ ගණයේ එන්නත් ලබාගැනීමට රජයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කළ මුදල ප්‍රමාණවත් නොවීම නිසා ඔබතුමන් ඔබේ එක ම පෞද්ගලික වාහනය විකුණා ලබා ගත් මුදල යොදවා එම උසස්ම ගණයේ එන්නත් මිල දී ගත බව අප දන්නවා.”

“ආ ඒක සුළු දෙයක්!”

“මෙහි දී අපට වැටහී ගියේ, වඩා අඩු වටිනාකමින් යුත් හොඳ වර්ගයේ එන්නත් මගින් ඒ මාරාන්තික රෝගීන් සුවපත් කළ හැකි බව දැන ගෙනත් ඉතා ම විශිෂ්ටගණයේ එන්නත් මිල දී ගැනීමට තම සතු දේපල පවා විකිණීමට තරම් පරාර්ථකාමී වූ ඔබ වැනි ඇමතිවරුන් අපට මහඟු ආදර්ශයක්, එම රෝගීන් හා ඔවුන්ගේ පවුල් ඔබ තුමන්ට ණය ගැතියි!”

“ආ ඒක මගේ රාජකාරිය නේ ධනරත්න, ඒකට එච්චර කලබල වෙන්න එපා!”

“නැත ඇමතිතුමනි, එම අධික මිල ඇති එන්නත් මිල දී ගැනීමට ඔබතුමා සතුව තිබූ එක ම පෞද්ගලික වාහනය ද විකුණා දැමීම නිසා දැන් ඔබතුමාට ගමන් බිමන් යාම ඉතා දුෂ්කර කාර්යයක් බව අපට වැටහී තිබෙනවා. කලකට පෙර රජයෙන් ලබා දුන් නිල වාහනය පවා බාර නොගෙන එම වාහනය වෙනුවට ගිලන් රථයක් ලබාගෙන එම රථය රජයේ ග්‍රාමීය රෝහලකට අනුයුක්ත කළ බවත් අප දන්නවා!”

“ඒ නිසා ඔබතුමන්ගේ ප්‍රවාහන පහසුව ගැන සලකා බලා අප සැවොම මුදල් පරිත්‍යාගයෙන් මිලදී ගත් මෙම පාවිච්චි කළ මෝටර් රථය ඔබතුමන්ට බාර දීමට අවසර දෙන්න!”

“නැත ධනරත්න, මා බස් රථයෙන් ගමන් යන්ට කැමතියි. මොකද මට මහජනයාගේ එදිනෙදා වැඩ කටයුතු ගැනත් ඔවුන්ගේ ඕනෑ එපාකම් ගැනත් දැන ගැනීමට ලැබෙනවා ඔවුන් සමග දිනපතා බස් රථයෙන් ගමන් කිරීම නිසා!”

“නැත නැත, ඇමතිතුමනි, අප හද පතුළෙන් ම ඔබට පරිත්‍යාග කරන මේ මෝටර් රථය බාරගෙන ඔබතුමන්ගේ අමිල සේවාව තව දුරටත් ඉටු කිරීම සඳහා යන රාජකාරි ගමන් බිමන් සඳහා පාවිච්චි කරන ලෙස උදක් ම ඉල්ලා සිටිනවා!”

එකෙනෙහි ම තුන්දෙනෙක් එකතු වී වාහනය වසා තිබූ රෙදිකඩ ඉවත් කළෝ ය. ඒ පැරණි වාහනය දෙස බැලූ ඇමතිවරයා සිතුවේ මේ මහජන පරිත්‍යාගය ප්‍රතික්ෂේප නොකර බාරගෙන, ඒ වාහනය ද විකුණා ලැබෙන මුදල පසල් දනව්වක ඉදිකිරීමට සැලසුම්කර ඇති ග්‍රාමීය රෝහල් අරමුදලට බැර කළ යුතු බව ය. ඒ සිතිවිල්ලෙන් ඇමතිවරයා ගේ සිත පිනා ගියේ ය.

එකෙනෙහිම ජනහඬ යළිත් වරක් වාතය සිසාරා පැතිර ගියේ ය.

“අපේ සෞඛ්‍ය ඇමතිවරයා සදා දිනේවා!”

“තමන්ගේ ශරීර සෞඛ්‍යය ගැන පවා නොතකා මහජන සේවයට කැපවුණු ඔබතුමාට සදා ජය සතුට ලැබේවා!”

“නව එන්නත ලැබී සුවපත් වූ රෝගීන්ගේ උපහාරය ඔබතුමාටයි!”

**- පාලිත ගනේවත්ත** [pganewatta@gmail.com]

# එක් මානවකයකු දුටු ප්‍රේම සිහිනයක්

මිහිරියේ පිය ළඳේ නුඹ
නොදැක ඉවසුම් නෑ
සිරවෙලා මා මේ සිරගේ
එන්න අවසර නෑ
සරනා අහස විහඟුනි
මෙදුක ඉවසනු බෑ
දෙනවා ද ටිකකට ඔය තටු
නොකියා ම නෑ බෑ

සැඟැවේ කඳු ශිඛර
දුහුලැල් වලා සලුවේ
හිඳිනවා වාගෙයි වැතිරී... ඈ
සෝ... සුසුම් සයනේ

ඇරෙනවා ගිරි හිස
ගලනා සිහිල් පවනේ
යනවා ද ඉහිර ලැම සළු
බමනා පංකා සුලගේ

පියබඳේ ඉවසුම් නෑ මට
සනසන්න හොවා ලමැදේ
දුන්නේ ඉරණම ද මේ දුක
යවලා දුරක මේ වගේ
කවදා නිවන්න ද ගිනි දැල්
දිව රෑ දැවෙන මහදේ
මැලැවී යා ද කැකුලක්
බමරුන් සරන අරණේ



**- චන්ද්‍රවංශ ඥානසේකර** [cguoc.gnana@yahoo.co.uk]

මයිම්මතයේ



රසික සූරියආරච්චි

# ලංකාවේ උසස් අධ්‍යාපන ප්‍රශ්ණයට විසඳුම පුද්ගලික විශ්වවිද්‍යාල නොවේ, මෙන්න මේක ය!

පුද්ගලික විශ්වවිද්‍යාලවලට විරුද්ධව සහ පක්ෂව (එදා වගේ ම අදත්) කෙරෙන විවාදයට සම්බන්ධ වෙලා "මගේ අත්දැකීම්" අනුව අද තියෙන ප්‍රශ්ණය ගැන මගේ විශ්ලේෂණය සහ විසඳුමක් ඉදිරිපත් කිරීමයි මගේ අදහස.

මෙතන "මගේ අත්දැකීම්" කියන්නේ රටවල් තුනක විශ්වවිද්‍යාල හයකින් ශිෂ්‍යයෙක් විදියට ලබපු අත්දැකීම් විතරක් නෙමේ, රටවල් දෙකක විශ්වවිද්‍යාල අටක දේශකයෙක් විදියට ලබපු අත්දැකීම් ගොන්නත් ඒකට ඇතුලත්. දේශණාගාරයේත්, කම්පියුටර් ලැබ් එකේත් ශිෂ්‍ය, දේශක දෙපැත්තේ දී ම ලැබුණු මගේ අත්දැකීම් අවුරුදු විසි දෙකකට වඩා වැඩි බවත් කියන්න ඕනෑ.

මෙන්න දැන් මගේ ශත දෙකේ මතය ප්‍රශ්න සහ උත්තර විදියට.

**මොකක්ද මෙතන කේස් එක?**

ලංකාවේ උසස් අධ්‍යාපනයේ ප්‍රශ්ණයක් තියෙනවා. ඒක තමයි උසස් පෙල සමත් වෙන විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගන්න ඕනෑකම තියෙන හැමෝටම විශ්වවිද්‍යාලවල ඉඩ නැති වීම.

**ඒකට හේතුව මොකක්ද?**

හේතුව තමයි විශ්වවිද්‍යාල සඳහා රජයෙන් දෙන ප්‍රතිපාදන උසස් පෙල පාස් හැමෝටම විශ්වවිද්‍යාලවල නොමිලේ උගන්වන පහසුකම් සපයන්න ප්‍රමාණවත් නැති වීම.

**ඇයි ඉතිං ආණ්ඩුව එහෙම නොකරන්නේ? වෙන අපේම ආණ්ඩුවක් ගෙනාවොත් වැඩේ ෂේප් නේද?**

ආණ්ඩුවලට සල්ලිවලින් කරන්න වෙනත් වැඩ ඇති පදං තියෙනවා හලෝ. අනික මුං ගිහින් අරුං ආවත් ඕවායේ කිසිම වෙනසක් වෙන්නේ නෑ.

**ලෝකේ අනිත් රටවල වගේ පෞද්ගලික විශ්වවිද්‍යාල දැම්මම වැඩේ ෂේප් වෙයි නේද?**

ලෝකේ ඔය කියන තරමට පෞද්ගලික ව්‍යාපාර විදියට කරගෙන යන විශ්වවිද්‍යාල සංඛ්‍යාවක් නෑ මං දන්න තරමට නං.

එංගලන්තය, ඕස්ට්‍රේලියාව වගේ පිටරටකට ගිහින් පුද්ගලික විශ්වවිද්‍යාලයක ඉගෙන ගන්න කෙනෙක් ඉන්නව නං හොයල දෙන්න මට නිකං බේතකට වගේ.

ශතවර්ෂ හතක් අටක් පරණ විශ්වවිද්‍යාල තියෙන මුළු බ්‍රිතාන්‍යටම තියෙන්නේ පුද්ගලික විශ්වවිද්‍යාල දෙකයි ම හිතන්නේ. බකින්හැම් සහ බීපීපී. මුළු ඕස්ටේ්‍රලියාවේ ම තියෙන්නේ පුද්ගලික විශ්වවිද්‍යාල දෙකයි. බොන්ඩ් සහ නොට්‍රඩාම්. ඒවා කවුරුත් අහල පුරුදු නම් නෙමේ!

ඕස්ට්‍රේලියාවට, එංගලන්තයට යන ලංකාවේ කොල්ලො කෙල්ලෝ හැමෝම වගේ ඉගෙන ගන්නේ රජයේ විශ්වවිද්‍යාලවලයි! එහෙම නැතුව පුද්ගලික විශ්වවිද්‍යාලයක ඉගෙන ගන්න කෙනෙකු ගැන දන්නවා නම්, මට ඒ විශ්වවිදයාලයේ නම කියන්න කෝ.

මං වැරදි වෙන්න පුළුවනි, නමුත් ඇමරිකා එක්සත් ජනපදය වගේ රටවල්වලත් තියෙන පුද්ගලික විශ්වවිද්‍යාල මහා දානපතින්ගේ අරමුදල්වලින් ඇරඹුණු ඒවා මිසක මේ ටියුෂන් මුදලාලි ලා සල්ලි දාලා පටන් ගත්ත ඒවා නොවෙයි!

සල්ලි කෝටි ගණං ආයෝජනය කරලා, ඒකෙන් වාර්ෂික ප්‍රතිලාභ ගන්න අරමුණෙන් විශ්වවිද්‍යාල අරඹනවාට වඩා වෙන කොච්චර හොඳ බිස්නස් තියෙනවා ද?

පුද්ගලික සමාගම් ලෙස අරඹන විශ්වවිද්‍යාල ලංකාවේ සැබෑ ප්‍රශ්ණයට සැබෑ විසඳුම නොවෙන්නේ අන්න ඒ නිසයි.

**එහෙනං සැබෑ ප්‍රශ්ණයට සැබෑ විසඳුම මොකක්ද?**

ඒකට එන්න කලින් මේක කියන්නම්. ලංකාවේ අපි හුගක් වෙලාවට කරන වැඩක් තමයි ප්‍රශ්ණය වැරදි විදියට තේරුම් අරගෙන වැරදි විසඳුමක් ක්‍රියාත්මක කිරීම.

උදාහරණයක් විදියට ඉංගිරිසි දැනුම අඩු එකට කාලෙකට ඉස්සර දුන්නු විසඳුම ඉංගිරිසි විෂයය ඉගැන්වීම ක්‍රමවත් කරන එක නෙමේ මුළු සබ්බ සකලමනා විෂයයන් ම ඉංගිරිසියෙන් උගන්වන්න පටන් ගත්තු එකයි. ඉංගිරිසි විෂයය උග්නවන්න අවශ්‍ය ප්‍රමාණයට ගුරුවරුන් නැති රටේ, සියළුවම විෂයයන් ඉංගිරිසියෙන් උගන්වන්න අය ඉන්නවද කියල බලන්නෙත් නැතුව තමයි වැඩේ ඇරඹුවේ!

අදත් ඒ කතාබහ එලෙසම තියෙනවා.

ලංකාවේ විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයට අද අවශ්‍ය දැනට වඩා විශාල වශයෙන් මූල්‍ය ප්‍රතිපාදන. ඒකට ආණ්ඩුවේ මීට වඩා සල්ලි නැති නිසා, සැබෑ විසඳුම පෞද්ගලික ව්‍යවසායකත්වය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල නොවෙයි. අවශ්‍ය පෞද්ගලික ධනය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට යොදා ගැනීමයි.

**කා ගාවද ඒ පෞද්ගලික ධනය තියෙන්නේ? කොහොමද ඒවා රජයේ විශ්වවිද්‍යාලවලට යොදාගන්නේ?**

ඒ පෞද්ගලික ධනය තියෙන්නේ විශ්වවිද්‍යාලවලින් නොමිලේ උපාධි අරගෙන දැන් රැකියා කරන අය ළඟයි.

ඒ මුදල් ලබාගන්න නම් විශ්වවිද්‍යාලවල පාඨමාලා සඳහා සිසුන් බඳවා ගන්න ඕනෑ, පාඨමාලාව සඳහා යන වියදමෙන් කොටසක් ඔවුනුත් පසුකාලෙක (ඒ කියන්නේ තමන්ගේ ආදායම යම් මට්ටමකට පත්වුණාට පස්සේ) රජයට ගෙවන පදනම මතයි.

**උදාහරණයකින් පැහැදිලි කළොත්?**

හිතන්න දැන් ක්‍රමය යටතේ ආණ්ඩුවට පුළුවන් වසරකට වෛද්‍ය සිසුන් 1,000 ක් සඳහා ප්‍රතිපාදන සපයන්න විතරයි කියලා. රජයේ මහජන සෞඛ්‍යය ප්‍රතිපත්තිය මත ජනගහණයෙන් සෑම දහ දාහකට ම එක දොස්තර කෙනෙක් ඕනෑය කියලා හිතන්න. ඒ ටාර්ගට් එක තව අවුරුදු පහකින් සම්පූර්ණ කරගන්න නම් වසරකට ගන්න වෛද්‍ය සිසුන් ගාන 1,500 ක් කරන්න ඕනෑ. ඒ කියන්නේ රජයට අවශ්‍යයි දැනට වඩා 50%ක අමතර මුදලක්. මේ මුදල වෛද්‍ය උපාධිය සඳහා බඳවා ගන්න 1,500 දෙනා උපාධිය අරගෙන ජොබ්කරන කාලේ ආපහු ගෙව්වා නම් වැඩේ ෂේප්.

"උසස් අධ්‍යාපන සම්මාදම් ක්‍රමය" කියලා හැඳින්වෙන මේ ආකාරයේ ක්‍රමයක් සාර්ථකව භාවිතාවෙන රජයේ විශ්වවිද්‍යාල පද්ධතියක් ගැන විස්තර මෙතනින් කියවන්න. http://en.wikipedia.org/wiki/HECS#HECS

**මේ ක්‍රමයේ තියෙන හොඳම වාසිය මොකක්ද?**

හොඳම වාසිය තමයි කපා කපා කෑලි කපා දැම්මත්, රට ජාතිය වෙනුවෙන් පණ වුණත් දෙන්න බලාගෙන නිෂ්මිලා, බාලේලා, වෙනුරලා ගිය පාරේ යන්න බලන්න ඉන්න අයට වුණත් මේකට එකඟ වෙන්න පුළුවන්වීම.

ජීවිතේ කැපකරන්න ඉන්න අයට ජොබ් එකක් කරන ගමන් තමන්ට උගන්වන්න වැයවුණු මුදලින් තුනෙන් එකක් විතර ආපහු ගෙවන එක මහ කජ්ජක් ද?

සල්ලි ගෙවල ඉගෙන හරි ගන්න බලන් ඉන්න අයට නං මේකේ කිසි අවුලක් තියෙන්න විදියක් නෑ.

පුද්ගලික විශ්වවිද්‍යාල නිසා මුදලාලිගේ මෝඩ පුතාට සල්ලිවලට උපාධියක් ගන්න පුළුවන් කියලා කෑ ගහන අයගේ සාධාරණ ප්‍රශ්ණයටත් මේකෙන් විසඳුම ලැබෙනවා.

**-රසික සූරියආරච්චි**
[rasika.suriyaarachchi@gmail.com]

ප/ලි:
හැබැයි තව එකක් කියන්න ඕනෑ. එක එක ක්ෂේත්‍රවල උපාධිධාරියෝ රටට අවශ්‍ය ඒ ඒ ප්‍රමාණයක් විතරයි.

හැමෝම දොස්තරලා වුනොත් ඉතිං හැමදාම තමන් ලෙඩ වෙලා තමන්ටම බේත් කරගන්න වෙනවා. හැමෝම විද්‍යා උපාධිධාරියෝ වෙලත් බෑ. අනිත් ක්ෂේත්‍රවලත් එහෙමයි.

රටේ මධ්‍යම සැලසුම්වලින් මේ දේවල් තීරණය කරන්න ඕනෑ.

ඒ නැතිවුනත් රැකියා ක්ෂේත්‍රයේ ඉල්ලුම අනුව එක් එක් පාඨමාලාවලට තියෙන ඉල්ලුම තීරණය වේවි දීර්ඝකාලීනව.

---



අහෝ කවිය
මගේ ආත්මයේ නොපැහැදිලි
ගැඹුරු පතුලේ
ස්පර්ශ කල නොහැකි තැනක
දෙඇසට නොසැඟවී
එනු මැනවි කරලියට.
ඔබ එනතුරු නොඉවසිල්ලෙන්
දෙඇස් අයා සිටින සුහද මිනිසුනට
ආදරය පුදනු මැන!

- **අමිල්කාර් කබ්රාල්** (ගිනි බිසාව් සහ කාබෝ වෙර්ඩේ නිදහස් සටනේ නායක. 1924-1973)

අනුවර්තනය: **විජයසිරි තිලකුමාර**
[wijaytilakumara@icloud.com]



මම ඔබට පෙම් කරමි
කවුද ඔබ , කොහෙද ඔබ,
කොතනද ඔබ
කිසිවක් නොදැන.

සරලව
මම ඔබට පෙම් කරමි
මානයකින් හෝ ගැටලුවකින් තොරව.

මෙලෙසින් ඔබට මම පෙම් කරන්නේ
වෙන අයුරකින් ආදරය කිරීමට
නොදන්නා හෙයිනි.

- **පැබ්ලෝ නෙරූඩා** - 100 Love Sonnet

පරිවර්තනය: **නිලක්ෂි බණ්ඩාර**
[nilakshibandara1988@gmail.com]

Images: Wikipedia

කියවන්න, ගිලෙන්න, කිමිදෙන්න, රස විඳින්න

# ~අතීතකාමය Nostalgia~

ඕනෑම අයෙකුට සම්මාදම් විය හැකි තීරු ලිපියකි

## කතරගම ගමනේ තොරතුරු

**ප්‍රිසිලා ගොඩහේවා**

මේ අනුවේ දශකයේ දී මගේ සැමියා, අර්ජුනගේ පවුලේ අය අතර සිදු වූ සත්‍ය සිදුවීමකි. වසර ගණනාවක් තිස්සේ කළ ආකාරයට එවර ද ඔවුන් කතරගම යෑම සඳහා කෑමෙන් බීමෙන් පවා පේ වී සිට වන්දනාව යන දිනට පෙර දින නින්දට ගියහ. අර්ජුන උදෑසන අවදි වී ඇත්තේ උදෑසන පහට කුලියට ගත් වෑන් රියේ රියදුරු නිවසේ විදුලි සීනුව නාද කළ විට ය. ගෙදර සැවොම සුව නින්දේ ය.

අද එතැන් සිට කතාව ඔහු පැවසූ ආකාරයට...

තාත්තා හැමදාම රෑට සකසන එලාම් එක අද විතරක් වැදුණේ නැත්තේ කොහොමදැයි මට සිතා ගත නොහැකි විය.

"අනේ අංකල් ගෙදර හැමෝටම නින්ද ගිහින් වගේ. ටිකක් මෙතන වාඩිවෙලා ඉන්න. අපි ඉක්මනටම ලෑස්ති වෙලා එන්නම්" යැයි රියදුරුට කියා මම නිවස ඇතුළට දිවගොස් සියළු දෙනාවම අවදි කළෙමි. "අම්මේ, තාත්තේ කතරගම යන්න වෑන් එක ඇවිල්ලා ඉක්මනට නැගිටින්න. සුදු අයියේ, ලොකු අයියේ, ආච්චියේ කතරගම යන්න වෑන් එක ඇවිල්ලා ඉක්මනට නැගිටින්නෝ....!"



ගෙදර කඩි ගුලක් ඇවිස්සුනා සේ විය. සැවොම එහේ මෙහේ දුවමින් කතරගම ගමනට ලෑස්ති වෙති. අම්මාගේ තොරතෝංචියක් නැති බැනුම් මැද අප උඩින් පල්ලෙන් මුහුණ කට සෝදා ගෙන වාහනයට නැග්ගේ උදේ තේ කෝප්පයක් හෝ නොබී ය.

අම්මාගේ බැනීම නම් ඒවන විටත් ඉවර වී නොතිබුණි.

"කොහේද මේ අලි කොල්ලො දෙන්නෙක් තුන් දෙනෙක් ඉන්නවා... එලාම් එක වැදෙනකම් ඉන්නේ නැතුව පොඩ්ඩක් වේලාසන නැගිටින්න එපෑ... මම ඊයේ රෑ දොළහත් පහුවුණා නිදියන්න යන කොට..." අම්මා වෑන් රථයට නැග ගත් මොහොතේ සිට ගෙදර හැමෝටම බනින්නේ ඇයට උදේ හරියට ටොයිලට එකටවත් යාගන්න බැරි උන කේන්තියට ය.

කෙසේ හෝ කලබලේ ම බඩුමුට්ටු වෑන් රථයට පටවාගත් අපි උදේ 5.45 වනවිට කතරගම බලා ගෙදරින් පිටත් වී අතර මගින් අක්කලාව ද නග්ගා ගත්තෙමු.

"ඇයි වෑන් එක එන්න පරක්කු උනේ? අපි බේබිවත් උදේම නැගිට්ටලා ලෑස්ති කරගත්තා..." ඇය වාහනයට නැග්ගේ ද අපට බැන බැන ම ය.

"කොහේද මේ කොල්ලෝ තුන් දෙනෙක් හිටියට වැඩක් තියේ ද? වෑන් එකේ ඩ්‍රයිවර් ඇවිල්ලනේ අපිව ඇහැරුවේ..." අම්මා තවමත් තම කේන්තිය පිටකරන්නේ අයියලාට සහ මට දොස් පවරමිනි.

"උදේට තේවතුර කෝප්පයක්වත් බොන්න බැරිවුණා!" ආච්චි නෝක්කාඩු කියයි. ඇය කතරගම වන්දනාවේ යන්නට අපේ ගෙදර විත් නැවතී සිටින්නේ සුමානයක සිටය.

තාත්තාගේ කිසිම සද්ද බද්දයක් නැත. ඒ කට ඇරියොත් අම්මාගෙන් බැනුම් අහන්න වෙනබව දන්නා බැවිනි. හැමදාම රෑට එලාම් එක තියෙන තාත්තාට අද කොහේ හෝ වැරදී ඇත.

"ඔය ඩ්‍රයිවර්ට කියන්න කොහෙන් හරි ඉස්සරහින් වාහනය නවත්වන්න කියලා... උදේ කෑම කන්න. තේ බි බී ඉන්න වෙලාවක් නැති නිසා මම උණුවතුර බෝතලයට තේ එකකුත් දාගත්තා..." අම්මා කීවාය.

"ඒක හොඳයි එතකොට පාන් පෙත්තක් කාලා මට බෙහෙත් පෙති ටිකත් බොන්න පුලුවන්!" ආච්චි පිළිතුරු දුන්නා ය.

උදේ හතට පමණ අපි වාහනය ගාලු පාරේ මුහුද අයිනේ පොල්වත්තක් ළඟ නතර කළෙමු. කෑලි කැපූ පාන් පෙට්ටිය, සීනි සම්බෝල සහ පරිප්පු භාජනය වෑන් එකේ සීට් උඩ ම තියා අපි බඩ කට පිරෙන්න කෑවෙමු. අසල හෝටලයක ටොයිලට් එකට ගිය අපි නැවත ගමන් ආරම්භ කළේ පැය භාගයකත් වඩා පසුව ය.

අපේ නඩේ ගුරා, ලොකු අයියා, වැඩි සද්ද බද්දයක් නැති කෙනෙකි. ඔහු කතරගම යන අතරමග වාහනය නවත්වන්නට අවසර දෙන්නේ හදිසි අවස්ථාවට ම පමණි. කෑමට නැවැත්තු වාහනය නැවත කතරගමට එනතුරු එක දිගටම නොනවත්වා ධාවනය විය.

* * *

අපි ඒ කාලේ කතරගම ගිය කල රාත්‍රියට නැවතුනේ දුටුගැමුණු විශ්‍රාම ශාලාවේ ය. උදේ හයට විතර කොළඹින් පිටත්ව එන අපේ වාහනය මධ්‍යහ්නයේ කතරගමට ළඟා වූ පසු අප වාහනයෙන් බිමට බසින්නේ අත පයේ හිරි අරිමිනි. නොනවත්වා ආ වාහනයේ එක දිගට වාඩි වී ඒම නිසා ඒ වෙනකොට අපට ගමනත් එපා වෙන්නට ආසන්නව තිබේ.

“දොලහත් පහු වෙලා නේද...? අපි දවල්ට කෑම කාලම කාමර වලට යමු එහෙනම්....” අම්මා කියයි. අපේ ගෙදර වෙලාවට කෑම කන්න ඕනෑ අය නම් ලොකු අයියා, ආච්චි හා අම්මා ය.

“එහෙනම් කෑම කන්න විශ්‍රාම ශාලාවේ කෑම කාමරයට යමු.”

කොළඹින් සල්ලි ගෙවා විශ්‍රාම ශාලාව වේලාසන ලෑස්ති කරගෙන අප පැමිණෙන නිසා, දවල් කෑම වේලාසන ඇනවුම් කරන නිසාත්, අප ආපන ශාලාවට ගිය වහා දහවල් ආහාරය කෑම මේසයට ගෙන එනු ලැබේ.

අපි සියලු දෙනාට එකට වාඩිවීමට හැකි දිග කෑම මේසයක් ආපන ශාලාවේ කොනක ලෑස්ති කර තිබේ. සේවකයින් දෙදෙනෙකු ලොකු වතුර ජෝගු දෙකක් ගෙනැවිත් මේසයෙන් තබති. නමුත් ඒවායින් වතුර බීම අම්මා අපට තහනම් කර ඇත.

“හා, හා..., ඔය වතුර බොන්න එපා... ලොකු පුතේ අපි ගෙදරින් ගෙනාපු වතුර බෝතල් දෙකක් වෑන් එකෙන් ගේන්න අපට කෑම කාලා බොන්න...” අම්මා අපට කට සේදීමටවත් කිවුල් වතුර කටට ගන්නට නොදෙයි.

සේවකයෝ දුම් දමන කැකුලු හාල් බත්, පරිප්පු, මැකරල්, වට්ටක්කා, පොල්සම්බෝල, පපඩම්, තක්කාලි සමග ලූනු සම්බෝල මේසයට ගෙන එති. කෑම ආ වහාම කෑම බෙදාගන්නේ ලොකු අයියායි.

“මට නම් මැකරල් එපා... සීතලයි” ආච්චි කියයි.

“මට වට්ටක්කා එපා...පැනි රසයි” තාත්තා කියයි.

මස් මාලු නැතත් මට නම් එදාට එම කෑම පුදුම රසය. හේතුව තුන්සිය හැටපස් දවසෙම අම්මා උයන බත් වලට වඩා වෙනස් රසක් ඒ කෑමේ ඇති නිසායි. සේවකයින් ලෝභ නැතුව මේසයට කෑම ගෙනෙති. හිතයි බඩයි දෙකම පිරෙන්න කෑම කන අපි ඉන් පසුව යන්නේ අපට නියමිත කාමරවලට ය.

“අපි මැණික් ගගේ නාන්නේ නැද්ද?”

“මේ දවස්වල මැණික් ගඟට කිට්ටු කරන්න බෑ සෙනඟ... අපි කාමරවල බාත්රූම් එකෙන්ම නාගමු!” ලොකු අයියා කියයි. නඩේ ගුරා කියන දේ අපිත් අසන්නෙමු.

“නාලා ටිකක් විවේක ඇරගෙන පූජා වට්ටි හදන්නත් ඕනෙ” තාත්තා කියයි.

දුටුගැමුණු විශ්‍රාම ශාලාවේ කාමරවල එක කාමරයක ඇඳන් දෙකක් හෝ තුනක් ඇත. ඒවාට උඩින් මකුනු දැල් ද එල්ලෙයි. එක ඇඳක දෙන්නා ගානේ නිදා ගත යුතුය.

“ගෑණු කට්ටිය එක කාමරයකට යන්න.”

“අක්කලාට වෙන ම කාමරයක් දෙන්න. බබත් ඉන්න නිසා.”

“කවුද දැන් ඉස්සෙල්ලා ම බාත්රූම් එකට නාන්න යන්නෙ...?”

“ආච්චි යවමු ද...?”

“ආපෝ එහෙම උනොත් අද අපට ඇඟ හෝද ගන්න හම්බ වෙන්නෑ... දේවාලේ පූජාව ඉවර වෙනකල් ම.”

“එහෙනම් අම්මා යන්න.”

“අම්මත් ඊට හපන් මං යන්නම්.”

පෝලිමේ සිට නෑමෙන් පසු අපි ඇඳන්වලට වී විවේක ගනිමු.

“අපි කීයට ද දේවාලයට යන්නේ?” සුදු අයියා අසයි.

“හතර විතර වෙනකොට යමු... හයට දේවාලේ පූජාවට යන්න ඉස්සෙල්ලා කිරි වෙහෙර වඳින්නත් ඕනනේ...” ලොකු අයියා කියයි.

“වෙලාව වැඩිනේ.”

“නෑ... නෑ... ආච්චිව අල්ලගෙන කිරි වෙහෙර වඳින්න යනකොට වේලාව නිකම්ම යනවා.” මම ඒ ගැන හොඳින් දනිමි. හැමදාම කොහේ පන්සල් ගියත්, ආච්චිව අල්ලාගෙන වඳින්න එක්ක යන්න අහුවෙන්නේ මා ය.

හවස වූ පසු ලොකු අයියා ද, තාත්තා ද, මම ද පූජා වට්ටි හදන්නට ගියෙමු. ඒ ලොකු අයියා ඇමතිම රාජකාරියයි. ඔහු කතරගම දෙවියන්ට පූජා වට්ටි හදන්න ඉතා කැමති ය. කොළඹින් ගෙනා පලතුරු සෝදා කපා පූජා වට්ටි සාදාගත් පසු සියල්ලෝ ම සුදු ඇඳුම් ඇඳ, තෙල් මල් රැගෙන කිරි වෙහෙර වඳින්න ගියෙමු.

මැණික් ගඟ අවට ඇති විශාල නිදහස් බිම පසු කර ගොස්, මැණික් ගඟේ පාලම උඩින් කිරි වෙහෙර බලා අපි යන්නේ ඉතා ආසාවෙනි. ගස් කොළන්වලින් වට වූ ඒ සෞම්‍ය පරිසරයේ මැණික් ගඟේ පාලම හරහා යෑමේ දී හිතට පුදුම සැහැල්ලුවක් සහ සතුටක් දැනේ.

නමුත් එම විශාල බිමේ හැමතැන ම එහෙමෙහෙ යමින් ඇවිද අතපාන හිගන ගැහැණුන් හා ළමයින්ගේ කරදරයට නම් මා

කැමතිම නැත. ඔවුහු අපට කරදර කරමින් සල්ලි ඉල්ලති. “තාම වඳින්න යන ගමන් නේ. එන ගමන් සල්ලි දෙන්නම්...”

කතරගම දේවාලය පසු කර අප කෙලින් ම යන්නේ කිරි වෙහෙර වඳින්නට ය. බැතිමතුන්ගෙන් එම පෙදෙස කවදත් පිරී ඇත.

“ආච්චිව අල්ල ගන්න මඟ ඇරෙයි.” කවුරු හෝ ආච්චිව අල්ලාගෙන යා යුතුය. මගේ අතේ එල්ලී, බකල ගසමින්, හෙමින් ඇවිද එන ආච්චි මට පින්දෙයි. “අනේ දරුවෝ උඹට පිං මේ ශුද්ධ භූමියේ මාව ඇවිද්දනවාට!”

ඇය තෙල් දමා මල් පූජා කර කිරි වෙහෙර භූමියේ බිම වාඩි වී බොහෝ වේලා ගාථා කියමින් වඳියි. සැවොම මල් පූජා කර වැඳ, ඇය වැඳ නැගිටින තුරු අවට සිරි නරඹති. දෙවන මළුවට ගොස් පහන් පත්තු කරති.

ඉන් අනතුරුව අප යන්නේ කතරගම දේවාලයට ය.

“අද සෙනසුරාදානේ, ඒකයි මේ හරියට සෙනඟ දේවාලයට පූජාව තියන්න ඇවිත් ඉන්නේ... දේවාලෙට පෝලිම කිලෝමීටර් දෙකක් විතර දිගයි.”

ලොකු අයියා අප සැම වෙනුවෙන් වේලාසන ගොස් පෝලිම අල්ලාගෙන හිදියි. තාත්තා අපේ පූජා වට්ටි ආරක්ෂා කරයි. දේවාලේ වටේම ඉන්නා වඳුරන්, රිලවුන්ගෙන් ඇත්තේ හරිම කරදරයකි. උන් පූජා වට්ටිවලට ඇහැ ගහගෙන ඉන්නෙ ඔවුන්ගෙ බඩ කට පුරවා ගැනීමටය.

පැයක් පමණ පෝලිමේ සිට දේවාලය තුළට යන අප, ඒ තුළ හිරවෙමින්, මිරිකෙමින් කතරගම දෙවියන් වැඳ, සුදුපාට කුඩු නලලේ ගාන, කපුවා ළඟ පෝලිමේ ඉඳ, අතට වත් කරන පැන් බී, ඉතිරිය ඔළුවේ ද ගා ගෙන විනාඩි තුන හතරක් තුළ දී එළියට ආ යුතු යි. ඒ අනිත් බැතිමතුන්ටද ඉඩ සලසා දිය යුතු බැවිනි.

“පූජා වට්ටි ගත්ත ද?” අම්මා ඉක්මණින් අසයි.

“ඔව්... ඔව්... ලොකු අයියගෙ අතේ.”

“එහෙනම් කවුරුත් පූජා වට්ටියේ ඇති පලතුරු මොනවා හරි කන්න,” තාත්තා අපට පලතුරු බෙදා දෙයි.

කතරගම දේවාලය වැද පුදා ගෙන පලතුරු ද කා අප කලූවරේම මැණික් ගඟ උඩින් වැටී ඇති පාර දිගේ කඩමන්ඩියට යන්නේ විශාල බැතිමතුන් අතර හිර වී තෙරපී ගෙනමය.

“මට මාල වළලු ගන්න ඕනෑ.”

“අපි කළු දොදොල් ගමු.”

“අපෝ මේහේ කළු දොදොල් රස හොඳ නෑ. අපි හෙට තිස්සමහාරාමයට යනගමන්, මඟ තියෙන කළු දොදොල් කඩවලින් ගමු.”

කතරගම ටවුමේ ඇති තොරම්බල් කඩවල ඔහේ ඇවිද ඇවිද බඩු ගන්නවාට වඩා අතපත ගාමින් ඇවිදින අප රාත්‍රි අට පමණ වනවිට දුටුගැමුණු විශ්‍රාම ශාලාවට යන්නෙමු.

“දැන් නම් හරි බඩගිනියි අම්මේ...!”

“අදවත් අපි මාළු කමු ද...? දවස් තුනකින් මස්, මාළු කන්න ලැබුනේ නෑ... දේවාලයේ පූජාව ඉවර නිසා අපට දැන් නම් මාළු කන්න පුලුවන්නේ!” තාත්තා කියයි.

ලොකු අයියාට ද සුමානයක් මස්, මාළු නැතුව කෑම කා එපා වී ඇත. ඔහු අප මෙන් නොව අම්මා කියන ලෙසම වැඩ කරනා කෙනෙකි. ඔහුත්, අම්මාත්, ආච්චීත් පමණක් සුමානයක් ම මස්, මාළු නැතුව එළවළු හා බත් පමණක් කෑ අය වෙති.

අයියාත්, මමත්, තාත්තාත් දවාලට වැඩපලෙන් මාළු සමග බත් කෑ බව දන්නේ අප විතරම ය.

**අවසාන කොටස ඔක්තෝබර් කලාපයේ**

**- ප්‍රිසිලා ගොඩහේවා** [pgodahewa@gmail.com]

# ඒ කවිය



එකම එක කවියකුත් නොදන්නා ඒ කාලෙ
කවි දහක් ලියන්නට අරුත් දුන්නේ ඔබයි
වලාකුලු, දේදුනුත් ඒ තරම් ලස්සනයි
කියාලා මට හිතුණෙ ඔබ ආව නිසාමයි

සමුනොදී සමුගත්ත අලු පාට සැඳෑවක
ක්ෂිතිජයේ කොහේදෝ සැඟව ගිය ඒ කවිය
උදම් රළ සතක් මැද පද බිඳුන මගෙ කවිය
සොයාලා දෙනවා ද, දුටුවා ද රැලි අතර?

සසර මග දිනක දී අරගෙනම තව හීන
විශ්වයේ කොහේ හෝ මට පෙනෙන කොදෙව්වක
තරු එළිය මග කියයි පුරුදු සේ ඔබ එන්න
පද අතර ඇති අරුත් මුදු සරින් මුමුනන්න

**- රූපිකා ද සිල්වා** [rupikadesilva0@gmail.com]

# සිසිල කෙටිකතාව

# නර බිල්ල

**සරත් සමරසේකර**

තුනී වැහි වළාකුලක් ලාවට මෙන් අහස වසාගෙන ඇති සෙයකි. වැහි බිරුමක් නම් පෙනෙන තෙක් මානයක නැත. තනි කුරුල්ලෙකු ඉහළ අහසේ පියඹා යන්නේ කම්මැලිකමට මෙනි. ඌට වැස්සත් ගානක් නැතිවා වගේ ය.



අද නිවාඩු දවසේ කුමක් කරම්දෝයි සිතමින් සිටි සිරිතුංග මුළුතැන් ගෙය දෙසට යන්නේ සඳලතාට නැවතත් අර යෝජනාව ගෙන ඒමට ය.

"ලතා, අපි අදවත් බිමාෂගෙ දරුව බලන්න යමු ද?" සිරිතුංග මේ යෝජනාව කරන්නේ හතරවෙනි වතාවට විය යුතුය. "දරුවට දැන් මාස හතක් වෙන්නත් ළඟයි මගෙ හිතේ."

"හොඳ නැහැ නේද එහෙම නොයන එක. අපි දන්න කියන හැමෝම යන්න ඇති මේ වෙනකොට. මට නම් මොකද්ද වගේ!" සිරිතුංග කියාගෙන ගියේය.

මිමුනුන්, ප්‍රතිචාරයක් නැතුවා වගේය.

බිමාෂා කියන්නේ තලතා සහ පියනන්දලාගේ ලොකු දුව ය. ඇය සිරිතුංගලාගේ ලොකු දුව වන හිරුණිකාට වඩා වැඩිමල් ය.

පියනන්ද සහ සිරිතුංග සමීපතම මිත්‍රයෝය. සඳලතා සහ තලතා එකිනෙකා හඳුනා ගන්නේ ඔවුන් සිරිතුංග ගේ සහ පියනන්ද ගේ අඹුවන් වන බැවිනි. විවාහ වීමෙන් පසුව ද පියනන්ද සහ සිරිතුංග පැරණි මිත්‍රත්වයේම දිගුවක් ලෙස ඔවුන් අතර තිබූ ඇයි හොඳයි කම පවත්වා ගෙන යති.

සිරිතුංග සහ පියනන්ද අතර ඇති මිත්‍රකමට ගැලපෙන තරමටම සඳලතා සහ තලතා අතර ඇයි හොඳයි කමක් ඇතැයි සිතිය නොහැකිය.

"මට අර ගෑණි පෙන්නන්න බැහැ. මහ ආඩම්බරකාරී!" මේ බොහෝ විට තලතා සම්බන්ධයෙන් සඳලතා ගේ කටින් පිටවෙන වචන ය. ඒ කතාවේ ඇත්තක් නැත්තේම නැතැයි සිරිතුංගට සිතේ. උපාධිධාරිණියක් වන තලතා ගුරුවරියක ලෙස රැකියාව කරන්නී ය. රැකියාවක් නොකරන සඳලතාට ඇය පිළිබඳව ඇත්තේ ඊර්ෂාවක් නොවේ ද? එය එසේ නොවන්නේ යැයි සිරිතුංගට නොසිතේ.

"ගැහැණුන්ගේ හැටි ඔහොම තමයි". සිරිතුංග තමාටම කියාගත් වාර අනන්ත ය.

සිරිතුංගට පෙනෙන්නේ බිමාෂාට යමක් ලැබෙන අවස්ථාවේදී ම හිරුණිකාට එය නොලැබෙන විට එය මදි පුංචි කමක් ලෙස දැනෙන ලෙඩක් සඳලතාට තිබෙන බව ය.

සඳලතා සම්භන්ධ මේ තත්වය බිමාෂා අරභයා පමණක් විශේෂ වූවක් නොව ඇගේ එනම් සඳලතා ගේ පවුල් කුඩුම්බයට සම්බන්ධ නැති රටේ සෙසු ප්‍රජාව හැර ඇය දන්නා කියන සියළුම පංචස්කන්දයන් කෙරෙහි ද අදාළ වන්නකි.

සඳලතාට ඇත්තේ හීනමානයක් විය හැකි යයි ද සිරිතුංගට සිතේ. වරෙක සඳලතාට හිරුණිකාගේ කේන්දරය බලවාගෙන ග්‍රහ දෝෂ තියෙන්නේ දැයි දැන ගන්නටත් ඒවා නිවාරණය කර ගන්නටත් ඕනෑ වෙයි. නැතිනම් ඇයට සෙත් ශාන්තියක් කරන්නට ඕනෑ වෙයි. එසේත් නැත්නම් වැඩි ආරක්ෂාව පිණිස යන්තරයක් පළඳ වන්නට ඕනෑ වෙයි.

මේ වෙනුවෙන් සිරිතුංගට කරදර කරන්නී, ඇය බොහෝ විට සිරිතුංග සමග රණ්ඩු සරුවල් ඇති කර ගත්තා ය.

සඳලතාගේ මේ හැසිරීම නොවන්නට සිරිතුංගට බිමාෂාගේ දරුවා බලන්නට මීට සෑහෙන කලකට ඉහත දී යා ගන්නට හැකියාව තිබුණි.

බිමාෂා විවාහවූ දින සිට සඳලතාට ඕනෑ වී ඇත්තේ හිරුණිකාට කටයුත්තක් කර දෙන්නට ය. මේ ගැන ඇතිවූ කතා බහ හැම විටම කෙලවර වුනේ දබරයකිනි.

"සිරී, ඔයාට අනුන්ගෙ ළමයි ගැන තියෙන කැක්කුම තමුන්ගෙ ළමය ගැන නැති එකනෙ පුදුමෙ!" ඒ ඇය නිතරම කියන කතාව ය.

"අනේ ලතා, ඔයා මොනවද මේ දොඩවන්නෙ? ඔයා හිතන්නෙ අරය බැන්දහම මෙයත් බඳින්න ඕනෑ කියල ද?

මේ මොන විකාරයක් ද? නියම වෙලාවට ඒව ඒ විදියට සිද්ධ වේවි. අපේ ළමයට ඒවට තව කල් තියෙනව. අනික ඒ ළමය තවම ඉගෙන ගන්නව නෙ. ඔයා ඔය මනස්ගාත හිතේ තියන් හිටියට මට එහෙම පිස්සුවක් නැහැ!" සිරිතුංග කියන්නේ තරහෙනි.

"හොඳට තියෙයි, මං මේව ගැන නොදොඩ හිටියොත්! මං හැමදාම වගේ කියනව මේ ළමයගෙ කේන්දරේ බලවල දෙන්නෙයි කියල. ග්‍රහ දෝෂ යන්න මොකක් හරි ශාන්ති කර්මයක්වත් කරන්න උදව් වෙන්නෙයි කියල. කෝ ඔයා ඒව නිකන්වත් කනකට ගන්නව ද?"

සිරිතුංග, සඳලතා ගේ සිතුම් පැතුම් ගැන එතරම් පුදුම වෙන්නේ නැත. ග්‍රාමීය පරිසරයක ඉපදී එහි ම හැදුනු වැඩුනු සඳලතාට සමාජය ගැන ප්‍රමාණවත් කියවීමක් නැතැයි සිරිතුංගට සිතේ.

බිමාෂාගේ මව වන තලතාට මෙන් තමාට මුණුපුරෙකුගේ හෝ මිණිපිරියකගේ හුරතල් බැලීමට තවමත් නොහැකිවීම ගැන සඳලතා සැබවින්ම දුක් වෙනවා විය හැකි යයි සිරිතුංගට සිතේ. ඒ ගැන නම් සිරිතුංගට ඇත්තේ කනගාටුවකි.

සඳලතාගේ දෝෂ දර්ශනවලට එරෙහිව අදහස් දක්වනවාට වඩා මේ සංවාදයට තිත තැබීම පිණිස නිහඬව සිටීම සුදුසු යයි සිරිතුංග සිතුවේය.

දුරකථනය නාද වෙයි. එය මේ වෙලාවේ සිරිතුංගගේ නිහඬ ප්‍රතිපත්තියට අනියමින් ලැබුණු ආශීර්වාදයක් මෙනි.

වළාකුලින් තොර අහස දැන් පැහැදිළි ය. කෑම සොයා ගිය කුරුල්ලන් ආපසු කූඩු කරා පැමිණිලා ය. අඩ සඳක් මෝදු වන්නට ආසන්න යයි සිරිතුංගට සිතුණි.

"අන්න හෙට ජයතිස්සල මෙහේ එනව ලු. දේවිකා කතා කෙරුවෙ." දුරකථනයට පිළිතුරු දී පැමිණි සඳලතා කීවා ය.

"ෂෝක්නෙ, හෙට නවතින්න බලා ගෙනද එනව කිව්වෙ?"

"මම ඒව අහන්න ගියේ නැහැ. ඔයාට ඕන නම් කතා කරල අහගන්න."

"සඳලතා එහෙම කිව්වෙ අකමැත්තෙන් වෙන්න බැහැ. ජයතිස්සගෙ ගෑණිත් මෙයාටම ගැලපෙන බඩුව නෙ!" සිරිතුංග තමාට ම කියා ගත්තේ ය.

වහාම ක්‍රියාත්මකවූ සිරිතුංග ජයතිස්සට පෙරලා ඇමතුමක් ගනී.

"මචං හෙට නවතින්න බලාගෙන වරෙන්."

"නැතුව නැතුව. මම බඩු ඔක්කොම ගේනව. අපි සෙට් වෙමු. ලතාගෙ අවුලක් නැහැ නෙ?"

"නෑ නෑ. අවුලක් නෑ. දේවිකත් එනව නෙ?"

"ඔව්, ඔව්... මචං අපි උදේ වරුවෙ පියනන්දලගෙ ගෙදර යනව බිමාෂගෙ දරුව බලන්න. ඒ වැඩේ ඉවර කරල තමයි ඔහේ එන්නෙ."

"හරි හරි වරද්දන්නෙ නැතුව එනව නෙ?"

ජයතිස්සලා කොළඹ එන ගමනේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ බිමාෂාගේ දරුවා බැලීම ය. ස්ථිරවම දේවිකා ඒ බව සඳලතාට කියන්නට ඇත. එහෙත් සඳලතා සිරිතුංගට ඒ ගැන නොකීමට වග බලා ගත්තා ය. "ගෑනුන්ගෙ හැටි ඔහොම තමා!" යැයි සිරිතුංගට සිතුණි.

කලකට පසු සිරිතුංගගේ ඉහේ මලක් පිපුනා වගේය.

පහුවදා උදේ සිට ඔහු යමරෙට වැඩය. ඒ කියන්නේ වෙනදාට නොකරන දේ කරයි. "කවුරුහරි එනකොට ගෙවල් හොඳට තියෙන්නට ඕනෑ ය" කියා ගෙවල් අස්පස් කරයි. සුද්ධ බුද්ද කරයි. මේ ඉතින් හවසට සෙට් වෙන්නට ය. සඳලතාට හිනා ය. "අනේ මෙහෙමත් මිනිස්සු!" යැයි ඇය සිතන්නී ය.

සිරිතුංග ගේ ලෝකයේ පියනන්ද සිටින්නේ කොතැනක ද, අඩු වැඩි නැතුව ජයතිස්ස ද සිටින්නේ එතැනම ය. සඳලතා සම්බන්ධයෙන් ගත් කල දේවිකා තලතාට වඩා ඇයට සමීපයයි යන්න සිරිතුංගගේ හැඟීමයි.

කඩපොළට ගොස් අද දින විශේෂයෙන් අවශ්‍ය වන අඩුම කුඩුම රැගෙන එන අතරේ සිරිතුංග කල්පනා කලේ ජයතිස්සලා සමග කතා බහ කරන විට බිමාෂාගේ දරුවා ගැන සඳහනක් ඇති නොවන බවට වග බලා ගැනීම සුදුසු බව ය. එවැනි කතාවක් පැන නැගුන ද හැකි නම් එය මග හැරිය යුතු බව ය.

අලුත ඉපදුණු දරුවෙකු බැලීමට යාම ගෑණු තානයේ වැඩක් නොවන්නට සිරිතුංගට තනිව ම ගොස් මේ දරුවා බලන්නට තිබුණා නොවේ ද? එහෙම වුණා නම් මෙවැනි ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැනේ දැයි සිරිතුංගට සිතුණි.

හැන්දෑව වෙද්දී සිරිතුංග හා ජයතිස්ස සාලයේ කනප්පුවක් දෙපස තැබූ පුටු දෙකක් මත හිඳ ගෙන වීදුරු තොල ගාන්නට වූහ.

සඳලතා මුළුතැන්ගෙයි සිට කට ගැස්ම හදන විට දේවිකා ඒ අසල සිට කතා බහේ යෙදී සිටින්නී ය. අවශ්‍යතාවය සඳහා වරින්වර සිරිතුංග මුළුතැන්ගෙට යන විට දෙදෙනාගේ කතා බහට තිත වැටේ. ඇතැම් විට ඔවුන්ගේ ගෑණු කතා තමාට අදාළ නොවන්නේ යයි ඔවුන් සිතනවා ඇතැයි සිරිතුංගට සිතුණි. බාගදා එය කුට කුමන්ත්‍රණයක පෙර නිමිත්තක් විය හැකි බව ද සිරිතුංග නොදන්නේ නොවේ.

"මචං ඉගුරුගල උඹලට ලඟයි නේද?" ජයතිස්ස සමග අල්ලාප සල්ලාපයේ යෙදෙන අතර තුර සිරිතුංග අසන්නේය.

"ඔව්. ඇයි ඇහුවෙ?"

සිරිතුංග, මඳක් හඬ පහත් කර ජයතිස්ස වෙතට ළං වී මෙසේ කියන්නේය. "අර ඉගුරුගල පැත්තෙ දේවාලයක් තියෙන්නෙ. ලතාට ඕනැ ලු අපේ හිරුණිකා එතෙන්ට එක්කං ගිහින් පේනයක් බලල සෙත් ශාන්තියක් කරල දෙන්න. මචං මේ ගැනිට පිස්සුනෙ. හිරුණිකාගෙ දියුණුවක් නැත්තෙ අපලයක් හින්ද ලු. මගේ උනන්දුවක් නැති ලු ඒවට මුකුත් කරන්න."

"ඒ කිව්වහම මට හිතුනෙ ඕක අපේ දේවිකා ඔලුවට දාපු එකක් වෙන්නත් බැරි නැහැ. ඒකිටත් පිස්සු නෙ. මං දන්නව ඔය දේවාලෙ කපුව කියන එකා. ඌ ලෝක හොරෙක්. කමක් නෑ. අපි වෙලාවක යමු. අපේ ගෙවල් පැත්තෙත් ආව හැකි නෙ."

පසුදා පාන්දර සිරිතුංග, ගේ ඉදිරිපස ඉස්තෝප්පුවේ පඩිය උඩ වාඩිවී උදෑසන අහස දෙස ඇස් යොමාගෙන සිතිවිල්ලේ යෙදී සිටිමින් පෙර දින සිදුවීම් ගැන ආවර්ජනය කරන්නට විය. ඊයේ මෙන් අද දින ඔහුට ගෙවල් අස්පස් කරන්නට හෝ මිදුල් අතුගාන්නට හේතුවක් හෝ උවමනාවක් නැත. සුපුරුදු පරිදි සඳලතා එකී වතාවත්වල නියැලී සිටිනු පෙනේ.

උදෑසන තේ කෝප්පය රැගෙන පැමිණෙන සඳලතා එය සිරිතුංගට දෙන ගමන් මෙසේ කීවා ය.

"සිරි එහෙනම් අපිත් ගිහින් බිමාෂගෙ දරුව බලල එමු. එතකොට ඒකත් ඉවරනෙ!"

හෙන ගෙඩියක් පාත්වුණා සේ එක පාරටම සිරිතුංගගේ කණට වැටුනු මේ වචන හේ විශ්මයට පත් කළේ ය. සිරිතුංගට පෙරලා වචනයක් හෝ කියන්නට ඉඩ නොතබා ඇය ආපසු හැරී ගෙතුළට ගියා ය. ඇය එසේ කලේ හිතාමතා ම යැයි සිරිතුංගට නිකමට මෙන් සිතුණි.

සරල රේඛාවක් සේ විහිදී ගිය දුම් රොටු වලින් සෑදුණු ලස්සන සුදු පාට වළාකුලක් මේ මොහොතේ අහසේ දිස්වන වන අයුරු දැක ගත හැකිය. එය "හඳුනා නොගත් පියාඹන වස්තුවකින්" නිකුත් වූ ධූමයක් විය හැකි යයි සිරිතුංගට සිතුණි.

ඊළඟට එළඹෙන මුල් ම පහසු දිනයේ දී බිමාෂා නමැති ගිරි දුර්ගය සාර්ථකව තරණය කිරීමට සිරිතුංගට හැකි විය. මෙහෙයුම අවසන් කර ආපසු එන ගමනේ දී සඳලතා හඬ අවදි කරමින්...

"කෝ මේ දේවිකා එහෙම කිව්වට එහෙම බවක් පේන්න නැහැනෙ?"

"ඒ කිව්වෙ?" සිරිතුංගට තේරුමක් නැත.

"දේවිකා කිව්වෙ ඒ ළමය අංග විකළ වගේය කියල"

"මොකක්? එතකොට ඔයා ඔය තකහනියෙ ගියේ විකලෙ බලන්න ද? චික් චිතරක්...! තමුසෙල මොන වගේ ගෑණු ද, ඔයි? ලැජ්ජයි...!" සිරිතුංගට යකා නැග්ගේ ය.

"එහෙනං ඕක තමයි එදා තමුසෙල දෙන්න කුස්සියට වෙලා මුනු මුණු ගෑවෙ!"

පසුව එළඹි දින දෙක තුනේ දී සිරිතුංග ඉස්තොප්පුවේ පඩිය උඩ වාඩි වී කල්පනාවේ නිමග්නව සිටිනු දැකිය හැකි විය. වරෙක ඔහු මිදුලේ එහාටත් මෙහාටත් සක්මන් කළේ ය. වරක් දෙවරක් හේ ජයතිස්සට දුර කථනයෙන් ඇමතුවේ ය.

සිරිතුංග ඉගුරුගල යෑමට තීරණය කරලා ය. අවසානයේ ප්‍රමාද වී හෝ සිරිතුංග තමා හා හිරුණිකා ඉගුරුගල දේවාලයට රැගෙන යන්නට එකඟ වීම සඳලතා තුළ ඇති කළේ මහත් සතුටක් හා බලාපොරොත්තුවකි. එසේ වූයේ සිරිතුංග තුළ ද මේවා පිළිබඳ විශ්වාසයක් ඇති නිසා විය නොහැකිදැයි සඳලතා සිතන්නට වූවා ය.

අදාල දිනයේ සිරිතුංගලා ඉගුරුගල දී ජයතිස්ස හමු වෙති. ජයතිස්ස ඔවුන්ගේ සියළු පහසුකම් සපයන්නා ලෙස ක්‍රියා කරන්නේ ය.

"ඕං... රීං... වර... වර ... යක්ෂ දිෂ්ටි, මහා දිෂ්ටි, මහසෝන් දිෂ්ටි..." සුදු වතින් සැරසී රතු සාටකයක් පොරවා ගත් යක්ෂ පෙනුමක් ඇති කපුවා කිසිවෙකුට නොතේරෙන හෑල්ලක් මතුරමින් කන්නලව්වක් කරයි.

"...මේ පස් මල්, පස් විළඳ, පස්ගෝරස, පස්දූප, පස්තෙල්, පස්පහන්, පස්ආලත්ති විලත්ති, පංචෝපහාර පූජාවේ ආනුභාවයෙන් හඬ ගසා වදාරන්නේ, අහස ගුගුරුවාගෙන වර වර, මුහුද දෙබෑ කරගෙන වර වර, පොළොව මිහිකත් දෙදරවා ගෙන වර වර, සක්වළ ගල උපුටාගෙන වර වර, ඉර හඳ උගුළුවා ගෙන වර වර..."

මහත්වූ භක්තියෙන් පිරුණු සිත් ඇත්තී, සඳලතා දොහොත් මුදුණේ තබා ගෙන කපුවා දෙස ඇස් පිය නොහෙලා බලා සිටිනු දකින සිරිතුංගට ඇති වුනේ කණගාටුවකි.

"ස්වාමීනී, මේ මනුස්ස දුවට අනුකම්පා කර ඇයට ඇතිවී තිබෙන අපල උපද්‍රව පෙන්වා දෙන සේක්වා...!"

"ඕං... රීං.. කට්ටු කට්ටු... ඕන්න පෙන්නුම් කරනවා, පෙන්නුම් කරනවා, මේ දැරිවියට විවාහ සම්පත්තිය පෙන්නුම් කරනවා."

සඳලතා ගේ මුහුණ සතුටින් බැබලී ගියේය.

"...ම් ම් ම්, මෙන්න පෙන්නුම් කරනවා දරු ප්‍රසූතියක්, ඔව් ඔව්, විශේෂ අවශතා ඇති දරුවෙක්, විකලාංග දරුවෙක්..."

"මොනවා... අනේ දෙයියනේ, ඉතින් මොකද කරන්නේ...?" සඳලතා වැලපෙන්නට වූවා ය.

යක්ෂ කපුවා නැවත මුමුණන්නට විය. "ඕං... රීං... වර... වර ... යක්ෂ දිෂ්ටි, මහා දිෂ්ටි, මහසෝන් දිෂ්ටි... ම්ම්... බිල්ලක් ඕන කරන බව පෙන්වනවා. ඔව්.... ඔව්... නර බිල්ලක්...නර බිල්ලක් ඕන කරනවා!"

“මොනව නර බිල්ලක්?” සඳලතා, සිරිතුංග හා ජයතිස්ස මාරුවෙන් මාරුවට විශ්මයෙන් එකිනෙකාගේ මුහුණු බලා ගත්හ.

ආපසු එන ගමනේදී සඳලතා දිගින් දිගටම “දැන් අපි මේකට මොකද කරන්නේ” යි මැසිවිලි කියන්නට වූවා ය. ජයතිස්ස නම් කීවේ කපුවාට මොකක් හෝ පැටලිල්ලක් වුණු බවකි.

කීප දිනක් තිස්සේ සඳලතා සිරිතුංගට ඇවිටිලි කරමින් “අනේ සිරී අපි දැන් කොහොමද මේකට මූණ දෙන්නෙ?”යි අසන්නී ය.

“මූණ දෙන්නෙ ද? මූණ දෙන්නෙ ඔයා එදා අර විකළෙ බලන්න ගිය වෙලාවෙ පියනන්දයි තලතයි මූන දුන්න විදියට තමයි.” සිරිතුංග කියාගෙන යන්නේ කෝපයෙනි.

“මොනවද අනේ ඔයා මේ දොඩවන්නෙ? මේකට කරන්න දෙයක් ගැන හිතන්නකො!”

“සඳලතා, ඔයාට තේරෙන්නෙ නැද්ද? මේව ඔක්කොම බොරු මිත්‍යා මත. දැන්වත් ඕක තේරුම් ගන්න බැරිද?”

“අනේ සිරී, අපි අපහු ගිහින් මේක කුකුල් බිල්ලකට වත් අඩු කරගන්න බලමු ද?”

“මොකක්? කුකුල් බිල්ලකට?කුකුල් නෙවෙයි, මං ඕකට ඩෙංගු මදුරුවෙක්වත් බිලි දෙන්නෙ නෑ... දැන්වත් ඔය ඔළුව හදාගෙන ඔය මනෝ විකාර වලින් මිදෙන්න බලනවකො.”

සතියක් දෙකක් ගෙවී ගියේය. එහෙත් තත්වය හොඳ අතට පත් වෙන බවක් පෙනෙන්නට නැත. සඳලතා නිතර නිතර දොඩවන්නත් නොකා නොබී සිටින්නත් පටන් ගත්තා ය.

“ජයේ මේක හරි ඇණයක් උනා නෙ. මේ ගෑණි මැරෙන්න හදනව මේකට මොකක් හරි කරන්නෙයි කියල. මට හිතෙනව අපි නිකං නාගත්ත ය කියල. මොකද්ද මචං දැන් මේකට කරන්නෙ?” අන්තිමේදී ජයතිස්සට මේ ගැන කියන්නට සිරිතුංගට සිදුවිය.

“ඉඳපන්කො, මම දන්නව කරන්න ඕන දේ. අපි ආයෙත් යමු අරූ... අර කපුව හම්බ වෙන්න.”

“ලතත් එක්ක?”

“නෑ, ලතා යන්න ඕන නෑ. දැන් තාක්ෂණය දියුණුයිනෙ. අපි එයාට චලන රූප වාර්තාවක් සපයමු.”

සාකච්ඡා කරගත් පරිදි ඉඩ ලැබුණු පළමු දිනයේම ඔවුන් දෙදෙනා දේවාල භූමියට පැමිණියේ කිසිවෙකුටත් නොදන්වා ය.

අද කෙම්මුර දවසේ වැඩ නැති නිසාදෝ මිනිසුන් කිසිවෙක් පෙනෙන්නට නැත. ජයතිස්ස වහාම ක්‍රියාත්මක විය.

“ඈ යකෝ තෝ කුකුලෙක් බිල්ලට අරගෙන වැඩේ අහවර කරනව කියල නේද එදා මට පොරොන්දු උනේ. නර බිල්ලක් ඉල්ලුවෙ තොට අමු කැවිල ද? අපි ආවෙ අඩුවක් නොකර තෝව ම බිල්ලට අරගෙන වැඩේ කම්මුතු කරන්න!” ජයතිස්ස කපුවාගේ බෙල්ලෙන් අල්ලා ගත්තේය.

“බුදු අම්මෝ... මෙන්න... මිණී මරණෝ...” කපුවා ලතෝනි තියන්නට විය.

සිරිනන්ද පටිගත කිරීම නවතා ජයතිස්සගේ අතින් ඇදගෙන එලියට නොඑන්නට කපුවා කපෝති ය.

ආපසු එන ගමනේ දී ජයතිස්ස සිරිනන්දගේ චලන රූප වාර්තාව පරීක්ෂා කරමින් පැවසුවේ “මේක දැක්කම සඳලතාගෙ ලෙඩේ හොඳ වෙයි!” කියා ය.

ඒ අනුව එදින මහා හපන් කමක් කල සිරිනන්ද ගෙට ගොඩ වෙන්නේ තරමක් උදුම්මාගත් සිතින් යුතුව ය.

අභාග්‍යහක හැටි! සිරිතුංගගේ හපන්කමට සාපේක්ෂව ඊට වඩා දස ගුණයක උද්යෝගයකින් හා විශ්වාසයකින් යුතුව සඳලතා බලා සිටින්නේ තමාගේ ගවේෂණාත්මක සොයාගැනීම සිරිතුංග ඉදිරියේ දිග හැරීමට ය.

“අන්න තලතලත් හිඟුරල යන්න හදනව. පියනන්ද කෝල් කරල ඇහුව හිඟුරල යන පාර දන්නවද කියල? මං නොකිව්වට දේවිකා කිව්ව කතාව ඇත්ත වෙන්න ඕන. අර ළමයට මොකක් හරි ලෙඩක් තියෙනව...” සඳලතා කියාගෙන ගියා ය.

අවිද්‍යාව විසින් බිලිගත් නර බිල්ල සඳලතා...!

ජංගම දුරකථනය මේසය දිහාවට වීසි කල සිරිතුංග දොර වසාගෙන මිදුලට බැස්සේය. ඔහු පිටුපසින් “දඩාස්” හඬ දෝංකාර දුණි.

“මේ පියනන්දලත් දන්නෙ නැහැනෙ ගෑණුන්ගෙ හැටි. අහන කෙහෙල්මලක් මගෙන් අහන්න තිබුණ නෙ. එදා අන්තිමට මුණ ගැහුන වෙලාවෙ හිඟුරල පැත්තෙ මගුල් ගෙදරක යන්න තියෙන බව කිව්වට පාර මගෙන් ඇහුවෙ නැහැ!”

වළාකුලින් තොර අහසේ තවත් තනි කුරුල්ලෙක් පියඹා ගෙන යනු පෙනේ. උගේ ගමනාන්තය කොහේදැයි නිශ්චිත නැත. ඌ ඈතින් ඈතට පියඹා ගොස් තිතක් බවට පත්වී නොපෙනී යනතුරු සිරිතුංග බලා සිටියේය.

**- සරත් සමරසේකර** [sarath.nz@gmail.com]

The intellectual property of the articles published in Sisila magazine remains with the respective writers. Writers are also responsible for the content of the articles published under their names. Please note that articles published in Sisila do not represent the views of the Writers Guild of Sinhalese Cultural Forum of NSW Inc.

# පිලේ පැදුර හේනට අරගෙන එනවා

රචනය: මහගම සේකර
සංගීතය: අමරදේව
ගායනය: අමරදේව

පිලේ පැදුර හේනට අරගෙන
එනවා
එළා පැදුර මැස්සේ එහි
සැතපෙනවා
රටා වියපු අත් දෙක මට
සිහිවෙනවා
හිතේ දුකට එතකොට කවි
කියවෙනවා

ඉර පායා ඉර අවරට ගියා දෝ
සඳ පායා සඳ අවරට ගියා දෝ
හැඬූ කඳුළු මූදට එක්වුණා දෝ
ළමා ළපටි නෑනා කොයි ගියා දෝ

උඹේ කරට මල් මාලා ගොතන්නට
මදු මල් පිපෙනවා හේනේ වැට දිගට
උඹේ කටින් ගී සීපද අහන්නට
තවමත් ගිරව් එනවා පෙර පුරුද්දට

පිටිසර ගමක සිදුවීමක් පදනම් ව ලියවී ඇති පිලේ පැදුර ගීතය සඳහා මහගම සේකර කවියා යොදා ගන්නේ ගැමි වහරයි. මේ ගීතයෙන් ධ්වනිත වන රසය හොඳින් විඳ ගැනීමට නම්, පිල, පැදුර, මැස්ස, හේන වැනි ගැමි වදන්හි අරුත් හා ඒ හා බැඳුණු ජීවන රටාව නිවැරදිව තේරුම් ගැනීම අත්‍යවශ්‍ය වේ.

හේන යනු කැලෑබඳ ගොඩ ගොවිතැන් කරන බිමයි. හේනක සාමාන්‍යයෙන් වගා කෙරන්නේ බඩ ඉරිඟු, මිරිස්, එළවළු සහ අල බතල වර්ග වේ. හේන් ගොවිතැන කෙරෙන්නේ කැලෑබදව පිහිටි නිසා, වල් අලි, වල් ඌරෝ, ගෝනුන්, මුවන් වැනි විශාල වන සතුන් පමණක් නොව හාවුන්, ඉත්තෑවුන් වැනි කුඩා සත්තු ද හේනට රෑ කල පිවිස වගාවේ අස්වැන්න බලහත්කාරයෙන් භුක්ති විඳිමින් ගොවියාගේ යැපුම් මාර්ගයට තදබල හානි සිදු කරති. මෙනිසා, වන සතුන්ගෙන් එලදාව රැක ගැනීම උදෙසා නිදි මරමින් හේන ආරක්ෂා කර ගැනීම ද, වගා කිරීමට අමතරව ගොවියාගේ දුෂ්කර ජීවිතයේ අනිවාර්ය අංගයක් වී ඇත.



හේන් ගොවියා කැලෑවෙන් කපාගත් ලී දඬුවලින් හේනේ පැලක් සාදා, ඉලුක්, පොල් අතු, පිදුරු වැනි ද්‍රව්‍යයකින් වහල සෙවිලි කරයි. පැල ඇතුළේ තාවකාලික පාවිච්චිය සඳහා කාමරයක් ද සාදයි. ඒ කාමරයට ඉදිරිපසින් කණු දෙකක් දෙපස සිටුවා, ඒ මත වහලය පමණක් ඇති, තුන් පැත්තක් විවෘත කොටසක් නිමවයි. එහි කැලෑ ලීදඬුවලින් ම නිදන ඇඳකට සමාන පිලක් නිමවයි. ඒ පිල උඩ පැදුර අතුරන හේන් ගොවියා, ඒ මත හාන්සි වී රෑ කල ගෙවන්නේ තමන් විසින් ම ගොතන ලද සී පද මුළු පළාතට ම ඇසෙන සේ ගායනා කරමිනි. ගොවියාගේ කටහඬට ඇසෙන වන සත්තු හේනෙන් පලා යති. ජන කවි (පැල් කවි) සාහිත්‍යය බිහිවූයේ එලෙසිනි.

පිලේ පැදුර හේනට අරගෙන එනවා
එළා පැදුර මැස්සේ එහි සැතපෙනවා

රෑට නිදන පැදුරත් රැගෙන හේනේ පැළ වෙත එන ගොවියා පැලේ මැස්ස උඩ පැදුරු එළා එහි වැතිරෙන් මොහොතේ ඔහුගේ මතකයට නැගෙන්නේ විසිතුරු රටා දමා පැදුර වියන ලද දෑතයි. පැදුර වියූ ඒ දෑත පිළිබඳ නොයෙක් මතක සටහන් එකින් එක ඔහු සිත මැවේ. ඇතිවෙන බලවත් සංවේගය ඔහු පිට කරන්නේ කවි ගායනයෙනි.

මෙහි “රටා වියපු අත් දෙක” හැඟීම් පිරි, මනහර කාව්‍යමය යෙදුමකි. එසේම එය සංකේතයකි. පැදුර විසිතුරු රටාවෙන් හැඩ වැඩ කළ “අත් දෙක” සංකේතයෙන් රසික සිතට නගන රූ සටහන රූ බර ගැමි ලලනාවකි. ඇය ඔහුගේ නෑනා ය. වියෝ දුකින් පිරි හදවතින්, හුදකලාව, රාත්‍රියේ මේ පැල් කවි ගායනය කරන්නේ හේන් ගොවියෙකු විසිනි. ජන කවි බොහෝ දුරට සාමාන්‍ය ගැමි ජනතාවගේ ම නිර්මාණ වේ. එහෙත් මේ ගීතය ලියා ඇත්තේ ගැමියකු නොවීම අවධානය යොමු කළ යුතු විශේෂ කරුණකි. ජන කවි සම්ප්‍රදාය ඉතා උචිත ලෙස යොදා ගෙන මේ ගීතය රචනා කරන ලද්දේ සාහිත්‍ය අම්බරයේ බැබළෙන තරුවක් වන මහගම සේකර කවියා විසිනි. ගැමි ගොවි සන්තානයක

පහල වන දුක්බර වියෝ දුකේ රාවය රසික හද තුළට ප්‍රබලව, රසවත්ව කියා පෑම සඳහා ඉතාමත් උචිත කාව්‍ය රීතිය ජනකවි සම්ප්‍රදාය යි. එය ශූර ලෙස යොදා ගනිමින් මේ ගීතය රචනා කිරීම මහගම සේකර කවියාගේ අද්විතීය ප්‍රතිභා ශක්තිය කියා පායි.

“ඉර පායා ඉර අවරට ගියා දෝ...”

හිරු හා සඳුගේ උදාව හා බැසයාම ගැන මේ පෙම්වතාට කිසිම හැඟීමක් නැති බව මේ කාව්‍යෝක්ති තුළින් ධ්වනිත වේ. හැඬූ කඳුලු මුහුදට එක්වුණා දෝ යන සංකල්පනාව ද හඟවන්නේ දිගු කාලයක සිට සිය නෑනාට කුමක් වුණා දෝ යි සිතමින් ඔහු තදින් වැළපුණු බවයි.

ගීතයේ දෙවන පාදයේ සිට ගී තනුවේ ප්‍රබල වෙනසක් සිදුකර ඇත. සංගීත රිද්ම රටාවේ දුක, සන්තාපය තීව්‍ර කරන පැහැදිළි වෙනසක් සිදුකර ඇත. ඒ අනුව ගායනය පවා වෙනස් රිද්මයක් ගන්නා බව හැඟෙයි. එම පාදයේ එළිසමය “දෝ” ශබ්දයෙන් අවසාන වේ. එයින් නැගෙන ශබ්ද ධ්වනිය ඔහුගේ දුක්බර අඳෝනාවේ හඬ රසික සවනට යොමු කිරීමට සමත් ය. එය තැනට ඉතාම උචිත සේ යෙදූ උසස් කාව්‍යමය අලංකාරයකි. ගොවියාගේ දුකින් සන්තාපයට පත් වන රසික හදවත අනුකම්පාවෙන් පිරෙයි.

“උඹේ කරට මල් මාලා ගොතන්නට...”

ඔහුගේ දොම්නසින් පිරි දෑස තම හේනේ වටපිටාවට යොමු වේ. වැට දිගට මදු මල් පිපී බැබළෙන අයුරු ඔහු දකී. මදු මල ගැමි ආදරයේ සංකේතයකි. මාල ගොතා පැළඳ ඇය සතුටින් විනෝදයෙන් කළ කී දේ ඔහු සිතින් දකී. ඔහුගේ පාළුව තනිකම එයින් තවත් වැඩිවේ. අද ද වැට දිගේ මදු මල් පිපී වැනෙන නමුත් එයින් පලක් නැතැයි ඔහු වැලපේ. “එදා පුරුද්දට අදත් නුඹේ සීපද රාවය අසන රිසියෙන් ගිරව් රැන් පිටින් පියාඹා විත් අතු අග ලත වෙති. මේවා මගේ ඇසට පෙනෙන විට ඇතිවෙන දුක උහුලා සිටින්නේ කෙලෙසද?” යැයි ඔහු හඬා වැළපෙයි. පාළුවට ගිය පරිසරයේ නිහැඬියාව ඔහුගේ සිත තව තවත් වේදනාවට පත් කරන අයුරු මෙයින් ධ්වනිත වේ.

මේ වියෝ ගීතය රස විඳින විට රසික හදවත අසරණ හේන් ගොවියාගේ ශෝකජනක ඉරණම ගැන බලවත් කම්පනයකට පත් වෙයි. නෑනා මේ අසරණ ගොවියා තනිකර දමා ගියේ ඇයිදැයි දුක් මුසු හැඟීමෙන් රසික අධ්‍යාත්මය කම්පා වේ. හේන් ගොවියා පිළිබඳව දැඩි අනුකම්පාවක් ඇති වෙයි. එසේ වන්නේ මේ ගීතයට පාදකව ඇත්තේ ගැමි ජීවිතයේ අව්‍යාජ අත්දැකීමක් වීම නිසායි. මෙහි දී රසික හදවත විඳින්නේ කරුණා රසයයි.

තමා විඳි සතුට හෝ දුක තමා ම කවියට නගා ගායනා කළ කාව්‍ය විශේෂයකි ජනකවි. ජනකවි, උසස් සාහිත්‍යමය නිර්මාණ ලෙස අගය කෙරෙන්නේ එම නිර්මාණවලට පදනම් වූ අනුභූතිය හෙවත් අත්දැකීමේ ඇති ඒ අව්‍යාජ ගුණය නිසයි. මහගම සේකර කවියා විසින් ලියන ලද “පිලේ පැදුර” ගීතය වියෝ ගීතයක් ලෙස රසික අධ්‍යාත්මය තුළ ප්‍රබල කම්පනයක් ඇති කිරීමට සමත් ය. එසේ වූයේ හේන් ගොවියාගේ දුක්ඛ වේදනාව තමාගේ ම දුකක් කරගෙන, එය හදවතින් විඳ මේ ගීතය නිම වී ඇති බැවිනි.

“පිලේ පැදුර” රසික ආධ්‍යාත්මය කරුණා රසයෙන් කුල්මත් කරන අගනා වියෝ ගීයකි. හේන් ගොවියාගේ වියෝ දුක, තමාගේ වියෝ දුකක් කරගැනීමත්, ග්‍රාමීය ජනශ්‍රැතිය ශූර ලෙස යොදා ගැනීමත් නිසා මේ ගීත රචනය රසවත් නිර්මාණයක් වේ. අමරදේව ගේ තනුව හා සංගීතය ගීතයේ වියෝ දුක තවත් තීව්‍රකරමින් රසික මනසට යොමු කිරීමට සමත් ය. ඔහුගේ ගාම්භීර, සෝබර හඬ හැසිරවීම හේන් ගොවියාගේ දුක් ගින්දරෙන් රසික හදවත් කම්පාකරයි.

ගීත රචනය, තනුව හා සංගීතය සහ සුගායනය යන ත්‍රිත්වයේ අපූරු සම්මිශ්‍රණයෙන් නිම වී ඇති “පිලේ පැදුර” කලාත්මක සුභාවිත ගීතයකි.

- **කරු කහටපිටිය** [karunasena_k@yahoo.com.au]

# හේමමාලා කුමාරිටත් ත්‍රස්තවාදී චෝදනා

කුමරි ඔබ හේමමාලා
මුදා ගන්නට සමිඳු දළදා
හිසේ සඟවා තඹවන් වැල්ලට
සැපත් වුවා නොදැන කිසිවකු

හේමමාලා කුමරි ඔබහට
ගොනුව ඇත දැන් ත්‍රිවිධ චෝදනා

සිරි දළදා හිමියන්...
උදේනි නුවරින් රහසේ ගෙනෙමින් ලක්දිව වෙරළට
සියුමැලි ඔබෙ ගත සැරසූ කෙස් රැලි අතරේ සඟවා
ගුරුවරියක්සේ සාරිය හැට්ටය හැඩකර ගත දවටා
සැරසී නොපැමිණි බලවත් වරදට

සිපිරි ගෙයක අනූ දිනක්
ඔබ රඳවා තබනා බවටත්
සංස්කෘතික පොලිසියේ අධිපති හිමිගෙන්
චොයිස් කට් එකක් යූ ටියුබයේ...



- **රන්ජිත් ද සිල්වා** [ransil04@yahoo.co.nz]




# පාර මැද්දේ කපුටෙක්



ගෙදර යනකොට ඕඩර් කරපු
ශන්කරී චන්ද්‍රන් ගෙ
පොත ඇවිල්ලා තිබුණොත් ශෝක්!
අපේ කතාව හරියට ම
ඉංගිරිසියෙන් කිව්වොත්
සම්මාන පිට සම්මාන.

එන ගමන් වඩ බඩගින්නක් ඇවිත්
ඒ ගින්න නිවන්න
වඩයක් කන්ඩ වූන්ගැබී ගියා.
වූල්වර්ත් එක පිටුපස කුණුබක්කි
අවුස්සන ජ්‍යෝෂ්ඨ පුරවැසියෙක්.
අවුස්සලා අහක දාපු එළවළු
එයාගේ රෙජිෆෝම් පෙට්ටියකට
දාගෙන යනවා.
මං එයා පසුපස ටිකක්
ගිහිල්ලා බැලුවා.
කුතුහලය...

එයා ඒ පෙට්ටිය
එයාගේ කිරි ටොයියා වගේ කාර් එකේ
බූට් එකට දාගත්තා.
ඒ එළවළු හාවන්ට විය හැක.

සමහර ජ්‍යෝෂ්ඨ පුරවැසියන්
කුණුබක්කිවලට අත දදා
ඇලුමිනියම් කෑන් එකතු කරනවා.
එකක් ශත දහයකි.

පහුගිය දාක මරු පිච්චර් එකක් බැලුවා.
කකුල් හතරේ සිංහයාව
කකුල් දෙකෙන් හිටවලා.
ෂෝක් පිච්චර් එක සෝමෙ ගෙ.
ඒ අතරෙ මහවංසෙ හැංගුනු තැන් හොයනව
සුජිත් අක්කරවත්ත
නානා පාෂාණ්ඩවරු ගැනත් කියනවා.
ඔහුගේ "වායාම" පොතේ.

මුරුගාට පලයන් කියලා
සිංදුවෙන් බැන වැදුණු "තුමා" කළ
කතරගං දෙයියෝ ගැන පිච්චර් එකත්
ළඟදී ම.

"විස්වාසා පරමා ඥාති!"
විස්වාස කළ හැකි පුද්ගලයා
ඥාතියා ය.
මිථ්‍යාව විස්වාස කරන තැනැත්තාගේ
ඥාතියා මිථ්‍යාව ය.
තුන් සිංහලය ද ඥාතිහු ය.
තුන් සිංහලයට බඩුම වූයේ
ඥාතීන් විස්වාස කළ නිසා ද?

ඥාතීහූ කෙබර ම කෙලිති,
අපි අසමු සාවධානව.

අලින්ට කන්ඩ දෙන බේත් දෙන රටේ
මිනිසුන්ට කන්න නැත, බේත් නැත.
කමක් නෑ, අලින් හරි බේරෙනව නේ!

අපට අලුත් ඥාතීන් ද වෙත්.
රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත් පත්, ෆේස් බුක්

ඉස්සර වගේ රවුමට ලස්සනට නැතත් එම රස ම ය
මරු වඩේ එක!

යස් ද? නෝ ද? ජනමතය
අනේ මන්දා!

මෙවර වසන්තය කලින්ම ඇවිත්
කලින් ම පිපිලා මල්!
මලුත් රැවටිලා ද?
ඥාතියා පරම උනොත් හොඳය!
මල් පර උනොත්?

මට කපුටා විස්වාස ය.
කාරෙක බ්‍රේක් කරන්න ඕනෑ නැත.
කපුටා ඥාතියෙකි!


**- නිහාල් රූපසිංහ**
[nihal.rupasinghe07@gmail.com]



# ජේස්තරයගෙ කතන්දර

**-විදූෂක**

## හරිම නෝටි හස්බන්ඩෙක්!

පිටරට ගිහින් හිටි මගේ යාලුවෙක් අනූවේ දශකයේ මුල් කාලේ ලංකාවට ආවා පොඩි නිවාඩුවකට. ඉතිං මට ආරාධනාවක් ආවා සති අන්තයේ එහේ එන්න කියලා. කොළඹින් පැය දෙකක් විතර දුර පලාතක් නිසා හවස් වෙලා ගිහින් පහුවදා එන්නයි ප්ලෑන් එක.



මං දවල් කෑමෙන් පස්සේ ගෙදරින් පිටවෙලා, ගෙදර ළඟින් නැග්ග බස් එකෙන් තවත් එකකටත්, ඒකේ පැය දෙකක් විතර ගිහින් තවත් එකකටත් මාරු වුණා. මේ තුන්වෙනි බස් එක තරමක් පොඩි, ආසන විසි හයේ එකක්. මං මේ බස්වලට කැමතිම නෑ. මොකද, ඒවයේ හිටගෙන යන්න වුණොත් ඉතිං බඩු ම තමයි. බෙල්ල කොර වෙනවා.

මේ කාලේ මට සාමාන්‍යයෙන් අර මර්ෆි ගේ නියමය හොඳින් වැඩ කරනවා. ඒ කියන්නේ, මොකක් හරි දෙයකට කෙලවෙන්න තියෙනවා නං අනිවා, ඩෝෆා, කෙලවෙනවා කෙලවෙනවා ම යි. ඉතිං ඒ කිව්වා වගේම සීට් එකක් හම්බ වුනේ ම නෑ. මොනවා කරන්නද? මේ ගමේ පාරක්. බස් තියෙන්නෙත් අඩුවෙන්. අනික දැන් හොඳටම හවස් වෙලා.

ඔන්න ඉතිං අමාරුවෙන් බස් එක ඉස්සරහට ඇදෙනවා. මං බෙල්ල නමාගෙන සීරුවන් ගමනේ. හවස් වෙලා හින්දා දාඩිය දාන්නේත් නැති නිසා ඉතිං වැඩි අවුලක් නං නෑ.

බස් එකේ එක එක වෛයිවාරණ උදවිය. ඉඳගෙන. හිටගෙන. මං අල්ලං හිටිය සීට් එකේ වාඩිවෙලා හිටියේ සීය කෙනෙකුයි, අම්මෙකුයි, පොඩි දුවෙකුයි. දුව අම්මගේ ඔඩොක්කුවේ.

මගේ පිටි පස්සෙන් හිටියා තරමක ඇහැට කණට පේන (ඇත්තටම කොහොමද බොලේ කණට පේන්නේ?) යුවතියක්. අර කාන්තා පත්තරෙක පිටකවරෙට හොඳයි එයා. ඒ කියන්නේ බිත්තියෙ අලවගන්න උනත් හොඳයි.

ඔන්න ටික දුරක් යනකොට මගේ වාසනාව පෑදුණා. අර සීයා බස් එකෙන් බහින්න නැගිට්ටා. මං ඉතිං පස්වනක් ප්‍රීතියෙන් ඔකඳ වෙලා සීට් එකට පැන ගත්තා. තව ටික වෙලාවකින් ඒ සීට් එකේ එහා පැත්තේ හිටිය අම්මයි පොඩි දුවයි දෙන්නත් බස් එකෙන් බැස්සා. අර පත්තරේ කවර් පේජ් කොලිටියේ යුවතිය ඔන්න මා ළඟින් වාඩි වුණා.

ඒත් ඉතිං මට ප්‍රීතියෙන් ප්‍රීතියට ගිහින් වෙනද වගේ කලර්ස් පෙන්නන්න නං වුනේ නෑ මෙදා. මොකද මට බහින්න තිබුනේ ඊළඟ බස් හෝල්ට් එකෙන්. නැවතත් මර්ෆිගේ නියමය.

ඉතිං, එදා රෑ කයිය ගහං ඉඳලා, කාලා බීල, සේරම ඉවර වෙලා මායි යාළුවයි ගියා ඒ ලඟ තිබුණු පොරගේ අයිය ගේ ගෙදරට.

මෙන්න බොලේ එතන ඉන්නවා දැකල පුරුදු ඩයල් එකක්. බැලින්නං, ගමේ තුන්කාලේ බස් එකේ පොඩි දුවෙක් එක්ක ආපු අම්ම තමයි මගේ යාළුවගෙ අයියගේ බිරිඳ!

“ආ, මෙයාද මේ අද එනව කියපු මල්ලිගෙ යාළුවා?” ඒ අක්ක ඇහැව්ව මාව දැක්ක ගමන්ම. “අනේ, මං ආපු බස් එකේ නේ ආවෙ, ටවුමෙ ඉඳල”.

ඉතිං ටිකක් වෙලා කතා කර කර ඉඳල තරමක් හිතවත් වුණාට පස්සෙ අක්ක කියපි මෙන්න මෙහෙම. “ටවුමෙන් බස් එකට නගින කොට මං හිතුවෙ මේ මල්ලි නෝන එක්ක ගමනක් යන කෙනෙක් කියලයි”.

මාව උඩ විසිවුණා. අක්ක මේ මගේ නෝන ය කියල හිතල තියෙන්නේ අර බස් එකේ මට පිටිපස්සෙන් හිටිය සුන්දර යුවතිය ගැනයි.

“ඒත් ඉතිං, මං පුදුම වුණා, මේ මල්ලි සීට් එකක් ඉඩ ආපු ගමන්ම ඒකෙ වාඩි වුණු එක ගැන, තමන්ගෙ නෝනට සීට් එක නොදී. මං ඇත්තටම හිතෙන් බැණ, බැණ ආවෙ, දැං කාලෙ මිනිස්සුන් ගෙ හැටි, තමන්ගෙ නෝනට වත් සලකන්න දන්නෙ නැති උන් ය, කිය කිය!”

කාට කියන්නද බොස් මේ අවනඩු?

මං මේ බඳින්න තියා හිතලවත් නෑ. යාළුවාගේ අක්ක එයාම හිතල මං බැඳල නෝනත් එක්ක ගමණක් යනව කියල, ඊළඟට ඒ වැරදි නිගමනය මත පදනම් වෙලා, මට ම හිතෙන් බැණල නෝනට සීට් එක නොදී යන අරුම පුදුම මහත්තයෙක් කියල.

හ්ම්!

**- විදූෂක**



## ඩී බී කුරුප්පු අනුස්මරණ කෙටිකතා තරගාවලිය
### හතරවන පියවර 2024

**පළමු ත්‍යාගය රුපියල් ලක්ෂයයි**

නිර්මාණ බාරගන්නා අවසාන දිනය 2024 ජූනි 30

### තරග කොන්දේසි

1 සියලුම නිර්මාණ සිංහල භාෂාවෙන් රචිත ඒවා විය යුතුය

2 මෙයට පෙර කිසිදු මාධ්‍යයකින් ප්‍රකාශයට පත් නොවූ ඒවා විය යුතුය

3 එක් තරගකරුවකුට හෝ තරගකාරියකට හෝ ඉදිරිපත්කිරීමට අවසර ඇත්තේ එක් නිර්මාණයක් පමණකි

4 වයස් සීමාවක් නැත

5 නිර්මාණයේ තේමාව හෝ ආකෘතිය හෝ පිළිබඳ ව කිසිදු සීමාවක් නැත

6 සියලුම නිර්මාණ FM Abhaya හෝ සිංහල යුනිකෝඩ් වලින් ටයිප් කර එවිය යුතු වන අතර පොයින්ට් 12 ප්‍රමාණයෙන් ටයිප් කළ පසු A4 ප්‍රමාණයේ පිටු 5 කට වඩා දිගු විය නොයුතුය

6 නිර්මාණයේ කිසිදු තැනක නිර්මාණකරුවාගේ හෝ නිර්මාණකාරියගේ හෝ නම සඳහන් නොකළ යුතු ය

7 සෑම නිර්මාණයක් සමගම පහත දැක්වෙන විස්තර ඇතුළත් ප්‍රකාශයක් එවිය යුතුය

*නිර්මාණයේ මාතෘකාව*
*නම ලිපිනය*
*ඊමේල් ලිපිනය දුරකතන අංකය*
*ජාතික හැඳුනුම්පත් අංකය*
*මෙම නිර්මාණය මගේම නිර්මාණයක් බව සහතික කරමි. තරග කොන්දේසි වලට එකඟ වෙමි.*
*අත්සන දිනය*

8 තරගය සඳහා එවන නිර්මාණ තරගයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කරන තෙක් වෙනත් මාධ්‍යයක පළකිරීමට අවසර නැත

9 තරගය පැවැත්වීම සහ විනිශ්චය පිළිබඳ අවසාන තීරණය සංවිධායක මණ්ඩලය සතු ය

10 සියලුම නිර්මාණ පරිගණක අක්ෂරගතකර ranpanhinda@gmail.com ඊමේල් ලිපිනයට එවිය යුතුය

11 නිර්මාණ බාරගන්නා අවසාන දිනය 2024 ජූනි 30 වන අතර එම දිනයට පසුව ලැබෙන නිර්මාණ තරගයට ඇතුල් කර නොගනු ඇත

### තරග විනිශ්චය

අපක්ෂපාතී විනිසුරු මඬුල්ලක් විසින් ජයග්‍රාහී නිර්මාණ තෝරාගනු ලැබෙයි

ත්‍යාග සහ සහතිකපත්

| | |
|---|---|
| පළමු ත්‍යාගය | රුපියල් 100000 |
| දෙවන ත්‍යාගය | රුපියල් 30000 |
| තෙවන ත්‍යාගය | රුපියල් 20000 |

විනිශ්චය අනුව තේරෙන කෙටිකතා 10 ක් පමණ පොතක් ලෙස මුද්‍රණය කිරීමට කටයුතු යොදා ඇත

### සංවිධායක මණ්ඩලය

ඩීබී කුරුප්පු අනුස්මරණ කෙටිකතා තරගය 2024


සිසිල ගැන ඔබේ අදහස් දැන්වීමට

ඔබේ නිර්මාණ එවීමට

sisila.sangarawa@gmail.com

සිසිල පිටපත් ලබා ගැනීමට

අනුග්‍රාහක දැන්වීම් සඳහා



සිසිල සඟරාවේ පළ වී ඇති ලිපිවල බුද්ධිමය අයිතිය මෙන්ම සහ ඒවායේ අන්තර්ගතතය පිළිබඳ වගකීම ද ඒ ඒ ලේඛකයා සතුවේ. මෙහි පළ වී ඇති ලිපිවලින් සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදයේ අදහස් නිරූපණය නොවෙන බව කරුණාවෙන් සලකන්න.

Unless otherwise stated, all images used in this magazine are artificially created.



ඔස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස් ප්‍රාන්තයේ සංස්ථාපිත සිංහල සංස්කෘතික හමුවේ ලේඛක සංසදය වෙනුවෙන් ග්ලෙන්මෝ පාර්ක්හි පදිංචි රසික හරිශ්චන්ද්‍ර සූරියආරච්චි විසින් සංස්කරණය කර 2023 සැප්තැම්බර් මස පළමුවෙනි දින ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඔස්සේ බෙදා හරින ලදී.

Edited and distributed by Rasika H. Suriyaarachchi of Gelnmore Park, New South Wales, Australia, on behalf of the Writers Guild of the Sinhalese Cultural Forum of NSW Inc on 1 September 2023.